ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



අගරදගුරු පදවියේ කලාපීයකරණය යටතේ පත් කළ නව පූජක පත්වීම් මැයි අග සිට ක්‍රියාත්මක වන වගයි.

**අගරදගුරු වසමේ නව පූජක පත්වීම්** 2 පිටුව



**දේව කැඳවීම සහ දිව්‍ය සත්ප්‍රසාදය**

ලෝක දේව කැඳවීම් යැදුම් දිනය නිමිත්තෙන් පළවන විශේෂාංගයකි. 8 පිටුව



මැයි සැමරුම ආධ්‍යාත්මිකව බලා පළ කැරෙන ලිපියකි.

**අප සැමගේ සුරැකි පියා වූ කම්කරු ශු. ජුසේ තුමා** 12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07



“බැටළුවන්ට දොරටුව මමය.”
උත්ථාන සමයේ සිව්වන ඉරුදින

ක්‍රි.ව. 2012 ක් වූ අප්‍රේල් 29 ඉරිදා 146 වෙළුම 46 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## නිවැරදි කිරීමක්

ක්‍රි.ව. 2012 ක් වූ මාර්තු මස 18 ඉරිදා “ඥානාර්ථ ප්‍රදීපය” පුවත්පතේ ප්‍රධාන ශීර්ෂ පාඨය යටතේ පළ වූ “කටුනායක ගුවන් තොටේ නව සංවර්ධන සැලැස්මට කිඹුලාපිටිය මීසමේ ඉඩම් පවරා ගන්නේ නැහැ” යටතේ විස්තර කර තිබූ “මත්තල නව ගුවන්තොට විවෘත කිරීමෙන් පසු කටුනායක ගුවන් තොටුපල සංවර්ධනය කටයුතු සඳහා ටික කාලයක් වසා තැබෙන බවට” ගුවන් තොටුපල බලධාරීන් ප්‍රකාශයක් නොකළ හෙයින් එම ප්‍රකාශය පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බව ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපති ප්‍රසන්න ජේ. වික්‍රමසූරිය මහතා පවසයි. ඒ අනුව මත්තල නව ගුවන් තොටුපල විවෘත කිරීමෙන් පසුව වුවද, “සංවර්ධන කටයුතු සඳහා කටුනායක ගුවන් තොටුපල කිසිදු අයුරකින් වසා නොතබන බවත්, ගුවන් තොටුපල ප්‍රධාන පාලන කටයුතුවලට කිසිදු බාධාවක් නොවන පරිදි ක්‍රියාත්මක කරගෙන යන බවත්” යන්න නිවැරදි විය යුතුයි.

## වෙසගේ ආමිස පූජාවට ගරු කරමු

මේ වෙසක් සමයේ ආමිස පූජා වටා ගෙතී ඇති දන්සැල්, වෙසක් සැරසිලි හා පහන් කූඩු අරබයා කතෝලික ජනතාව කිසිසේත්ම අගෞරව වන අයුරින් ඒවාට සම්බන්ධ නොවිය යුතු බව සමයාන්තර කොමිසමේ සාමාජිකයෝ අවධාරණය කරති.

## රදගුරු අභිෂේකය රූපවාහිනියේ

කොළඹ සහයක රදගුරු අභිෂේක උලෙළේ විශේෂ අවස්ථා අප්‍රේල් මස 28 වන සෙනසුරාදා උදේ 11.30 ට ජාතික රූපවාහිනියෙන් විකාශය වන බව කතෝලික වැඩසටහන් සම්පාදක රන්ජුල සේනාධීර මහතා දන්වා සිටී.

## ලබන සතියේ සිට “ප්‍රදීප” මිල ඉහළට

මුද්‍රණ වියදම්, කඩදාසි මිල, ප්‍රවාහන වියදම් සහ තැපැල් ගාස්තු ඉහළ යෑම නිසා ලබන සතියේ පටන් “ඥානාර්ථ ප්‍රදීපය” පුවත්පතේ මිල සංශෝධනයක් සිදුවේ. ඒ අනුව ලබන සතියේ සිට කලාපයක් රු. 25 ක් වන බව සලකන්න.

(✍ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා )

## සමයාන්තර සංවාදය තුළින් සාධාරණත්වය හා සාමය පිළිබඳ ඉගැන්වීමේ පණිවුඩය බෙදා ගනිමු

**තෙමඟුල අළලා නිකුත් කෙරුණු වතිකාන පණිවුඩය**

**හිතවත් බෞද්ධ සහෘදයෙනි,**

සමයාන්තර සංවාදය පිළිබඳ ශුද්ධාසනීය සංගමය වෙනුවෙන් මෙම වසරේ වෙසක් උත්සවය සඳහා මාගේ හෘදයාංගම සුබ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. මෙම වාර්ෂික තෙමඟුල මඟින් මුළු ලොව පුරා සිටින සැමට සතුට හා සිත් ශාන්තිය ලැබේවා යැයි මම ප්‍රාර්ථනා කරමි.

විවිධ විශ්වාසයන් හා ආගමික පසුබිම්වලට උරුමකම් කියන ලොව පුරා සිටින දරුවන් එකම පන්ති කාමරයක් තුළ තම ආගම ධර්මය මෙන්ම අන්‍යාගම් පිළිබඳව ද අධ්‍යයනය කරති. මෙම විවිධත්වය තුළින් පැන නඟින අභියෝගය හා ගැඹුරු අධ්‍යයනයන් බාල පරපුරට ලබා දිය යුත්තේ අන්‍යාගම් වලට ගරු කිරීමටත්, ඔවුන්ගේ ඇදහිලි ක්‍රම පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමටත් ය. තවද දැනුමෙන් පෝෂණය වී වගකීමෙන් යුත් මනුෂ්‍යයන් වී අන්‍යාගමිකයන් හා අත්වැල් බැඳ ගැනීමට සූදානම් විය යුත්තේ ගැටුම් නිරාකරණය කර ගැනීමටත් මිත්‍රත්වය සාධාරණත්වය හා අව්‍යාජ මානව සංවර්ධනය ගොඩනැංවීම උදෙසාත් ය.

විඥාන හිතේෂී සහ සමාජ ගෝචර වීම සඳහා නිවැරදි අධ්‍යාපනය රුකුලක් වන බව සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් දරණ මතයට අපිදු එකඟ වෙමු. අධ්‍යාපනය යථාර්ථවාදී වන විට සංවාදයට, අන්තර් සම්බන්ධතාවයන්ට හා අන්‍යයන්ට ඇහුම්කන් දීමට අවස්ථාව එළඹේ. එවැනි වාතාවරණයක් තුළ බාල පරපුර තම අනන්‍යතාවය රැක ගැනීම තුළින් හා තම දක්ෂතා හා හැකියාවන් සමාජයට ඵලදායී ලෙස යෙදවීම තුළින් තමන් ඇගයීමකට ලක්වන බව අත් දකිති. තවද අන්‍යාගමික සොයුරු සොයුරියන් හා සහජීවනයෙන් ජීවත් වීමට ද ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාස අගය කිරීමට ද ඔවුහු ඉගෙන ගනිති. මෙය එසේ සිදුවන විට අනාගත බලාපොරොත්තුවක් ඇති කරමින් සාධාරණත්වයෙන් හා සහෝදරත්වයෙන් පිරුණු සමාජයක් ගොඩනංවනු වස් සහෝදර බැඳීමෙන් හා සානුකම්පිත බවින් හෙබි ජනතාවක් වීම පිළිබඳ සතුටක් දැනෙනු ඇත (ලෝක සාම දින පණිවුඩය 2012 ජනවාරි මස පළමු වන දා).

බොදුනුවන් ලෙස ඔබ ප්‍රගුණ කර ඇති ඉතා අග්‍රගන්‍ය පැවතුම් වන මෛත්‍රීය හා පරිත්‍යාගශීලිත්වය තුළින් අන් අයට හිංසාවක් නොවන පරිදි ජීවත් වීමට ඔබ ඔබගේ බාල පරපුරට පෙන්වා දී ඇත. එය සැබෑ සමාජ ප්‍රතිචාරයක් ගොඩනැංවීමට ඔබ ලබා දී ඇති වටිනා තිළිණයකි. බාල පරපුර දැනුමෙන් පෝෂණය කිරීම හා වගකීම් බෙදා ගනිමින් අන් අය හා සමගියෙන් ජීවත් වීමට සැලැස්වීම පිළිබඳ ආගමික දායකත්වය හුවා දක්වන පැහැදිලි අවස්ථාවක් ලෙස එය අපි දනිමු.

තරුණ පරපුර ඕනෑම සමාජයකට සම්පතක් වන බව පිළිගත් කරුණකි. ඔවුන්ගේ අසමසම දක්ෂතා තුළින් ජීවිතය හා මරණය, සාධාරණත්වය හා සාමය, වේදනාවේ අර්ථය හා බලාපොරොත්තුවට හේතූන් මූලික ප්‍රශ්න වලට විසඳුම් සෙවීමට අප ධෛර්යමත් කරයි. මෙලෙස සත්‍යය සොයා අප සැම යන වන්දනා ගමනේ ප්‍රගතියට පා තැබීමට ඔවුන් අපට උපකාරී වෙයි. අනාගතයේ නිර්මාණකරුවන් ලෙස ඔවුන්ගේ ජවය තුළ අප වෙන්කරන සියලුම බාධක විනාශ කිරීමට ඔවුහු අපට බල කරති. ඔවුන්ගේ විචාර තුළින් ආගම් හා සංස්කෘතීන් අතර ඔවුහු සංවාද ගොඩනඟති.

මිත්‍රවරුනි, අපගේ ආදර්ශය හා ඉගැන්වීම් තුළින් බාල පරපුර සාමයේ හා සාධාරණත්වයේ අවියක් කිරීමට අපට හැකි වෙතැයි එකම හදින් යුතුව අප සැම ප්‍රාර්ථනා කරමු. වර්තමාන හා අනාගත පරපුර සාමකාමී කිරීමට හා සාමය ඇති කරන්නන් කිරීමට අපට ඇති පොදු වගකීම් එක ලෙස බෙදාගනිමු. සුබ වෙසක් මංගල්‍යයක් වේවා!

**අති උතුම් ජාන් - ලුවිස් කාදිනල් තවුරාන් හිමි**
**සභාපති**

**අති උතුම් පියර් ලුවිජි චෙලාතා අගරදගුරුහිමි**
**ලේකම්**

# ඔබ ලබාගන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාව මිස, ඔබගේම දූත සේවාව නොවේ

## කාදිනල් හිමිපාණන්ගෙන් ප්‍රබල සිහිකැඳවීමක්

සේයා සහ සටහන - ටී. සුනිල් ප්‍රනාන්දු , රොෂාන් ප්‍රදීප් විසිනි



**“ඔබ මා තෝරා ගත්තේ නැත. මම ඔබ තෝරා පත් කළෙමි” නමැති ජේසුස් වහන්සේගේ වදන් පූජාප්‍රසාදිතුමකු ලෙස ඔබ උන්වහන්සේ සමඟ සමීප අනන්‍යතාවය ස්ථිර කරයි. ඔබට අයිති වැදගත්ම කාර්යභාරය වන්නේ දිනපතාම, නිතිපතාම ජේසුස් වහන්සේ තුළ වැඩීමයි. ඔබව වර්ධනය කිරීමට උන්වහන්සේට ඉඩ සලසා දීමයි. ශ්‍රේෂ්ඨ දේ කිරීම හෝ ප්‍රාතිහාර්ය බඳු දේ සිදුකිරීම ස්වාමීන් වහන්සේට අවශ්‍ය වන්නේ නැත. ලෞකික ඵලදායී බව නොව, දෙවිඳුන් තුළ ඵලදායී බව ඔබට ලැබෙන්නේ උන්වහන්සේ සමඟ ඒකාබද්ධ වී ඇති ප්‍රමාණයට ය.” කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එම අදහස් දැක්වූයේ අප්‍රේල් 21 සෙනසුරාදා කොළඹ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී පැවති අගරදගුරු පදවියට අලුතින් එක්වූ නවක පූජක පුතුන් නව දෙනකුට පූජකවර දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ ගාම්භීර මෙහෙයේ ප්‍රධාන දෙසුම කරමිනි.**

15 පිටුවට ▶

# ධීවරයන් සෝමාලියානු කොල්ලකරුවන්ගෙන් ගැළවුණේ දේව හස්තයේ මහිමයෙන්

## ඥාතිහු යාච්ඤාවේ බලය අත්දකිති

පුරා මාස ගණනාවක් තිස්සේ සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ අත්අඩංගුවේ පසුවෙමින් ඉල්ලා සිටි කප්පම් මුදල් නොලැබෙන තත්ත්වය හමුවේ කෲර වධ වේදනා හා මරණයේ එළිපත්ත මත වැතිර සිටි ශ්‍රී ලාංකික ධීවරයන් නොසිතූ විරූ ලෙස මුදා ගත්තේ දේව හස්තයේ බල මහිමයෙන් යැයි ඔවුනගේ පවුල්වල ඥාතිහු විශ්වාස කරති.

ඔවුන් අත්අඩංගුවට පත්වූ බව දැනගත් මොහොතේ පටන් මෙන්ම කෝටි ගණනාවක කප්පම් මුදල් ඉල්ලා සිටි තැන පටන් නොකඩවා යාච්ඤා කරමින් දෙවියන් වහන්සේගේ හස්තයේ අනුහසින් ඔවුන් මුදා දෙන්නැයි කඳුළු වගුරවමින් දිවා රෑ මොරදෙමින් තමන් යාච්ඤා කළ අයුරු ඔවුහු සිහිකරති. තමනට සිහිනයකින්වත් සිතිය නොහැකි කප්පම් මුදලක් ඉල්ලා සිටි අවස්ථාවේ පටන් මේ යාච්ඤා වඩ වඩාත් දැඩි විශ්වාසයෙන් ඔප්පු කළ බවත් ස්වාමීන් වහන්සේ ස්වකීය බලගතු හස්තයේ බල මහිමයෙන් ඔවුන් මුදා ගැනීමට ස්පාඤ්ඤ නාවික හමුදාව මෙහෙයවූ බව සිය විශ්වාසය බවත් ඔවුහු කියති.

**“මාගේ බැටළුවන් උදෙසා දිවි පුදන යහපත් එඬේරා මම වෙමි”** (ජුවාම් 10:11-18)

පදවියෙන් පදවියට

# කොළඹ අගරදගුරු වසමේ නව පූජක පත්වීම්

## කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් 2012 අප්‍රේල් 21 දින පහත දැක්වෙන පත්වීම් සිදුකර ඇති අතර 2012 මැයි 31 දින සිට ක්‍රියාත්මකවේ

### නවක පූජකතුමන් (සහයක)

ගරු එස්. ජී. කේ. ඩී. දුලීප් කමල් ප්‍රියශාන්ත පියතුමා - කලමුල්ල, ගරු එස්. කසුන් ඉෂාර ප්‍රනාන්දු පියතුමා - රාවතාවත්ත, ගරු ගිහාන් ෂෙනෝ ලක්ෂාන් සිල්වා පියතුමා - කෝට්ටේ, ගරු දිනේෂ් ප්‍රශාන් අප්පුහාමි පියතුමා - වැලිවේරිය, ගරු දිනුෂ් ගයාන් වින්ස්ටන් පියතුමා - දලුගම, ගරු ඇන්ටන් සුධාරක වීරසිංහ පියතුමා - තේවත්ත, ගරු අසිත නිරංජන ප්‍රනාන්දු පියතුමා - නිට්ටඹුව, ගරු සමිඳු පැතුම් ජනිත ප්‍රනාන්දු පියතුමා - මහවීදිය

### සහයක පියතුමන්

ගරු ගයාන් ප්‍රසාන්ත පෙරේරා පියතුමා - පල්ලන්සේන, ගරු ප්‍රදීප් චමින්ද පෙරේරා පියතුමා - තලාහේන (අර්ධ මීසම), ගරු ප්‍රසන්න ක්‍රිස්ටෝපර් පෙරේරා පියතුමා - වැල්ලවීදිය, ගරු සී. ඩිල්රන් පීරිස් පියතුමා - වැල්ලවීදිය, ගරු කේ. ඩී. ජූඩ් සුරේෂ් රංගන පියතුමා - කට්ටුව, ගරු වසන්ත ප්‍රසන්න පියතුමා - සීදුව, ගරු සුමිත් කුමාර් ප්‍රනාන්දු පියතුමා - තෝප්පුව, ගරු ටෙරන්ස් ප්‍රසංග විරාජ් පියතුමා - දෙහියාගාත, ගරු සුරංග නිරෝශන් ෆොන්සේකා පියතුමා - හල්පේ, ගරු රසික ලෝරන්ස් ද සිල්වා පියතුමා - පමුණුගම, ගරු ප්‍රියනාල් අසන්ත ප්‍රනාන්දු පියතුමා - කණුවන, ගරු එච්. ජූඩ් නුවන් බුද්ධික පියතුමා - හපුගොඩ, ගරු මැල්කම් එඩ්වර්ඩ් කන්දප්පා පියතුමා - නායකකන්ද, ගරු එච්. ඩී. නලින් සුරාජ් පියතුමා - රාගම, ගරු දේශාන් ලසන්ත පෙරේරා පියතුමා - රාගම, ගරු නිලන්ත එදිරිවික්‍රම පියතුමා - කැළණිය, ගරු සිසිර සමරකෝන් පියතුමා - රාගම, ගරු නිහාල් රණතුංග පියතුමා - කිරිමැටියාගාර, ගරු ඉඳුනිල් සම්පත් පෙරේරා පියතුමා - කොටහේන, ගරු ප්‍රදීප් මානවඩු පියතුමා - දෙහිවල, ගරු රුවන්ත කුමාර ප්‍රනාන්දු පියතුමා - පන්නිපිටිය, ගරු දිනේශ් කීර්තිසිංහ පියතුමා - තලංගම, ගරු ඔගස්ටින් ප්‍රනාන්දුපුල්ලේ පියතුමා - අවිස්සාවේල්ල, ගරු ප්‍රසාද් ඉන්දික පෙරේරා පියතුමා - වැලිවිට, ගරු ක්‍රිෂාන් ජයශාන්ත ප්‍රනාන්දු පියතුමා - වත්තල,

### මීසම් සේවක පියතුමන්

ගරු එම්. විල්ප්‍රඩ් පින්තු පියතුමා - පෙරියමුල්ල, ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමා - සා. පීතර (මීගමුව), ගරු සරත් නිමල් අබේසිරිවර්ධන පියතුමා - පිටිපන, ගරු ටෙරන්ස් බෝදියාබඳුගේ පියතුමා - වැල්ලවීදිය - මීගමුව, ගරු කේ. ඩී. ඒ. සුජීව අතුකෝරල පියතුමා - බෝලවලාන, ගරු රූබන් ලෙස්ලි සිල්වා පියතුමා - ලියනගේමුල්ල, ගරු එස්. එන්. ෂෙල්ටන් ඩයස් පියතුමා - දූව, ගරු පීටර් සුබරාජ් පියතුමා - තෝප්පුව, ගරු එම්. ඒ. එච්. එන්. හිෂාන්ත පෙරේරා පියතුමා - දෙහියාගාත, ගරු ලෙස්ටර් ජෝශප් නෝනිස් (කලාපීය සම්බන්ධීකාරක) පියතුමා - කණුවන, ගරු බර්නාඩ් රෙහාට් පියතුමා - බොල්ලත, ගරු බී. ඩී. ඇන්ටන් ප්‍රේමලාල් පියතුමා - සීදුව, ගරු ඇන්ටන් ජයනන්ද ප්‍රනාන්දු පියතුමා - වැවල, ගරු එච්. ඩී. බැසිල් වික්‍රමසිංහ පියතුමා - වත්තල, ගරු ප්‍රසන්න රොහාන් පියතුමා - එඬේරමුල්ල, ගරු ඇන්ටන් ඉයුමාල් පී. පෙරේරා පියතුමා - මාබෝල, ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා - බලගල (නව මීසම), ගරු බී. ඒ. ශිරාන් පියතුමා - මත්තුමගල, ගරු රොෂාන් ප්‍රසාද් ප්‍රනාන්දු පියතුමා - කෙරවලපිටිය (නව මීසම), ගරු සිස්වාන් ද කෲස් පියතුමා - කොටහේන, ගරු ඇන්තනි මාසිලියාර් නි.ම.නි පියතුමා - නව සෙක්කුවීදිය, ගරු දිනේෂ් පී. ප්‍රනාන්දු පියතුමා (කනිටු) - සා. ජෝන් - මෝදර, ගරු රාජ් පැට්‍රික් සිල්වා පියතුමා - සා. අන්ද්‍රේ (මෝදර), ගරු කේ. ජේ. එෆ්. නොයෙල් ඩයස් පියතුමා - ගල්කිස්ස, ගරු ජූඩ් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු පියතුමා - කොලොන්නාව, ගරු ඩී. ඩී. ජූඩ් නික්ලස් පියතුමා - මහරගම, ගරු ඩී. ඒ. ඩී. ගීතාලි ඇනස්ලි පියතුමා - සපුගස්කන්ද (වැඩබලන), ගරු රොනි පොන්සියුස් පෙරේරා පියතුමා - තලංගම, ගරු එරික් මදුරාවල පැ.තු.නි පියතුමා - කොරලවැල්ල, ගරු එම්. එච්. ඩී. සිසිර ප්‍රියශාන්ත පියතුමා - පානදුර, ගරු සුරාන් අත්තිඩිය පියතුමා - කලුතර, ගරු ජූඩ් සුරාජ් ෆොන්සේකා පියතුමා - වාද්දුව, ගරු කේ. ඩී. ඉෂාන් ප්‍රමීන පියතුමා - මග්ගොන, ගරු චමින්ද රොෂාන් පියතුමා - බේරුවල, ගරු කිරුල් ජයනාත් සිල්වා පියතුමා - මිරිස්වත්ත, ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා - නාගොඩ කළුතර (නව මීසම), ගරු රුවන් රීඩ් ලියනගේ (කලාපීය සම්බන්ධිකාරක) - කට්ටුව,

### කලාපීය නාහිමිපාණන්

අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා - මීගමුව කලාපීය නාහිමි (තම්මිට නේවාසිකව), අතිගරු ශාන්තිකුමාර් වැලිවිට - ජා-ඇල කලාපීය නාහිමි (කණුවන නේවාසිකව), අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා - කොළඹ දකුණු කලාපීය නාහිමි (කෝට්ටේ නේවාසික), අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා ධර්මදූත සේවා කලාපීය නාහිමි (පිළියන්දල නේවාසිකව)

### පාසල් හා ආයතනවල පියතුමන්

ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා - ආචාර්ය මණ්ඩලය සා. ජෝන් මේරි වියානි දෙව්සත්හල (මට්ටක්කුලිය), ගරු අමිල වැන්ඩවෝල් පියතුමා - ආචාර්ය මණ්ඩලය සා. ඇලෝසියස් දෙව්සත්හල (බොරැල්ල), සුරංග ප්‍රසාද් ප්‍රනාන්දු පියතුමා - ආචාර්ය මණ්ඩලය සා. ඇලෝසියස් දෙව්සත්හල (බොරැල්ල), ගරු නික්ලස් බටේපොල පියතුමා - ආචාර්ය මණ්ඩලය ඇක්වයිනස් සරසවි විද්‍යායතනය හා අගරදගුරු පදවි පුස්තකාලයාධිපති, ගරු චින්තක පෙරේරා පියතුමා - සුබෝධි ආයතනය (පිළියන්දල), ගරු චන්දනලාල් ප්‍රනාන්දු පියතුමා - ආචාර්ය මණ්ඩලය ඇක්වයිනාස් අධ්‍යාපන ආයතනය, ගරු ශ්‍රියන්ත රත්නසේකර පියතුමා - ආචාර්ය මණ්ඩලය සා. ජෝශප් ශාඛා විදුහල (කඩොල්කැලේ), ගරු පී. ඇන්ටන් රන්ජිත් පියතුමා - උප විදුහල්පති (සා. පීතර විදුහල), ගරු ෂිහාන් ඉන්දික පෙරේරා පියතුමා - ආචාර්ය මණ්ඩලය (සා. පීතර විදුහල), ගරු චමින්ද වනිගසේන පියතුමා - විදුහල්පති උඩුගම්පල සා. පීතර ශාඛා විදුහල, ගරු ට්‍රීසන් සිල්වා පියතුමා - ආචාර්ය මණ්ඩලය සා. සෙබස්තියන් විදුහල මොරටුව, ගරු නුවන් රුද්‍රිගු පියතුමා ආචාර්ය මණ්ඩලය ලොයොලා විදුහල මීගමුව, ගරු සුදම් පෙරේරා පියතුමා ආචාර්ය මණ්ඩලය සිරිකුරුස විදුහල කළුතර,

### පදවි අපෝස්තලික සේවා අධ්‍යක්ෂ / සම්බන්ධිකාරක

ගරු දිනේෂ් ප්‍රනාන්දු පියතුමා (කනිටු) ධර්මෝපදේශය - ඉංග්‍රීසි, ගරු රොහාන් ද අල්විස් පියතුමා අධ්‍යක්ෂ - සෙත්සරණ, අධ්‍යක්ෂ - සා. විසෙන්ති පාවුලා සමිතිය, ගරු එඩ්රිච් රොද්‍රිගු පියතුමා - අධ්‍යක්ෂ කොළඹ කතෝලික මුද්‍රණාලය, ගරු රොහාන් ද සොයිසා පියතුමා සහය සංස්කාරක මැසෙන්ජර්, ගරු ලියෝ පෙරේරා පියතුමා - සැමටසරණ අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමා - ග්‍රේස්කුමරි හා ඒ සම්බන්ධ ළමා නිවාස අධ්‍යක්ෂ, ගරු ඇන්ටන් සමන් හෙට්ටිආරච්චි පියතුමා - අධ්‍යක්ෂ බයිබල් කොමිසම, ගරු ජූඩ් පිරිස් පියතුමා - අධ්‍යක්ෂ ගිහි ධර්මදූත ව්‍යාපාරය (පමුණුගම නේවාසිකව), ගරු කළණ පීරිස් පියතුමා ධර්මදූත සේවා කලාපිය නාහිමිපාණන්ගේ සහයක (දෙමළ),

### කලාපීය සම්බන්ධිකාරකවරු

ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමා (ජ්‍යෙෂ්ඨ) බයිබල්, ධර්මෝපදේශ හා අධ්‍යාපනය මීගමුව කලාපය (පල්ලන්සේන මීසමේ දූවන දෙව්මැඳුරේ නේවාසික), ගරු රුවන් රීඩ් ලියනගේ පියතුමා - තරුණ කටයුතු, ත.ක්‍රි.ශි, ළමා හා දේවකැඳවීම් මීගමුව කලාපය (කට්ටුව මීසම් සේවක ලෙස සහයක පියතුමකුද සමඟ) ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා - බයිබල් ධර්මෝපදේශ හා අධ්‍යාපනය ජාඇල කලාපය (කණුවන මීසම් සේවක ලෙස සහයක පියතුමකුද සමඟ), ගරු රසික ඉවාන් කුරේ පියතුමා තරුණ කටයුතු ත.ක්‍රි.ශි. ළමා හා දේව කැඳවීම් ජාඇල කලාපය (හපුගොඩ මීසම් සේවක ලෙස සහයක පියතුමකු සමඟ), ගරු ප්‍රෙඩී ශාන්තිකුමාර් පියතුමා - තරුණ කටයුතු ත.ක්‍රි.ශි. ළමා හා දේව කැඳවීම් කොළඹ දකුණු කලාපය (මොරටුව නිවාසයේ නේවාසිකව), ගරු මංජුල නිරෝෂන් ප්‍රනාන්දු පියතුමා - බයිබල් ධර්මෝපදේශ හා අධ්‍යාපනය ධර්මදූත සේවා කලාපය (පිළියන්දල නිවාසයේ නේවාසිකව), ගරු ලක්ප්‍රිය නෝනිස් පියතුමා - තරුණ කටයුතු ත.ක්‍රි.ශි. ළමා හා දේව කැඳවීම් ධර්මදූත සේවා කලාපය (වැලිවේරිය මීසම් සේවක ලෙස සහයක පියතුමකුද සමඟ),

### අගරදගුරු පදවි උපාධ්‍ය පියතුමන්

ගරු රාජ් සිල්වා පියතුමා - අපෝස්තුලාටුස් මාරිස්, ගරු ගිහාන් ගුණතිලක පියතුමා - ත.ක්‍රි.ශි ව්‍යාපාරය, ගරු ජූලියන් තිසේරා පියතුමා -මාක්ශ්‍රී නිවාස උපාධ්‍ය, ගරු සිසිර සමරකෝන් පියතුමා රාගම රෝහල් උපාධ්‍ය, ගරු රොහාන් ද අල්විස් පියතුමා - ශ්‍රම සංක්‍රමික,

### අමතර

ගරු ජූඩ් ටෙනිසන් පියතුමා - සහයක අගරදගුරු පදවි වතු,

### නේවාසික පියවරු

ගරු එච්. ඩී. ඇන්තනි පියතුමා - ඉඳිගොල්ල සිද්ධස්ථානය, ගරු ක්‍රිස්ටෝ විරාජ් ප්‍රනාන්දු පියතුමා - අත්තිඩිය, ගරු ජෝන් හෙට්ටිආරච්චි පියතුමා - වත්තල, ගරු බැසිල් නික්ලස් පියතුමා - බණ්ඩාරවත්ත,

ගරු ජූඩ් සමන්ත ප්‍රනාන්දු පියතුමා

## නිවේදනයයි

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් උත්ථාන සමයේ පළමු ඉරුදින පටන් ඉරිදා වලංගු ඉංග්‍රීසි දිව්‍ය පූජාව දේව වන්දනාව හා සක්‍රමේන්තු විනය පිළිබඳ ශුද්ධාසන කොමිසමේ අනුමතිය ලද නව පරිවර්තනයට අනුව සිදුකළ යුතු බව දැනුම් දෙන ලෙස මගෙන් ඉල්ලා සිටින ලදී.

මේ නව මිසාල් පොත පොත් සාප්පුවලින් සහ ඕර්ඩෝ පොත අගරදගුරු මැඳුරු පුස්තකාලයෙන් ලබාගත හැකිය.

පැරැණි ඉංග්‍රීසි භාෂා දිව්‍ය පූජාව මින්මතු පවත්වනු ලබන්නේ නැත.

ගරු ජූඩ් සමන්ත ප්‍රනාන්දු පියතුමා
ලේකම් පරිපාලන

## 49 වැනි අන්තර් ජාතික දේව කැඳවීම් යැදුම් දිනය අදයි!

**සෑම දේව කැඳවීමක්ම දෙවියන් වහන්සේ වෙතින් නොමිලේ ලැබෙන තිළිණයක් බව අප මතක තබා ගත යුතුය. දේව කැඳවීම් සඳහා අත්‍යවශ්‍ය සහ මූලික කරුණ නම් අපගේ යැදුම් සහ ජනවන්දනා සැමරුම් යැයි අදට යෙදී ඇති 49 වැනි අන්තර්ජාතික දේව කැඳවීම් ඉරුදින නිමිත්තෙන් පණිවුඩයක් නිකුත් කරන කොළඹ අගරදගුරු පදවි දේව කැඳවීම් අධ්‍යක්ෂ ගරු ජේ. ඩී. ඇන්තනි ජයකොඩි පියතුමා ප්‍රකාශ කරයි.**

එහි මෙසේ ද දැක්වේ. අද දින විශ්ව සභාව 49 වැනි දේව කැඳවීම් ඉරුදින සමරයි. අති උතුම් සවැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමා 1964 අප්‍රේල් 09 වැනි දා දේව කැඳවීම් උදෙසා යැදීමේ දිනය ස්ථාපිත කළේය. එදා පටන් උත්ථාන සමයේ සිවුවැනි ඉරුදින එනම් යහපත් එඬේරාණන්ගේ ඉරුදින දේව කැඳවීම් උදෙසා යදින්නට සසුන් පිය උපදෙස් මත සභාව සිය සැදැහැවතුන් යොමු කරන්නීය. මේ වසරේ දේව කැඳවීම් දින තේමාව දේව කැඳවීම් දේව ප්‍රේමයේ තිළිණයකි යන්නයි.

යහපත් එඬේරාණන්ගේ ඉරුදින දේව කැඳවීම් ඉරුදින සඳහා වඩාත් යෝග්‍ය දිනය වනුයේ යහපත් එඬේරාණන්ගේ රූපය දේව ප්‍රේමය ප්‍රකාශ කිරීමේ දී අපට නිතැතින් සිහිපත් වන සිතුවම නිසාවෙනි.

## සුබාසිංසන



ගාල්ල විශ්‍රාමික රදගුරු අතිඋතුම් එල්මෝ පෙරේරා හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය මැයි 01 දාට යෙදේ. එතුමනට ප්‍රදීප සුබාසිරි සමඟ දේවාසිරි පතා යදිමු.

හංවැල්ල මීසමේ පහත්ගම දේවස්ථානයේ පැවැති පාස්කු ඉරුදින දිව්‍ය පූජාව කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සහයක ගරු ටිරෝන් අජිත් යන ගරු පියවරුන් සමඟින් පහත්ගම කිතුනු සංඝය විසින් සංවිධානය කර තිබුණි.

ඇන්තනි
හෙට්ටිආරච්චි



මහසිකුරාදා රද්දොලුගම ලූර්දු මාතා දෙව්මැඳුරු බිමේ පැවති මෙහෙයේදී ජේසු ක්‍රිස්තු කුරුස ප්‍රතිමාව මඟින් එතුමාගේ දුක්ප්‍රාප්තියේ විවිධ අවස්ථා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කැරිණ. රද්දොලුගම මීසම් වාසින්ගේ රංගන දායකත්වය සහිතව වේදිකා ගතවූ එහි එක් අවස්ථාවකි මේ. රද්දොලුගම මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා සමඟ ගරු ජූඩ් ක්‍රිශාන්ත පියතුමන් ද, දිලීප සම්පත් හා වික්ටර් යන පැවිදි සොයුරෝද දැනුවත් කළහ.

රන්ජිත් ලොකුපෝතාගම



ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 අප්‍රේල් 29 ඉරිදා

# සමයාන්තර සුහදත්වයෙන් එළිදැක්වුන වතිකාන පණිවුඩය

බෞද්ධයන්ගේ තෙමඟුල් උලෙළ අළලා, කිතුනුවන් හා බොදුනුවන් ලෙස සමයාන්තර සංවාදය තුළින් බාල පරපුරට සාධාරණත්වය හා සාමය පිළිබඳ ඉගැන්වීමේ වගකීම් බෙදා ගනිමු යන්නට ආරාධනාවක්ද කරමින් අති උතුම් ජාන් - ලුවිස් කාදිනල් තවුරාන් හිමි අත්සනින් සමයාන්තර සංවාදය පිළිබඳ ශුද්ධාසනීය සංසදය නිකුත් කොට ඇති පණිවුඩය වෙසෙසින්ම මෙරට ජනයාගේ ඇගයීමට ලක්විය යුතුයි.

අනුසාර කරන සැම සමයකම මූලික හරය වන්නේ තම අනුගාමික ජනතාවට විමුක්තිය ලබාගැනීමේ මඟ හෙළිපෙහෙළි කර ගැනුමට පූර්ණ දැනුවත්වීමක් ලබාදීමයි. නමුත් ශ්‍රී ලංකාව විෂය අරබයා එම දැරිය යුතු උත්සහයේදී උත්පාද වී ඇති යම් කිසියම් තරඟකාරීත්වයක් තුළ යම් භේද බින්නතාවක සැඟවුන සෙවනැලි නැතුවාම නොවේ. පුද්ගලයන් අතර සහජීවනය ගොඩනැඟීම, ජාතික අනන්‍යතාවය ගොඩනැඟීම, එකිනෙකාට ගරු කිරීම, සුහදතාවයෙන් යුක්තව ජීවත්වීම, අන්‍යෝන්‍ය අවබෝධය හා තේරුම් ගැනීම ඇතිකරලීම, සංස්කෘතීන්, ජාතීන් අතර ගැටීම් වළක්වා ගැනීමට කටයුතු කිරීම වැනි එකමුතු සමයාන්තර දැක්මක ගමනක් ඉතාම අවැසි මේ වකවානුව තුළ බුදුන්ගේ තෙමඟුල මුල් කොට ශුද්ධාසන සංසදය නිකුත් කළ පණිවුඩයෙන් මූලිකවම පවසන්නේ විවිධ විශ්වාසයන් හා ආගමික පසුබිම්වලට උරුමකම් කියන ලොව පුරා සිටින දරුවන් එකම පන්ති කාමරයක් තුළ තම ආගම ධර්මය මෙන්ම අන්‍යාගම් පිළිබඳවද අධ්‍යයනය කරන බව අමතක නොකළ යුතු බවයි.

එයින් මතක් කරනු ලබන්නේ මෙම විවිධත්වය තුළින් පැන නඟින අභියෝගය හා ගැඹුරු අධ්‍යයනයන් බාල පරපුරට ලබාදිය යුතු ආකාරයයි. එය සමයාන්තර සුහදතාවයෙන්ම කරන ඇරියුමකි. මන්ද එම අධ්‍යයනයන් මූලික විය යුත්තේ අන්‍යාගම් වලට ගරු කිරීමටත්, ඔවුන්ගේ ඇදහිලි ක්‍රම පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනීමටත්ය. මෙහිදි අති උතුම් ජාන් ලුවිස් කාදිනල් තවුරාන් හිමි අවධාරණය කරන කරුණ සුළු කොට තැකිය යුතු නොවේ. එතුමන්ට අනුව බාල පරපුරක් පෙර කී දැනුමෙන් පෝෂණය වී, වගකීමෙන් යුත් මනුෂ්‍යයන් වී, අන්‍යාගමිකයන් හා අත්වැල් බැඳ ගැනීමට සූදානම් විය යුත්තේ ගැටුම් නිරාකරණය කර ගැනීමටත් මිත්‍රත්වය, සාධාරණත්වය හා අව්‍යාජ මානව සංවර්ධනය ගොඩනැංවීම උදෙසාත්ය.

එනයින් දැනුවත් වීම ලබා ඇති කතෝලික සංඝය බොදුනු සහෝදර පිරිස දෙස බලන්නේ ඉතා අග්‍රගන්‍ය පැවතුම් වන මෛත්‍රීය හා පරිත්‍යාගශීලිත්වය තුළින් අන් අයට හිංසාවක් නොවන පරිදි ජීවත් වීමට හික්මීමක් ලබා ඇති උසස් උගත් පරපුරක් ලෙසයි. එය සැබෑ සමාජ ප්‍රතිචාරයක් ගොඩනැංවීමට බොදුනුවන් නිරන්තරයෙන් සිය බාල පරපුරට ලබාදෙන තිළිණයකි. වෙසඟ අළලා කරන මෙනෙහි කෙරුමේදී බාල පරපුර දැනුමෙන් පෝෂණය කිරීම හා වගකීම් බෙදා ගනිමින් අන් අය හා සමඟියෙන් ජීවත්වීමට සැලැස්වීම පිළිබඳ ආගමික දායකත්වය හුවා දක්වන පැහැදිලි අවස්ථාවක් ලෙස කල්පනාවට නැගෙනු ලබයි.

එලෙසම සමයාන්තර සුහදත්වයේ පොදු ආධ්‍යත්මයක් පතන තරුණ ලෝකය තුළද ඉස්මතු වන හැඟීම් තේරුම් ගැනීමට මෙය හොඳ කාලවකවානුවක් බවද අවධාරනය විය යුතුය. ධර්මයන්හි වෙසෙස් ඇතුලාන්ත පැවැත්මේ සත්‍යය සොයා අප සැම යන වන්දනා ගමනේ ප්‍රගතියට පා තැබීමට උපකාර වන්නේ පොදු ආධ්‍යත්මයක් සොයන මේ තරුණ කැලයි. වතිකාන පණිවුඩය සිහිපත් කරන්නේ අනාගතයේ නිර්මාණකරුවන් ලෙස ඔවුන්ගේ ජවය තුළ අප වෙන්කරන සියළුම බාධක විනාශ කිරීමට එම පරපුර අපට බල කරන බවයි. ඒ පොදු ආධ්‍යාත්මයේ හඬ ශබ්දය වන තරුණ පරම්පරාවේ විචාර තුළින් ආගම් හා සංස්කෘතීන් අතර ඔවුන් නඟන සංවාද හරහා එකමුතුවන්නට ඔවුන් අපට බල කරන බව අමතක කළ යුතු නොවේ.

එබැවින් බුදු හිමි වදාළ ධර්මතාවයේ පහසින් සිරිලක සුවඳවත් වන මේ සමයේදී අන්තවාදයටත්, ජාතිවාදයටත්, ආගම්වාදයටත් තිත තබන්නට වැඩිහිටි ලෝකය සවිමත් විය යුතු බවද මතක් කරන්නේ අව්‍යාජ හැඟීමෙනි. 'සිංහල රාවය' 'බොදු ජය' වැනි කුඩා කණ්ඩායම් තුළ බොදුනුවා සිරගත කළ යුතු නොවේ. අන්තවාදීව ප්‍රශ්න දෙස බලන්නට බොදුනුවා කොදෙව්ගත කළ යුතු නොවේ. අධිපති ආධ්‍යාත්මික උන්මාදයක බොදුනුවා සිර කළ යුතු නොවේ. සම්මා සම්බුදු අමා මහා මෑණියන් පහසින් සුවඳවත් වුනු මේ දෙරණෙහි හෙට දවසේ පුදින අරුණාලෝකය තුළ සිල්වත් වන්නට බොදුනුවා දරන තැත අන් ආගමිකයන් වන අපට සුහද ආදර්ශයක් විය යුතු බව පසක් කරනු ලබන්නේ ඒ නිසාමයි.

# දිවැසිවරය හා දේශපාලනය



සභාවේ දිවැසිවර මෙහෙවර සියළුම දේශපාලන බල ව්‍යුහයන් සහ බලවතුන් ඉදිරියේ පැහැදිලි ස්ථාවරයක පිහිටා ක්‍රියාත්මක කළ යුතුව ඇත්තේ සභාවෙ ප්‍රධාන දූත මෙහෙවර දේවරාජ්‍යය ගොඩනැගීම වන නිසාය. රාජ්‍ය පාලකයන් සමඟ අශුද්ධ සන්ධානයකට නොයන සභාව කිසිසේත් රාජ්‍ය පාලකයන්ගෙ අසාධාරණය සහ අයුක්තිය ඉදිරියෙ නොසැළී, නොබියව, එඩිතරව තම ස්ථාවරය ප්‍රකාශ කළ යුතුය. පාස්කු අතිරේකය කතු වැකිය එය මෙලෙස අවධාරණය කරයි."

"අධම පාලන තන්ත්‍රයක් වෙතොත් දිවැසිවර වගකීම ඉටුකළ යුතුයි". එමෙන්ම යහපත් රාජ්‍ය පාලන ව්‍යායාම්වලදි යහපත සහ සත්‍යය වෙනුවෙන් පෙනීසිටීමද දිවැසිවරයේ වගකීමකි. සභාව පෙනීසිටින්නේ සාධාරණත්වය, සමානාත්මතාව, සහෝදරත්වය සහ නිදහස රජයන සමාජයක් සඳහාය යන්න ශ්‍රී ලාංකික සමාජයට ඒත්තුගැන්වෙන අන්දමට තම සූජාතබව රැකිය යුතුය.

දේශපාලන බල ව්‍යුහයෙ නායකත්වය අධිපති නායකත්වයකි, කතෝලික සභාවෙ නායකත්වය සේවක නායකත්වයකි. එය හුදු නිළබලයේ නායකත්වයකට වඩා ආධ්‍යාත්මික පදනමක පිහිටන සදාචාරාත්මක නායකත්වයකි. එනිසා සදාචාර විරෝධී කිසිවකට සභානායකත්වයට එකඟවිය නොහැක. දෙවන වතිකාන සමුළුවෙන් පසු සභාවෙ ව්‍යුහය පිරමිඩාකාර ව්‍යුහයට වඩා සමානාත්මතාවයේ ව්‍යුහයකට නැඹුරු වූවාය. වෘත්තාකාර ව්‍යුහයේ කේන්ද්‍රයේ සිට පරිධිය දක්වා ඇත්තේ පීඩාකාරී බැඳීම ඉවතලන සහෝදරත්වයේ බැඳීමකි. පරිධියෙන් නැගෙන ජනතා හඬ, දේව හඬ ලෙස පිළිගෙන කේන්ද්‍රය සහෝදරත්වය ප්‍රකාශ කළ යුතුය. එසේ නොවන්නේ නම් සභාව තුළම ප්‍රතිවිරෝධතාවයන් මතුවී, පරිධිය පීඩනයට ගොදුරුවිය හැක. ධීවරයන්ගෙ, ගොවීන්ගෙ වතුකම්කරුවන්ගෙ, කම්කරුවන්ගෙ හඬ සභාවේ හඬවිය යුතුය.

උතුරු මැද පළාතෙ ගොවින්ගෙ ප්‍රශ්නය සභාවෙ ප්‍රශ්නයකි, බස්නාහිර, වයඹ ධීවරයන්ගෙ ප්‍රශ්නය සභාවේ ප්‍රශ්නයකි. කඳුකරයෙ වතු කම්කරුවන්ගෙ ප්‍රශ්නය සභාවෙ ප්‍රශ්නයකි. වෙළෙඳ කලාපයේ කම්කරුවන්ගෙ ප්‍රශ්නය සභාවේ ප්‍රශ්නයකි. මෙම ආන්තික ජනතාව සමඟ සිටින ගරු පූජක, පැවිදි, ගිහි පිරිස් සහෝදරත්වය දක්වමින් සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටිමින් දේව රාජ්‍යයට සාක්ෂි දරති. ආණ්ඩු විරෝධීන් ලෙස සළකමින් ප්‍රශ්න කිරීමට යෑම සත්‍යය විකෘති කිරිමකි.

**සෙත්සවිය**

සෞඛ්‍ය ඇමැති තුමා සෙඩෙක් ආයතනයට එල්ලකරන ලද 'ජිනිවා' චෝදනාව පිටුපස තිබෙන්නේ උතුරු - මැද පළාතෙ ගොවීන්ගෙ ප්‍රශ්න සඳහා ගොවීන් සමඟ සෙඩෙක් ආයතනය සිටින නිසාය. දේශපාලන බේදයකින් තොරව ස්වාධීන ගොවි සංවිධාන ගොඩ නැගීමට සෙත්සවිය - උතුරුමැද පළාතෙ සෙඩෙක් ආයතනය ගෙන ඇති ව්‍යායාමය ප්‍රශංසනීයයි. මෙම ගොවි සංවිධාන දේශපාලනිකව ලැබෙන කොන්ත්‍රාත් පසු පස නොයන ප්‍රතිපත්ති ගරුක ගොවි සංවිධාන බව කිව යුතුය. ඔවුන් පෙනී සිටින්නේ උතුරුමැද පළාතේ ගොවීන් වෙනුවෙන්ය. ඔවුන් සමඟ සෙත්සවිය බැඳී සිටින්නේ ආණ්ඩු විරෝධයක් නිසා නොව තම සහෝදර ජනතාවගෙ අයිතීන් වෙනුවෙන් සහ ඔවුන්ගෙ ගරුත්වය ආරක්ෂාකිරීමටය.

> **කතෝලික සභාවේ සාමය, සාධාරණත්වය සහ මානව සංවර්ධනය සඳහා වු දූත මෙහෙවර පටු දේශපාලන අර්ථකථනවලට යටපත් කළ නොහැකි බව දේශපාලන නායකයන් වටහා ගන්නේ නම් රටට අත්‍යවශ්‍ය වී ඇති යහ පාලනය ගොඩනැගීම පහසුවෙනවා නිසැකය.**

**ජනතා අයිතීන් සහ ගරුත්වය**

දඹුල්ලෙ ගොවි හඬට එකතුවන්නට එහි ගිය ධීවර, කම්කරු ජනතාව එහි ගියේ ආණ්ඩු විරෝධය නිසා නොව තම සහෝදරත්වය ප්‍රකාශ කිරීමටය. යුක්තිය, සාමය සහ මානව සංවර්ධනය පිළිබඳ ජාතික කතෝලික කොමිසමේ සභාපති අති උතුම් හැරල්ඩ් ඇන්තනි රදගුරු හිමි සභාවෙ කැපවීම අවධාරණය කරමින් ප්‍රකාශ කර සිටින්නේ, "ජනතා අයිතීන් වෙනුවෙන් සහ ඔවුන්ගෙ ගරුත්වය ආරක්ෂා කිරීමට සැමවිටම සෙඩෙක් ආයතනය ක්‍රියාකාරිවන වගයි. තවදුරටත් සභාවෙ දූතික මෙහෙවර අවධාරණය කරන රදගුරු හිමි දිළින්දන් සහ අසරණයන් වෙනුවෙන් සිදුකරන්නාවූ සේවයට කැපවීම යළි ප්‍රකාශ කරයි. එමෙන්ම අප අදහන්නාවූ කිතු දහම හා එහි වටිනාකම් තුළ එකී දයාවෙ සේවාවන් පවත්වාගෙන යාමට අපි කැපවී සිටින බවට ප්‍රතිඥා දෙයි. කතෝලික සභාවේ සාමය, සාධාරණත්වය සහ මානව සංවර්ධනය සඳහා වු දූත මෙහෙවර පටු දේශපාලන අර්ථකථනවලට යටපත් කළ නොහැකි බව දේශපාලන නායකයන් වටහා ගන්නේ නම් රටට අත්‍යවශ්‍ය වී ඇති යහ පාලනය ගොඩනැගීම පහසුවෙනවා නිසැකය.

**වි.ලෙ. පිරිස්**

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# වාසි පතා ආගම් වෙනස් කරන ලෝකයක ඔබේ අභියෝගය උරුමය රැකගැනීමයි

## සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ පවසති

එදා 12 දෙනෙකුගෙන් ආරම්භ කළ කතෝලික සභාව අද සියක් කෝටියක් බවට පත් විය. කොරළවැල්ල සභාව තුළ 208 දෙනෙක් වැඩිහිටියන් බවට පත්වී සත්‍ය විශ්වාසයට සාක්ෂි දරන්නට පොරොන්දු දෙන අවස්ථාවේ වැඩිහිටියන් බවට පත් වන ඔබ වැඩිහිටියන් ලෙස ක්‍රියා කරන්න. ඔබේ ක්‍රියාවෙන් සහ වචනයෙන් විශ්වාසය ප්‍රකාශ කරන්න. ඔබ අද සනාථ කරන්නේ එදා ඔබේ දෙමාපියන් දුන් පොරොන්දුවයි. සභාව තුළ වැඩිහිටියන් ලබන සෑම වරප්‍රසාදයකම මූලික හරය වගකීම වනුයේ විශ්වාසය රැක ගැනීමයි. අද මේ විශේෂ කණ්ඩායමට එය මහත් අභියෝගයක් යැයි කොරළවැල්ල සා. මිඛායෙල් අග්‍රදූතයාණන්ගේ දෙව්මැඳුරේ 208 දෙනෙකුට අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව දනය කළ දේව මෙහෙයේදී අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වෙල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණෝ ප්‍රකාශ කළහ.

එහිදී වැඩිදුරටත් කතාකළ සහයක රදගුරු හිමි අප අතරින් ඇතැම් පුද්ගලයන් මිල මුදලට, උදව් උපකාරයන්ට වහල්වී, රැවටී. විශ්වාසය අමතක කර දමා විශ්වාසය පාවා දෙන අවස්ථා කොතෙකුත් ඇත. අතීතයේ අපගේ මුතුන් මිත්තන් රැක ගත්තේ අහම්බෙන් අහසින් කඩා වැටුණු විශ්වාසයක් නොව, රුධිරය ගලා ජීවිතය පුදා කිසිදු පූජාප්‍රසාදිවරයෙක් නොමැතිව රැක ගත් විශ්වාසයකි. අද ඔබ රැක ගැනීමට පොරොන්දු වන්නේ ඔබේ ඒ අභීත මුතුන් මිත්තන් රැකගත් විශ්වාසය යි පැවසීය.

අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව දානය කළ දේව මෙහෙයට දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු කොරළවැල්ල මීසම් සේවක ගරු ලියෝ කැමිලස් පියතුමෝ ද සහභාගි වූහ. රදගුරු පදවි ප්‍රාප්තියෙන් පසු කොරළවැල්ල මීසමට රදගුරු හිමිපාණන් සැපත් වූ ප්‍රථම අවස්ථාව මෙය වේ. එතුමන් මහත් හරසරින් පිළිගන්නා ලදි.

සටහන - ක්‍රිස්ටි ප්‍රදීනාන්දු



සේයා - ඇලෙක්ස් ජේ. සිල්වා

## උස්වැටකෙයියාවේදී එතෙර වන්නට මං පාදයි

එතෙර වන්නට මඟ පෑදූ පාස්කු දුක් ප්‍රාප්තිය නමින් මෙවර උස්වැටකෙයියාව මීසමේ මහ සිකුරාදා දින තුන් පැය ධ්‍යානය සමඟ පාස්කු නාට්‍යයක් එම මීසමේ ධර්ම සේවා සභාව මඟින් පත්කළ පාස්කු කමිටුව මඟින් රඟ දැක්වීමේ සියලුම කටයුතු ඉතා සාර්ථකත්ව සිදුකර තිබිණ.

උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමාගේ මඟපෙන්වීමෙන් මනාලෙස සංවිධානය කර තිබූ එම නාට්‍යයේ සියලුම චරිත මීසමෙන් තෝරාගත් සාමාජික සාමාජිකාවන් ඉතා උසස් අන්දමින් රඟ දැක්වූ අතර, ජේසු චරිතය රඟපෑ ප්‍රගීත් මිලින්දගේ රඟපෑම කැපී පෙනුණි. බාල, තරුණ, වැඩිහිටි, මහළු සැමගේ සිත් පුබුදුවමින් කළ මෙම මෙහෙයට අවට ගම් වලින්ද සැදැහැවතුන් විශාල පිරිසක් සහභාගි වූහ.

සිරිල් ජයමහ



මඩම්පැල්ල මීසමේ වන්නි මඩු මාතා දෙව්මැඳුරේ පාස්කු ඉරිදා දේව මෙහෙය මීසම් සේවක ගරු ලක්නාත් කුරේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, එහිදී ආසිරි පැන් සඳහා ලුණු මිශ්‍ර කළ අයුරු.

රොබට් ප්‍රනාන්දු

## පාදනමස්කාරය යද්දී සිදුවූ අනතුරකදී වැරදිකරුට සමාව

බෝලවත්ත මීසමේ එළිමහන් පාදනමස්කාරය සඳහා අතිවිශාල ජනතාවක් සහභාගි වූ අතර බාල, තරුණ, වැඩිහිටි අය සහ කුඩා දරුවන්ද සහභාගිවූ මෙම පාදනමස්කාරය ප්‍රදේශයේ එක් මාර්ගයක ගමන් කරන විට එය පසුකර යන්නට වේගයෙන් පැමිණි මෝටර් සයිකල් කරුවකුගේ සයිකලයට අයිනෙන් ගමන් ගත් කුඩා දරුවකු හැපී බිම වැටුනි.

සැනෙකින් එතනට දිව ආ තරුණයකු මෝටර් සයිකල්කරුගේ අත්දෙක අල්ලා පහරක් ගැසීමට උත්සාහ ගෙන, නැවතත් ඉහලට එසවූ අත පහලට දමා. බිම වැටී සිටි කුඩා දරුවා ඔසවා දරුවාට තුවාල සිදුවී ඇත්දැයි බලන්නට විය. දරුවාට කිසිදු තුවාලයක් සිදුවී නොතිබුණු අතර, සයිකල්කරුට කල්පනාවෙන් යතුරු පැදිය පදවන ලෙසට අවවාද කර මුදා හරින ලදි.

කේ. නිහාල් ප්‍රනාන්දු



මහ සිකුරාදා දින 28 වැනි වරටත් මාබිම කල්වාරි පුදබිමේ වේදිකා ගතවූ "මම පිපාසවෙමි" නාට්‍යයේ එළිමහන් පාදනමස්කාරයේ එක් දර්ශනයක්. ක්‍රිස්තුන් වහන්සේගේ චරිතය දිමුතු ආසිරි නාවලගේ රඟ පෑ අතර අධ්‍යක්ෂණය මොරිස් බොල්ලෑගලගෙනි.

## කඩලාන අන්තෝනි මුනි නොවාන බැතියේ 2300 වන නොවානය පැවැත්වේ

කඩලාන ගම්මානය කැප කර තිබෙන සුදුවර අන්තෝනි තුමන්, අප මුතුන් මිත්තන් විසින් ස්වාමින් වහන්සේ වෙත තිබෙන විශ්වාසය තව තවත් ශක්තිමත් කරනු පිණිස ස්වාමින් වහන්සේ ඉදිරියේ නිරතුරු මැදිහත් වෙමින් අප අවශ්‍යතා ඉටුකර දීම වෙනුවෙන් සමිඳුන් පුදන්නට මෙවන් වූ සුවිශේෂී අවස්ථාවක් උදාවීම පිළිබඳව අපි විශේෂයෙන් තුති පුදමු යැයි දකුණු කොළඹ කලාපීය නාහිමි මීසම් පූජක පුතු අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා පැවසුවේ කඩලාන සා. අන්තෝනි දෙව්මැඳුරේ මුනිවර බැතියේ 2300 වන නොවානය පසුගියදාට යෙදී තිබුණි. එසේම 2010 වසරේ සිරිලක සැපත් ශු. අන්තෝනි මුනිඳුන්ගේ හෘදය ධාතු ප්‍රදර්ශනයට සමගාමීව ගරු ප්‍රසාද් පෙරේරා පියතුමාගේ සේවා කාලයේදී දෙව්මැඳුරට ලද මුනිඳුන්ගේ සළුධාතුවේ වසර 2 සපිරීම ද මෙදිනට යෙදී තිබුණි.

මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ ගරු මලින්ත චතුරංග සහායක පියතුමන්, ගරු පැවිදි සොයුරියන් හා එක්ව මීසම් ධර්මසේවා සභාව නොවාන පූජාව සංවිධානය කළ අතර, සළුධාතුවේ ආසිරි ලබන්නට අති විශාල ජනතාවක් පැමිණ සිටියහ.

රවීන්ද්‍ර ජේ. ඇන්ටනි ප්‍රනාන්දු

## වැවල ශු. ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුර

ඈත අතීතයේ සිට මුතුරාජවෙළබඩ මේ පෙදෙසද හඳුන්වනු ලැබුවේ වැලිගම්පිටිය නමිනි. වැවල දෙව්මැඳුරට අයිති ඉඩමේ සඳහන් වන්නේද වැලිගම්පිටිය ලෙසයි. මේ ගම් පියස වෙන්කර වැවල නමින් ගම්මුලාදෑනි වසමක් ඇතිකිරීමෙන් පසු මෙගම වැවල විය.

1505 දී පෘතුගීසීන් සමඟ ලංකාවට පැමිණි ප්‍රැන්සිස්කාන පියවරුන්ගේ කාලයේදී මුතුරාජ වෙළබඩ දෙව්මැඳුරක් ඉදිකර ඇත. මැටි බිත්තිවලින් තැනූ එම දෙව්මැඳුර 'බිලිඳු උපන් පල්ලිය' නමින් හැඳින්විණි. නැසීගිය බිලිඳකු එම දෙව්මැඳුරේ තබා ගෙන යාච්ඤා කරද්දී එම බිළිඳාට ප්‍රාණය ලැබුබව පරපුරෙන් පරපුරට එන ආරංචියකි. 1607 දී මෙහි දෙව්මැඳුරක් තිබූ බව සඳහන් වෙයි. (පර්නිකේලා පෘතුගිසි ලේඛන සස 267) 1627 වාර්තාවකද සඳහන් වනුයේ ද මෙහි දෙව්මැඳුරක් තිබූ බවයි. මාස තුනක් ඇතුළතදී 800 දෙනෙක් ප්‍රසාද ස්නාපනය ලැබූ බවත්, 72 ක් එහි ආගම ඉගනීමෙහි යෙදී සිටි බවත් වැඩිදුරටත් සඳහන් වෙයි. ලන්දේසින්ගේ විරෝධතාවය නිසා හෝ එම දෙව්මැඳුර කඩා වැටීම නිසා හෝ වත්මන් දෙව්මැඳුරට බටහිර දෙසින් තාවකාලික දෙව්මැඳුරක් සාදා ඇත. එම ඉඩම පල්ලිය තීරය නමින් දැනුදු හැඳින්වෙයි. ඉන්පසු වත්මන් දෙව්මැඳුරු බිමේ තුන්වැනි දෙව්මැඳුර ගොඩනගා ඇත. එය ස්ථිර ගොඩනැගිල්ලකි. එහි තිබූ මිල්ල බාල්කයක් මින් පසු සෑදුණු දෙව් මැඳුරේ බිත්තියක් උඩ යටලීයක් වශයෙන් දමා තිබුණි.

1705 දී කුරුණෑගල ගල්ගමුවේදී. වන්දනීය ජුසේවාස් පියතුමා කැඳවූ රැස්වීමේදී, එහි පැමිණි පියවරු අට නමට ලංකාවේ ධර්මදූත සේවය පවරන ලදි. ඒ අනුව බටහිර මුහුදුබඩතීරයේ වෙල්ලවල්ලි, බෝගම, මීගමුව, වැලිගම්පිටිය. වෑවල, ශුද්ධවූ ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුර, කොළඹ, කළුතර සිට මාතර දක්වාවූ මුළු ප්‍රදේශයම මනුවෙල් මිරැන්ඩා පියතුමාට බාරවිය. ලංකාව පුරා ධර්මදූත සේවයේ යෙදුණු වන්දනීය ජුසේ වාස් පියතුමා මෙම දෙව්මැඳුරටද පැමිණි බව පරම්පරාවෙන් පරම්පරාවට එන ආරංචියකි.

19 වැනි ශත වර්ෂයේ මැද භාගයේදී කබුක් ගලින් හා මැටියෙන් බැඳ සුණු පිරියම් කර සෑදු විශාල දෙව්මැඳුරකි. මැද කනු පේළි දෙකක් තිබුණි. එම දෙව්මැඳුරේ දොරක සවිකර තිබූ යකඩ පට්ටමක 1862 සඳහන් කර තිබුණි. දොරවල් දැමුවේ, ඒ වර්ෂයේ විය හැකියි. එම දෙව්මැඳුරේ මොගොප්පුව කඩා වැටීමෙන් පසු ගරු ලියෝ ප්‍රනාන්දු පියතුමා සභාවේ කතෝලිකයන් හා එකතුව, 1918 දී අලුත් දෙව්මැඳුරට අත්තිවාරම් දැමීය. පසුව පැමිණි පියතුමන්ගේමහත් උත්සහයෙන් දෙව්මැඳුරේ ඉදිරි කොටස



ගොඩ නැගිණි. අල්තාරය හා අතු පල්ලි දෙක ගරු පී. රිගොලේ හා ගරු ජේ සෙයිටර පියවරුන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් ගොඩනැගුණි. මේ දෙව්මැඳුර ඉදිරි පැත්තේ කලින් දෙව්මැඳුරේ තිබූ ගරාදිවැට සිහිවටනයක් ලෙස තබා ඇත. 1942 මැයි 17 දින කොළඹ අග්‍රාජගුරු ප්‍රසාදි අතිඋතුම් ජේ. ඇම්. මැසොන් හිමිපාණන් විසින් ආශිර්වාද කරන ලදි.

1643 මෙහි තුන්වැනි දෙව්මැඳුරේ ප්‍රථම වරට ආරම්භ කරන ලද ශුද්ධවූ ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ වාර්ෂික මංගල්‍යය දැන් වාර්ෂිකව පැවැත්වේ. වෑවල මීසම් සේවක ගරු බැසිල් නික්ලස් පියතුමා දෙව්මැඳුර අලුත්වැඩියාකර තිබේ.

ඩී. එන්. එෆ් කෝස්තා



පසුගිය පාස්කු ඉරුදින රත්මලාන සා. ජෝසප් දෙව්මැඳුරේ දිව්‍ය පූජාව කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් සිදු කරන ලදී. මීසම් සේවක ගරු රොනී වික්‍රමසිංහ පියතුමා ඇතුලු දහම් ගුරුවරුන් දරුවන් ගාලුපාර අබියස සිට දේවස්ථානය වෙත අගරදගුරු හිමිපාණන් කැඳවාගෙන ආ අයුරු.

ප්‍රේමා හීනටිගල

## නාත්තන්ඩියේ පාස්කුවට මහ විශාල ජනතාවක්!




නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ මහ සිකුරාදා දේව මෙහෙය ගරු ජූඩ් ඩයස් පියතුමන් විසින් පවත්වන ලදී. නාත්තන්ඩිය සිද්ධස්ථාන පාලක ගරු පිටර් උපාලි පියතුමාගේ මඟපෙන්වීම යටතේ ලූර්දු මාතා පාස්කු කමිටුව පාස්කු වැඩසටහන සංවිධානය කළේය. වසරින් වසර අලුත් යමක් පාස්කු වැඩසටහනට ඇතුළත් කිරිම නිසා මෙතෙක් මේ සිද්ධස්ථානයට එක්රැස් වූ විශාල ජනතාව මෙවර එක් රැස්වීම විශේෂ කරුණකි.

මෙවර ජේසුගේ ශ්‍රී ශරීරය අරමිතියාවේ ජෝශප් භාරගත් අවස්ථාව රඟදැක්වූ අතර මේ සඳහා මීසම් පාලක ගරු පීටර් උපාලි පියතුමා සමඟ සහයක ගරු දුමින්ද සුරේෂ් පියතුමා ද පාස්කු කමිටුව සමඟ අත්වැල් බැඳගෙන සහය දැක්විය.

ජූඩ් නිමල් බර්නාඩ්

# කිතු සමිඳාණන් විශ්මිත ප්‍රාතිහාර්යයන් කිරීමට යොමු කළ අචල විශ්වාසය



**මුළු කිතු දහමම විශ්වාසය මත පදනම් වූ දහමකි. පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ ආදි පිතෘ ආබ්‍රහම් සමඟ උන්වහන්සේගේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ද ඔහුගේ නොසැලෙන විශ්වාසය එහි පදනම කරගත් සේක.**



ඒ වන විට ආබ්‍රහම් ද ඔහුගේ බිරිඳ වූ සාරා ද බොහෝ වයස් ගතව සිටියහ. ආබ්‍රහම්ගේ වයස අවුරුදු සියයක් විය. එහෙත් ස්වාමින් වහන්සේට සියල්ල කළ හැකි බව පෙන්වීමට ආබ්‍රහම්ගේ ගැඹුරු විශ්වාසය මත දරුවකු ඉපදීමට සැලැස්වීය. ඔහුට ඊසාක් යන නම තැබීය. (උත්. 21:1-4).

එක් දිනක් දෙවියන් වහන්සේ ආබ්‍රහම් පරික්ෂා කරනු වස් ඔහුට කතා කොට ඔහුගේ එකම පුත්‍රයා වන ඊසාක් මොරියා දේශයට රැගෙන ගොස් උන්වහන්සේ පෙන්වන කන්ද මත දවන පූජාවක් ලෙස ඔප්පු කරන ලෙස ඔහුට දැන්වූ සේක. ආබ්‍රහම් ද එසේ ඔහු රැගෙන ගොස් පූජාසනයක් තනා තම පුතා එහි බැඳ දවන පූජාව කොට ඔප්පු කිරීමට තම පුතා මරනු වස් පිහිය එසවීය. එවිට ස්වාමින් වහන්සේගේ දූතයා ආබ්‍රහම්ට කතා කොට දරුවාට කිසි අනතුරක් නොකරන්න. ඔබ ඔබේ පුත්‍රයා මට පූජා කිරීමට තරම් දේව ගරුබිය ඇත්තෙකු යයි පැවසීය. ඉන්පසු ස්වාමින් වහන්සේගේ දූතයා දෙවෙනි වරටත් දර්ශනය වී ස්වාමින් වහන්සේ ඔබේ පුත්‍රයා, ඔබේ එකම පුත්‍රයා මට බිළි පූජාවක් කර දෙන්නට ඔබ විශ්වාසව ක්‍රියා කළ බැවින් ඔබට ආශිර්වාද කරමි. ඔබේ පෙළපත අහසේ තාරකා මෙන්ද වෙරළේ වැලි මෙන් ද වර්ධනය වෙන බවත් ඔබ නිසා ඔබේ පෙළපත ඔබ මඟින් සතුරන් පරදා රට හිමිකර ගන්නේ යයිද ස්වාමින් වහන්සේ පවසන සේකැයි කියූ සේක. (උත්. 22:15-18).

නව ගිවිසුමේ ද, ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත කාලයේ දී බොහෝ ප්‍රාතිහාර්යයන් කළ සේක. ඒ සෑම ප්‍රාතිහාර්යයක්ම කරනු ලැබුවේ ඊට සම්බන්ධ වූ අයගේ ගැඹුරු විශ්වාසය මතය. පහත දැක්වෙන ප්‍රාතිහාර්යයන් ගෙන් ඒ බව තහවුරු වේ.

01. දිනක් ජේසුස් වහන්සේ කපර්නාවුමට පිවිසුන සේක. "උන්වහන්සේ එහි සිටින බව සැළවූ විට දහම් ශ්‍රවනය කිරීමට බොහෝ දෙනෙක් පැමුණුනාහ. උන්වහන්සේ සිටි නිවස ජනයාගෙන් පිරී තිබුන අතර ගෙට ඇතුළුවීමට පවා කිසිදු ඉඩක් නොවීය. එවිට හතර දෙනෙක් එක් අංශබාග රෝගියකු ඇඳක තබා රැගෙන විත් ඇතුලු වීමට ඉඩ නොතිබූ නිසා වහලයට නැග පියස්ස ගලවා රෝගියාව ස්වාමින් වහන්සේ සිටි තැනට බැස්සවිය. ස්වාමින් වහන්සේ ඔවුන්ගේ ශ්‍රද්ධාව දැක "පුත්‍රය ඔබේ පවු ඔබට කමා කර තිබේ" යයි පැවසූ සේක. එවිට එහි සිටි විනයධරයන්ගෙන් සමහරෙක් මේ මිනිසා මෙසේ කතා කරන්නේ කුමක් නිසාද? පව් කමා කළ හැක්කේ දෙවියන් වහන්සේට පමණය. මෙය දේව අපහාසයකැයි ඔවුන් අතර තර්ක කළහ. එවිට ස්වාමින් වහන්සේ ඒ බව දැන ඔවුන්ට මෙසේ වදා සේක. "වඩා පහසු අංශබාග රෝගියාට ඔබේ පව් කමා කරන ලදැයි කීම ද, නැතහොත් නැගිට ඔබේ යහන රැගෙන යන්නැයි කීම ද" එහෙත් මනුෂ්‍ය පුත්‍රයාට මෙලොවේ දී පව් කමා කිරීමේ බලය ඇති බව දැනගනු පිණිස මම මෙසේ කරමි"යි කියා ඔවුන් වහන්සේ අංශබාග රෝගියාට කතා කොට "නැගිට ඔබේ යහන රැගෙන යන්න යැයි" පැවසූ සේක. එකෙණෙහිම ඔහු නැගිට පිරිස බලා සිටියදීම ඔහුගේ යහන රැගෙන යන්නට ගියේය. එහි සිටි සියල්ලෝම විශ්මපත්ව මෙවැන්නක් අප කිසිදිනෙක දැක නැතැයි දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ. (ශ. මාක් 2:2-12)

02. එසේම දිනක් ඔවුන් වහන්සේ දෙකාපොලිස් හි සිට ඔරුවෙන් එගොඩ වී මුහුදු වෙරළේ සිට දහම් දෙසන්ට විය. අති මහත් ජනකායක් එහි රැස්වී සිටියහ. එවිට දහම්ශාලා ප්‍රධානියෙක් ඔවුන් වහන්සේ වෙතට විත් මාගේ පුංචිදුව මරණාසන්නව සිටී. ඇය සුවය ලබා ජීවත්වනු පිණිස එහි විත් ඇය පිට ඔබේ අත තබනු මැනවයි ඉල්ලා සිටියේය. ජේසුස් වහන්සේ ඒ අනුව ඔහුගේ නිවසට වඩින අතරේ මහත් ජනකායක් තෙරපෙමින් ඔවුන් වහන්සේ සමඟ ගමන් කළහ.

03. ඒ යන අතරවාරයේ දොළොස් වසරක් මහා ලේ රෝගයෙන් පීඩා විඳින, කරන ලද ප්‍රතිකාර වලින් කිසිදු සුවයක් නොලැබූ ස්ත්‍රියක් ජනයා මැදින් පැමිණ ජේසුස් වහන්සේගේ වස්ත්‍රයට අත තැබුවහොත් තමා සුව වනු ඇතැයි ඒකාන්ත විශ්වාසයක් ඇය තුළ තිබූ නිසාය. ඇය ඔවුන් වහන්සේගේ වස්ත්‍රයට අත තැබූ කෙණෙහිම ඇය සුවය ලැබූ බව ඇයට ඇතුළාන්තයෙන් දැනුණි. එවිට තමන්ගෙන් අනුහසක් පිටවූ බව දත් ස්වාමින් වහන්සේ තමන්ගේ වස්ත්‍රයට අත තැබුවේ කවරෙක් දැයි අසළ වූ ගෝලයින්ගෙන් විමසීය. එවිට තමන් කළ දේ එළි වූ බව දැනගත් ස්ත්‍රිය, වෙවුල වෙවුලා අවුත් ඇත්ත හෙළි කළාය. එවිට ස්වාමින් වහන්සේ කතා කරමින්, "දියණිය ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේය. සාන්ත සිතින් යන්න. ඔබේ පීඩාවෙන් ඔබ මිදී වසන්නැ"යි පැවසූ සේක.

මෙසේ ගමන් කරන විට ධර්මශාලා ප්‍රධානියාගේ ගෙදරින් සමහරු විත් දරුවා මළ බවත්, ගුරු දේවයන්ට තවත් කරදර කරන්නේ මන්දැයි පැවසූහ. සමිඳාණන් වහන්සේ දහම් ශාලා නායකයාට කතා කොට "බිය නොවන්න, ශ්‍රද්ධාව ඇතුව සිටින්නැ"යි වදාළ සේක. සමිඳාණන් වහන්සේ අදාළ නිවසට ගොස් අඬන්නන් ද විලාපනගන්නන් ද ඉවත්කොට, පේදුරු, ජාකොබ් සහ ජොහාන්ද සමඟ ඇතුල් ගෙට පිවිස ඇය අතින් අල්ලා "තලිතාකුමි" යැයි පැවසීය. එහි අර්ථය නම් "දැරිය මම ඔබට කියමි, නැගිටින්න" යන්නය. එකෙණෙහිම ඇය නැගිට ඇවිද්දාය. මේ දුටු සියල්ලෝම මහත් විශ්මයකින් භ්‍රාන්ත වූහ (මාක් 5:21-43).

04. දිනක් ජේසුස් වහන්සේ කපර්නාවුම ඇතුල් වූ කල එක් ශතාධිපතියකු ගේ සේවකයකු මරණාසන්නව සිටි නිසා ඔහුගේ ජුදා මූලිකයින් කීපදෙනෙකු ස්වාමින් වහන්සේ වෙතට එවා පැමිණ ඔහුගේ සේවකයා සුව කර දෙන ලෙස ඉල්ලා සිටියේ ය. ස්වාමින් වහන්සේ ද ඔහුගේ ඉල්ලීම අනුව ශතාධිපතියාගේ නිවසට යන විට තවත් මිත්‍රයන් කීප දෙනෙකු එතුමන් වෙත පැමිණ ස්වාමින් වහන්සේ ඔහුගේ නිවසට පැමිණීමට ඕහු නොවටිනා බැවින් එහි ඒමට කරදර නොවී එක් වචනයක් පමණක් වදාළ මැනව. එවිට දාසයා සුවවේ යැයි පවසා සිටියේය. ස්වමින් වහන්සේ ඔහුගේ විශ්වාසය දැක මවිත වී පසු පසින් ආ ජනතාව වෙත හැරී මුළු ඉශ්රායෙල් ජනතාව අතරවත් මෙවැනි ශ්‍රද්ධාවක් දැක නැතැ"යි පැවසූ සේක. පණිවුඩකරුවන් හැරීගිය කල දාසයා සුව වී සිටියේය (ලූක් 7:2-10).

05. තවද සමිඳාණන් වහන්සේ ජෙරිකෝවට දහම් දෙසමින් ලඟා වූ විට පාර අද්දර සිඟාකමින් සිටි අන්ධයකු ස්වාමින් වහන්සේ ඒ ළඟින් වඩිනා බව අසා "ජේසුස් වහන්ස, දාවිත්ගේ පුත්‍රය මට අනුකම්පා කළ මැනැවැ"යි මොර ගැසීය. උන්වහන්සේ නැවතී ඔහු තමන් ළඟට කැඳවා, "මා කුමක් කරනවාට ඔබ කැමැති දැ"යි ඇසූ සේක. ඔහු පෙනීම දෙන ලෙස අයැද සිටියේය. ජේසුස් වහන්සේ කතා කරමින් "පෙනීම ලබන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේ යයි" පැවසූ සේක. එකෙණෙහිම ඔහු සුවපත් වී පෙනීම ලැබ දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ජේසුස් වහන්සේ පිටුපසින් ගියේය. මුළු සෙනඟම සිදුවූ දෙය දැක දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ (ශු. ලූක් 18 :35-43). ඉහත සඳහන් ප්‍රාතිහාර්යයන් මුළුමනින්ම අදාළ පුද්ගලයාගේ ගැඹුරු විශ්වාසය මත පදනම්ව කරන ලද ඒවා බව ඉතාම පැහැදිලිය. එපමණක් නොව, සමිඳාණන් වහන්සේ ද ඒ ඒ අවස්ථාවල දී ඒ බව ප්‍රකාශ කළ සේක. ★ කපර්නාවුම් නුවර නිවසේ දී වහලයෙන් බැස්සවූ අංශබාග රෝගියාගේ ආධාරකරුවන්ගේ ශ්‍රද්ධාව දුටු ජේසුස් වහන්සේ පළමුවෙන් රෝගියාගේ පව්කමා කර ඉන්පසුව අංශබාග රෝගය සුවකර යහනත් රැගෙන යන්ට සැලැස්වීය.

★ එසේම ධර්මශාලා ප්‍රධානියාගේ මරණාසන්නව සිටි දියණිය සුව කිරීමට යන අතරමඟ දි වසර දොළහක් ලේ මාලේ රෝගයෙන් පෙළුන ස්ත්‍රිය සුවය ලබාගත්තේ ද එක විශ්වාසයෙන් ස්වාමින් වහන්සේගේ වස්ත්‍රයේ වාටිය ස්පර්ශ කිරීමෙනි. ජේසුස් වහන්සේ කතා කළේ ද ඇය සුවය ලැබීමෙන් පසුවය.

★ දහම් ශාලා ප්‍රධානියාගේ නිවසට යන අතරවාරයේ දී රෝගී දියණිය මළ බව ඔහුගේ දාසයින් පෙරමඟට විත් දැන්වූ විට බිය නොවී විශ්වාසය ඇතිව සිටින්නැයි ධර්මශාලා ප්‍රධානියාට පවසා ඔහුගේ නිවසට ගොස් මැරී සිටි දියණිය සුවපත් කළ සේක. එහිදී ද ජේසුස් වහන්සේ ඉස්මතු කළේ ඔහුගේ අචල විශ්වාසය ය.

★ එසේම, ජෙරිකෝවේදී ශතාධිපතියාගේ සේවකයා සුවකිරීමට යන විට පෙරමඟට පැමිණි ඔහුගේ සේවකයින් තමාගේ නිවසට වැඩීමට තමන් නුසුදුසු බවත් එක් වචනයක් වදාරණ ලෙස ඉල්ලා සිටියේය. ස්වාමින් වහන්සේ ඔහුගේ මහත් විශ්වාසය දැක කොතරම් පැහැදුන සේක්ද යත් පිටුපසින් ආ ජනකාය වෙත හැරී මුළු ඉශ්රායෙල් ජනතාව අතරවත් එවැනි විශ්වාසයත් දැක නැතැ"යි පවසා අදාළ දාසයා සුවවීමට සැලැස්වීය.

☛ 15 පිටුවට

✍ ඩී. ඇන්ටනි වික්‍රමසිංහ
පමුණුගම

## දි.ස.නි. පැවිදි හවුලට පූජක පුතුන් දෙනමක්

දේව හඬට සවන් යොමුකර දිව්‍ය සත්ප්‍රසාදයීය දූත මෙහෙවර ලොව පුරා පතල කිරීම සඳහා ගරු අරුණ ලක්සිරි අත්තනායක දි.ස.නි. තේවාචාරි තුමා සහ උඩුගම්පලගේ චමින්ද රංජිත් ප්‍රනාන්දු දි.ස.නි. තේවාචාරිතුමන් වර්ෂ 2012 මැයි මස 5 වන සෙනසුරාදා පෙ.ව. 10.00 ට පිටකොටුව සා. පිලිප්නේරි දෙව් විමනේදී ගාලුපුර පදවි එඬේරාණන් වන අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් අතින් පූජකවරය ලැබීමට නියමිතය.

### ගරු අරුණ ලක්සිරි අත්තනායක සහෝදරතුමා



වග මීසමේ කන්දවත්ත ග්‍රාමයේ පදිංචි පී. බී. අත්තනායක සහ මේරි ටයිටස් රූපසිංහ යුවළට දාව වර්ෂ 1977 දෙසැම්බර් මස 30 වන දින ජන්මලාභය ලද මෙතුමා බොරළුගෙ ාඩ ශ්‍රී සිද්ධාර්ථ විදුහලින් සහ හංවැල්ල දොන් බොස්කෝ මහා විද්‍යාලයෙන් සිප්සතර හදාරා වර්ෂ 2001 මැයි මස දිව්‍ය සත්ප්‍රසාද නිකායේ කනිටු දෙව්සත්හලට ඇතුළු විය. එහිදී ප්‍රාථමික පූජක පුහුණුව නිමකර වර්ෂ 2003 දිව්‍ය සත්ප්‍රසාද නිකායේ ආධුනිකාරාමයට ඇතුළු වී පුරා වසර දෙකක් තුළ පැවදි පුහුණුවට පසුව එම නිකායේ පළමු වේදහාර පොරොන්දු දෙන ලදි.

ඉන් අනතුරුව ජාතික දෙව්සත්හලට ඇතුළු වී දර්ශනවාදය සහ දේව ධර්මය පිළිබඳ උසස් පාඨමාලාව හදාරා රෝමයේ උර්බානි සරසවියෙන් උපාධිය හිමිකර ගන්නා ලදි. වර්ෂ 2011 දිව්‍ය සත්ප්‍රසාද නිකායේ සදාතනික වේදහාර පොරොන්දු දී එම වර්ෂයේ දී ම තේවාචාර්යවරය ලබා ගන්නා ලදි.

තේවාචාර්යවරයකු වශයෙන් බණ්ඩිරිප්පුව ශු. ජපමාල දෙව්මැඳුරේ සහ පිටකොටුව සා. පිලිප්නේරි දෙව්මැඳුරේ සේවය කරන ලදි.

මෙතුමන් අතින් පිදෙන කුළුඳුල් දිව්‍ය යාගය මැයි මස 06 වන දා උදේ 8.30 වග මීසමේ මාවල්ගම ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී සිදු කරනු ලැබේ.

### ගරු චමින්ද රංජිත් ප්‍රනාන්දු සහෝදරතුමා



පාරම්පරික කතෝලික ධීවර ගම්මානයක් වන තොඩුවාව පදිංචි උඩුගම්පොලගේ කුවින්ටස් ප්‍රනාන්දු සහ වර්ණකුලසූරිය මේරි ජසින්තා ප්‍රනාන්දු යුවළට දාව එකම පුතු ලෙස 1978 සැප්තැම්බර් මස 11 වන දින මෙතුමා ජන්මලාභය ලැබීය.

තොඩුවාව ශු. අන්තෝනි මහා විදුහලින් සිප්සතර හදාරා වර්ෂ 2001 මැයි මස දිව්‍ය සත්ප්‍රසාදයීය නිකායට ඇතුළු විය. ප්‍රාථමික පුහුණුව නිමකළ මෙතුමා හංවැල්ල හල්ග ස්හේන පිහිටි දිව්‍ය සත්ප්‍රසාදිය නිකායේ ආධුනිකාරාමයේ පුරා වසර දෙකක කාලයක් තුළ පැවදි පුහුණුවක් ලබා වර්ෂ 2005 දිව්‍ය සත්ප්‍රසාද නිකායේ පැවදි වේදහාර පොරොන්දු ගන්නා ලදි.

එම වර්ෂයේ ඔක්තෝබර් මස මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුළු වී පුරා වසර 7 ක් තුළ දර්ශනවාදය සහ දේවධර්මවාදය පිළිබඳ උසස් අධ්‍යාපනය සාර්ථකව නිමකර රෝමයේ පිහිටි උර්බානු සසුන් පිය සරසවියෙන් පිදෙන උපාධිය හිමිකරගන්නා ලදි. ඉන් අනතුරුව වර්ෂ 2011 ඔක්තෝබර් මස දිව්‍ය සත්ප්‍රසාද නිකාය තුළ සදාතනික පැවදි වේදහාර සහ තේවාචාර්යධුරය ලැබ මාතලේ සා. තෝමස් දෙව්මැඳුරේ සහ අලගොල්ලෑව ශු. අන්තෝනි මුනිඳුන්ගේ මීසම් තුළ තේවාචාර්යවරයකු ලෙස සේවය කරන ලදි. තවද 2012 මැයි මස 13 වන ඉරුදින අදේ 7.30 තොඩුවාව සා. අන්තෝනි මුනි දෙව්මැඳුරේදී මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය පූජා යාගය සිදුකරනු ලැබේ.

**ගරු සුදත් ජයනාත් ප්‍රනාන්දු දි.ස.නි. පියතුමා**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

(පසුගිය සතිය හා සබැඳේ)

විශ්වාසයෙන් බලා සිටිමු. විශ්වාසයේ ආකල්පය ඇති දෙවියන් වහන්සේගේ මැදහත්වීම කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටීම බයිබලීය අධ්‍යාත්මිකත්වයෙහි ඉස්මතුවන කරුණකි. එය භාග්‍යවන්ත, ආනන්දජනක අත්දැකීමකි (යෙසායා 8:17)

**යැදුම :**
මේ ලෝකය සහ මිනිස් ජාතීන් මවා වදාළ ආදරයේ උල්පතවන දෙවි සමිඳාණන් වහන්ස, ඔබවහන්සේගේ ඉමහත් ආදරය හා රැකවරණයට අපි තුති පැසසුම් දෙමු. මේ ලෝකය තුළ ඔබවහන්සේ අපගේ ජීවිත හසුරුවමින් වර්ධනය කරා මෙහෙයවන අන්දම තේරුම් ගැනීමට අපට පිහිටවුව මැනව. ඔබ කෙරෙහි අචල විශ්වාසයෙන් ජීවිතයේ පෙරටම යාමට අපට පිහිටවුව මැනව.

## අපේ ආදර සිඟිති පුතුනි

තෙවසකුත්, සිව්මසක්
අපෙන් ආදරය ලැබ
අපට ආදරය දුන්
අපේ සෙනෙහෙ ලැබ
අපට සෙනෙහෙ දුන්
අපේ සුරතල් සිඟිති පුතුනි
ඉයන් මැතිව්....
මදුරුවකු වෙසින්
ඩෙංගු මාරයා අවුත්
අපෙන් ඔබව උදුරාගතී
සදහටම
අප අතර නැතත් අද ඔබ
ගොඩක් ආදරෙයි
අපි ඔබට තවම
අපේ සෙනෙහස
නොවෙනස්ව හිමියි
සැමදාමත් ඔබට....
සුරලොවේ සිට
සුරදූතයෙක් විලස
පිය දෙවිඳුගේ
සෙනෙහස්, ආදරය ලැබ
ඇරඹූ අමරණීය වූ දිවියට
සොව පිරුණු හදින්
ඔබට සුබ පතමි
අපේ ආදර සිඟිති පුතුනි
ඉයන් මැතිව්...

(අප ආදර පුත් ඉයන් මැතිව් පෙරේරා කුමරුගේ හදිසි වියෝවෙන් දෙමසක් ගතවීම නිමිත්තෙනි)

**යූ. අසේල පෙරේරා**
**කොරළවැල්ල - මොරටුව**

## අඟහරුවාදා සැඳෑ යාම යැදුම

### 20 වැනි ගීතය

මෙම ගීතය "රාජකීය ගී" කාණ්ඩයට අයත් වේ. දෙවි සමිඳාණන් වහන්සේගේ නියෝජිතයා ලෙස ක්‍රියා කරන රජු වෙනුවෙන් යුද පසුබිමකදී විශේෂ ආශිර්වාදය පතා කෙරෙන යාච්ඤාවක ස්වරූපය මෙහි ඇත. අර්බුදකාරී අවස්ථාවලදී විශේෂයෙන් යුද්ධමය තත්ත්වයකදී කෙරෙන මෙවැනි යැදුම් ශු. බයිබලීය ග්‍රන්ථ තුළ දිස්වේ (1 සාමුවෙල් 7:9, 1 රාජාවලිය 8:44). මෙහි භාෂාව තුළ පැරණි යුද සම්ප්‍රදා පිළිබඳ ලේඛන අංග ඇතුළත් වේ.

**ලේඛන සැලැස්ම**
වගන්ති 1 - 5 : රජතුමා වෙනුවෙන් විශේෂ යැදුම
වගන්ති 6 - 8 : සමිඳාණන් වෙතින් ලැබෙන නියත ජයග්‍රහණය ගැන ඇදහිල්ලේ ප්‍රකාශය
වගන්ති 9 : රජතුමා වෙනුවෙන් මැදහත්වීමේ යැදුම

**විග්‍රහය**
(අ) ව. 1 - 5 :
මෙම ගීතය දෙව්මැඳුර තුළ ගායනා කරනු ලැබූ විට, එය මෙහෙයවනු ලැබුවේ ලෙවී සාම්ප්‍රදායික ජනවන්දනා කණ්ඩායමක් විසිනි. තවද රජතුමාගේ සුරක්ෂිත භාවය වෙනුවෙන් කෙරුණු ආයාචනා හා විශේෂ යැදුම් මාලාවක් එහි දිස්වේ. මෙම කොටස අවසානයෙහි ජනතාවගේ සුබ පැතීමේ අරමුණ ද අපට නිරීක්ෂණය කළ හැකිය.

විපත්ති දවසේ දී : යුද පසුබිමක දී සතුරු ප්‍රහාර මැද රජතුමාගේ රැකවරණය වෙනුවෙන් දෙවි සමිඳාණන් වහන්සේ වෙත යොමුවන යාදින්නක විලාසයක් මෙහි දිස්වේ (ගීතා 18:6).

ජාකොබ්ගේ දෙවිඳාණෝ ඔබට බලකොටුවක් වන සේක්වා: හෙබ්‍රෙව් පිටපත අනුව "ජාකොබ්ගේ දෙවිඳාණන්ගේ නාමය" යන යෙදුම අපට දැකිය හැකිය. "නාමය" සංකේතවත් කරන්නේ

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(11)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

කෙනෙකුගේ අනන්‍යතාවයි. ශුද්ධස්ථානයේ වැඩ වසමින් ජනතාවට රැකවරණය සලසන දෙවි සමිඳුන්ගේ අනන්‍යතාව ඉන් පෙන්නුම් කෙරේ. (ගීතා 44:5, 54:8). "ජාකොබ්ගේ දෙවිඳාණන්" යන යෙදුම ද ශු. බයිබලය තුළ දෙවියන් වහන්සේ භාවිත වුණු යෙදෙන ඉපැරණි යෙදුමකි. උන්වහන්සේ ආදි පිතුරුවරුනට දුන් පොරොන්දු දේව ජනතාව නිතර සිහිපත් කළහ (නික්මයාම 3:6, ගීතා 46:11).

(ආ) ව. 6 - 8
මෙහි දැක්වෙන්නේ ජනවන්දනා පිළිවෙතේ දෙවෙනි කොටසය. මෙම පිළිවෙත මෙහෙයවන්නා දෙවි ස්වාමින් වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ආයාචනයන් කෙරෙහි දක්වන කාරුණික ප්‍රතිචාරය අවධාරණාත්මකව ප්‍රකාශ කරයි.

මුදන බව දනිමි : මෙය විශ්වාසයේ අත්දැකීම මතු කොට දක්වන ප්‍රකාශයකි. සමිඳුන් නිරතුරුව ඇදහිලිවන්තයාට සංවේදීව සවන් දෙන සේක (ගීතා 6:9). ඊශ්‍රායෙල් ආගමික පැවැතීම තුළ පෙන්නුම් කෙරෙන මෙම විශ්වාසයේ ආකල්පය ජනවන්දනා පිළිවෙත් තුළ නිතර දිස්වන්නේය (ගීතා 56:9, 140:12).

අබිසෙස් ලද : හෙබ්‍රෙව් භාෂාවෙන් යෙදෙන "මෂියා" යන වදන පරිවර්තනය වන්නේ "ආලේප කරන ලද තැනැත්තා" යනුවෙනි. එය රජවරුන් සඳහා යෙදුනු අන්දම බයිබලීය සම්ප්‍රදායන් පෙන්වා දෙයි (1 සාමු. 24:6, ගීතා 2:2).

සිය දකුණතේ විමුක්ති ශක්තියෙන් : දෙවියන් වහන්සේ මිනිස් ජන දිවිය තුළ සිදුකරන දේ අනාවරණය කරන්නේ උන්වහන්සේගේ බලයයි. දේව ජනතාව නිරතුරු විපත්ති අවස්ථාවන්ට මුහුණ දුන් විට දෙවි සමිඳාණන් වහන්සේ මැදිහත්ව ඔවුනට රැකවරණය සැලසූ අන්දම මෙම වැකියෙන් සිහිපත් කෙරෙන්නේ ය. (යෙසායා 63:12-13, ද්විතිය 3:24, ගීතා 71:15).

යුද රිය අශ්වයන් : පුරාතන ලෝකයේ පැවති යුද සම්ප්‍රදායන් මේ යෙදුම් වලින් අපට සිහිපත් කෙරේ. පැරණි ශිෂ්ටාචාරයක් වූ අසිරියානු, ඊජිප්තු වැනි ශිෂ්ටාචාරවල යුද සංග්‍රාම ක්‍රම පිළිබඳ යම් යම් තොරතුරු බයිබලීය කතා පුවත්වල දිස්වේ (යෙසායා 31:1).

දෙවි සමිඳුන් කෙරෙහි : හෙබ්‍රෙව් පිටපතට අනුව "දෙවි සමිඳුන්ගේ නාමය කෙරෙහි" යනුවෙන් දැක්වේ. ගැලවීමේ ඉතිහාසය තුළ බොහෝ අය දෙවි සමිඳාණන් වෙතින් ශක්තිය ලබා ජයගත් අන්දම දිස්වේ (උදා : දාවිත්. ගොලියත් පරාජය කිරීම ( 1 සාමුවෙල් 17).

(ඇ) ව. 97: මේ වැකිය සැදැහැවතුන්ගේ වන්දනා පිළිවෙතේ අවසන් යැදුම සේ දිස්වේ. එය මුල් යැදුම මෙන් දෙවි සමිඳාණන්ගේ ආශිර්වාදය රජු වෙත ලබා දීම සඳහා යොමුවන ආයාචනයකි.

**යැදුම :**
සකල විශ්වය ද මුළු මානව සංහතිය ද මවා වදාළ දෙවි පියාණන් වහන්ස, ඔබවහන්සේ අප වෙත දක්වන නිරන්තර රැකවරණය වෙනුවෙන් ඔබවහන්සේට තුති පැසසුම් පුද කරමු. දෛනික දිවිය තුළ වඩ වඩා ඔබවහන්සේ වෙත විශ්වාසයෙන් යොමු වෙමු. අපගේ දුර්වලකම්වල දී හා අභියෝගදායක අවස්ථාවන්හි අප රැකබලාගෙන දිවි ගමනෙහි මඟ පෙන්නුව මැනව.

**ලබන සතියට ....**

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 31

## නික්මයාම පොත



**පසුගිය සතිය හා සබැඳේ**

එබැවින් ක්‍රි. පූ. 1250 පමණ කාලයේ, පීඩිත ජනතාවගේ උද්ඝෝෂණ බෙහෙවින් උත්සන්නව මිසරයේ දේශපාලනික ස්ථාවරය අඩපණව තිබූ අවධියක නික්මයාම සිදුවී ඇතැයි සිතිය හැකිය.

1 රාජාවලිය 6/1 ඉදිරිපත් කරන කාල වකවානුව සංකේතාත්මකව පැහැදිලි කර ඇත. විශාරදයන් අතර පොදු පිළිගැනීම වනුයේ, නික්මයාම සිදුවූ නිශ්චිත දිනය රාජාවලියේ කතුවරයා දැන නොසිටි බැවින් ඔහු සංකේතාත්මක සංඛ්‍යාවක් හඳුන්වා දුන් බවය. එය 12 හා 40 යන සංඛ්‍යාවල ඵලයවේ. මේවා ඉශ්‍රායෙල්වරුනට වැදගත්වූ සංඛ්‍යාවන් විය. එමෙන්ම, එවකට ජනතාව අතර වූ සාමාන්‍ය පිළිගැනීම ද මෙය වන්නට ඇත.

පළමුවන පරිච්ජේදය ආරම්භ වන්නේ, මිසරයේ පදිංචියට පැමිණ සිටි ජාකොබ්ගේ දරුවන්ගේ නම් සඳහන් කිරිමත් සමගය. මෙය ඉදිරිපත් කෙරෙන්නේ දෙවියන් වහන්සේ ආදීපිතුරුවරුනට දුන් පොරොන්දු ඉටුවීමක් ලෙසය. එනම් ඔවුන්ගෙන් මහා පෙළපතක් ඇතිවන බවට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුවය. "එහෙත් ඉශ්‍රායෙල් ජනයා සමෘද්ධ වී බොහෝ සේ වර්ධනය වී ගණනින්ද වැඩිවී අතිශයින් බලවත් වුයෙන්, ඔවුන්ගෙන් රට පිරී ගියේය" (නික්ම 1:7) මෙම සාධකයට ඔවුන්ගේ පීඩිත තත්ත්වයට හේතුවක් සපයයි. තවද, ඔවුන් හික්සොස්වරුන් හා සංස්කෘතිකව නෑ සබඳතා දැක්වීමද මෙම පීඩිත තත්ත්වයට මුල්වූ තවත් හේතුවක්ද වෙයි. ජෝසෙප්ගේ කථාන්තර සාමාන්‍යයෙන් තේරුම් ගනු ලබන්නේ හික්සොස් යුගය ආශ්‍රිතව වන බැවින් ජෝසප් නොදත් අලුත් රජ කෙනෙක් යන්න හික්සොස් වරුන් සම්බන්ධයෙන් තේරුම් ගත යුතුය. තවද ඊශ්‍රායෙල් වරුන්ගේ පීඩිත තත්ත්වයට වෙනත් හේතුවක් වන්නේ අගනුවර ගොඩනැගීම සඳහා දෙවන රාමසෙස්ට මිනිස් ශ්‍රමයම අවශ්‍ය වීමයි.

පිරිමි දරුවන් මරණයට පත් කිරීම පිළිබඳ ගැටළුද මෙම වෘත්තාන්තයෙහි දක්නට ලැබේ. ජනගහනය සීමා කිරීමට රාමෙසෙස් රජතුමාට වුවමනාවී නම් තම අරමුණ ඉටු කර ගැනීම සඳහා එය යෝග්‍ය පියවරක් නොවනු ඇත. බොහෝ දෙනා එය තේරුම් කරන්නේ ඊජිප්තුවේ පීඩිත පංතිවලින් ඇති කරන ලද කැරලිකාර තත්වයන් පාලනය කිරීමට ගත් පියවරක් ලෙසටය.

මේ නයින් බලන කල නික්මයාම පොත ආගමික ඉතිහාස කථාවක් බව පැහැදිළිය. එනම් ඓතිහාසික සිද්ධීන්, පුද්ගලයන් හා දින වකවානු විශ්වාසයේ දෘෂ්ඨියකින් අර්ථකථනය කිරීමකි.

### 2. දූත මෙහෙවර සඳහා මෝසෙස් සූදානම් කරනු ලැබීම

**මෝසෙස්ගේ උපත**

මෝසෙස්ගේ උපත මෙන්ම, ඔහු මිසර දේශයෙන් පළා යාමද පිළිබඳව පළමුවන පරිච්ජේදයේ සාකච්ඡා කෙරේ. මෝසෙස්ගේ උපත පිළිබඳ මෙම කථා පුවත ප්‍රධාන වශයෙන් ඔහුගේ නම පැහැදිලි කිරීම සඳහා බව පෙනේ. මෝසෙස් යන වචනය හෙබ්‍රෙව් මුලාශ්‍රයකින් මතුවන නාමයක් නොවේ. (එය මිසර නාමයකි. එහි අර්ථය කෙනෙකුගෙන් උපත ලත් යන්නය.) ඉශ්‍රායෙල්වරු මෙම නාමය බෙහෙවින් ජනප්‍රිය ආකාරයකින් පැහැදිලි කළහ. එනම් "දියෙන් ගොඩ ගත්" යනුවෙනි. මෙම වෘත්තාන්තය බෙහෙවින් වැදගත් වෙනත් කරුණක්ද පෙන්නුම් කරයි. එනම්, පාරාවෝ ඉදිරිපිට මැදහත්කරුවකු ලෙස පෙනී සිටීමේ තත්ත්වයක් මෝසෙස් සතු විමයි. එලෙස මෝසෙස් හදා වඩා ගනු ලබන්නේ පාරාවෝගේ දියණියක විසිනි.

මෝසෙස් ජලයෙන් බේරා ගැනිමේ කථාවට සමාන්තර පුරාතන කථා පුවතක්ද පළමුවන සාර්ගොන් නම්වූ අකේඩියානු අධිරාජ්‍යයා සම්බන්ධවද දක්නට ලැබේ. එහෙත් එහි පසුබිම හා අරමුණ බෙහෙවින් වෙනස්ය.

**මෝසෙස් මිසර දේශයෙන් පළා යාම**

මෝසෙස්ගේ පළා යාමට පාදක වූ හේතුව වනුයේ දෙවියන් වහන්සේ ඔහු වෙත දානය කිරීමට නියමිතවූ විශේෂ කැඳවීම ලබා ගැනීමය. ඉශ්‍රායෙල් ජාතිකයකුට දරුණු ලෙස පහර දුන් මිසර නිළධාරියා මෝසෙස් විසින් මරා දැමීමේ සිද්ධියෙන් තම ජනතාව වෙත මෝසෙස්

තුළ වූ ආදරය විශේෂාකාරයකින් පෙන්නුම් කෙෙ

**මෝසෙස්ගේ කැඳවීම 3/1- 4/17**

මෝසෙස්ගේ කැඳවීම ඉදිරිපත් කෙරෙන්නේ දිවැසිවර කැඳවීමක ස්වරූපයෙනි. එයට හේතු මෙලෙස දැක්විය හැකිය. පළමුවෙන් "සමිඳාණන් වහන්සේ මුහුණට මුහුණ ලා ඇඳින ගත් මෝසෙස්ට සමාන දිවැසිවරයෙක් ඉන්පසු ඉශ්‍රායෙල්වරුන් අතර තවත් නොවිය. යනුවෙන් ද්වි.නි. 34/10 හි සඳහන්වේ. මෙයින් දැක්වෙනුයේ දිවැසිවරුන් අතර ශ්‍රේෂ්ඨතම දිවැසිවරයා මෝසෙස් ලෙස පිළිගත් ඉශ්‍රායෙලීය සම්ප්‍රදායයයි.

(තවත් කොටසක් ලබන සතියේ...)

## 2012 දේව වචනයේ වසර - උත්ථාන සමයේ සිව්වන ඉරුදින

**තේමාව -**

**ක්‍රිස්තුන් වහන්සේ අපගේ එඬේරා ද ගැලවීමේ එකම මාර්ගයද වන සේක.**

**පළමුවෙනි කියවීම : ක්‍රියා 4:8-12**

අබ්බගාත මනුෂ්‍යයකු සුව කිරීම සම්බන්ධයෙන් විමසනු ලැබූ පේදුරු තුමා ජෙරුසලෙම් ජුදා මන්ත්‍රණ සභාවට පවසන්නේ එම මනුෂ්‍යයා සුව කරනු ලැබුවේ උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් බවය. එ නිසාම ගැලවීම ලැබිය හැක්කේ උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන පමණක් බව එතුමා ජුදා මන්ත්‍රණ සභාවට අවධාරණය කරයි.

**දෙවන කියවීම : 1 ජොහාන් 3:1-2**

දෙවියන් වහන්සේ අප උදෙසා දක්වන අසීමිත ප්‍රේමය හේතුකොටගෙන අප උන්වහන්සේගේ දරුවන් බව ජොහාන් තුමා පවසයි. යම් දවසක දී අප උන්වහන්සේ මුහුණට මුහුණලා දර්ශනය කිරීමට අපට දී ඇති සහතිකය මෙය වේ. දේව දරුකමට අප පත් වන්නේ දෙවියන් වහන්සේගේ ඒක ජනිත පුත්‍රයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ මඟින් ය.



**ශුභාරංචිය : ජොහාන් 10:11-18**

එඬේරා යන සංකල්පය තුළ කරුණු තුනක් අන්තර්ගතය. එනම් බැටළුවන් පෝෂණය කිරීමත්, ඔවුන්ට මඟ පෙන්වීමත් හා ඔවුන් රැකබලා ගැනීමත්ය. යහපත් එඬේරා වන ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ හඳුන්වා දෙන්නේ උන්වහන්සේ සිය පියාණන් හඳුනන ලෙසට සිය බැටළුවන් හඳුනන බවත් ඔවුන්ද උන්වහන්සේ හඳුනන බවත් ඔවුන් උදෙසා සිය ජීවිතය පූජා කරන බවත් පවසමින් ය. සිය රැළට අයිති නොවන බැටළුවන් ද එම රැළට ගෙන ඒම උන්වහන්සේ සතු යුතුකමක් ලෙසට ද දක්වන සේක.




**මෙනෙහි කිරීම**

ජේසුස් වහන්සේ සිය දූත මෙහෙවරේදීම මෙන්ම උත්ථානයෙන් පසුත් ක්‍රියාකාරීව සිටින බවට සාක්ෂි දැරීමට අප සූදානම් ද? අප ජීවිත වෙනස් කළ හැකි උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ යම් තරමකටවත් ඔබ අත්දැක ඇත්ද? ඇදහිල්ල, බෞතිස්මය හා දිව්‍ය සත්ප්‍රසාදය මඟින් උත්ථාන වූ දේවපුත්‍ර ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඒකාබද්ධ වූවෙමු. එමනිසා අපගේ දේව පුත්‍රභාවය සෙවිය යුත්තේ ඉහත සඳහන් කරුණු තුළය.

එඬේරාගේ භූමිකාව යම් තරමකටවත් රඟපාන අපි අවම වශයෙන් ඉහත සඳහන් එඬේරාසතු කාර්යයන් තුන අප යටතේ සිටින අය උදෙසා ක්‍රියාත්මක කිරීමද සූදානම් දැයි සොයා බැලීම අවශ්‍ය නොවේ.

# ආගමික සමගිය උදෙසා අගරු දෑ කළ යුතු ද ?

**කතුතුමනි,**

පසුගිය වසරේදී කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ නිර්දේශය හා අනුමතිය පරිදි වෙසක් උත්සවය ඇතුළු සෙසු බහු ආගමික උත්සවයන් වලදී සිදුකෙරෙන සැරසිලි, සිරිත් විරිත් හා සම්ප්‍රදායන් කතෝලික දේවස්ථාන හා ආයතන තුළ සිදු නොකළ යුතු බවට නිර්දේශ කරන ලදි. එනමුදු මේ පිළිබඳව අපි තවමත් හරියාකාර දැනුමක් හෝ දැනුවත් වීමක් නොලබා ඇත්තෙමු. බහුආගමික, බහුසංස්කෘතික සමාජයක් හා වටපිටාවක් තුළ වෙසෙන සුළුතරයක් වූ කතෝලික ජනපූජාව තුළ මෙකී සිරිත් විරිත් සිදුකිරීම නිවැරදි දැයි මෙහිදී පැනයක් නැගේ.

අද අපගේ කතෝලික ප්‍රදේශවල දෙව්මැඳුරුවල හා පාසල් වල බොහෝ විට වෙසක් උත්සවය අරභයා පහන් කූඩු, පහන්, සැරසිලි. තොරණ, දන්සැල් යනාදි..... දේ සංවිධානය කරනු දක්නට ලැබේ. මෙවැනි විටකදි බෞද්ධ ධජය අගෞරවනීයත්වයට ලක් කරමින්, ඊට නිසි තැනක් නොදෙනු ද, දන්සල් වැනි දේවල් තුළ කා, බී, ජොලි කරන පිරිස් ද බොහෝමයක් දක්නට ලැබේ. මෙවැනි දේවල් දුටු කල්හි අප ඒ ඒ ආගම් වලට කරන ගෞරවනීයත්වය හා අගෞරවනීයත්වය මැනවින් ඉස්මතු වේ. බහුආගමික, බහුසංස්කෘතික වටපිටාවක් තුළ වෙසෙන කිතුනු පූජාවක් ලෙස අප සෙසු ආගම්වලට ග රුකළ යුතුය. එහි ආගමික නායකයන් අතර සුහදතාවය වැඩිවර්ධනය කර ගත යුතුය. දේශයේ මෙන්ම සමාජීය යහපත උදෙසා මැනවින් ක්‍රියා කළ යුතුය. මෙහි දී බෞද්ධ දර්ශනයට හා සංස්කෘතියට අනුව වෙසක් වැනි උත්සව වල ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජා යන දෙවර්ගයම අයත්වේ. ආමිස පූජා යනු බාහිර පූජාවේ. ප්‍රතිපත්ති පූජා යනු දිවි මඟ එක්කරගනිමින්, දිවිය වෙනස් කරගන්නට කැඳවනු ලබන සුවිශේෂී දායාදයකි. මෙහිදි මෙම බාහිර පිළිවෙත් වලට මෙකී තොරණ, දන්සැල්, සැරසිලි යනාදිය අයත් වන අතර මෙකී ආමිස පූජාවන්ට අපද සහයෝගය දැක්වීමෙන් හා සිදුකිරීමෙන් අපගේ බෞද්ධ සොයුරු සොයුරියන්ට සිදුකරන අසාධාරණයන් ලෙස දැක්විය හැක. තවද වෙසක් වනාහි ජාතික උත්සවයක් නොවේ. එය ආගමික උත්සවයකි. භක්ති ගීත, සැරසිලි, දන්සල් කතෝලික විද්‍යාලවල හා ආයතනවල සිදුකිරීමෙන් අප අපගේ අනන්‍යතාවය පසෙකලා සිදුකරලීමක් ලෙස ද දැක්විය හැක. ලාංකේය කිතුනු අපට උරුම වී ඇති අපගේ උත්තරීතර සංස්කෘතික දායාද පවතියි. ඒවා හැකි තරම් දුරට අපගේ අනාගත මෙන්ම වත්මන් පරපුර වෙත දායාද කිරීම අප සතු උරුමයකි. වත්මන් පාසල් පද්ධතිය අප වෙත ලැබී තිබෙන තොරතුරු අනුව ඇතැම් විදුහල්පතිවරු, ගුරුවරුන්ගේ අභිමතයන් පරිදි මෙකී බහුආගමික සංස්කෘතික වටිනාකම් ඉස්මතු කරන ආකාරයක් දක්නට ලැබේ. තවද අග නුවරට නුදුරු එක්තරා පෞද්ගලික පාසලක පාසලේ මුනිවර දිනය වෙනුවට බෞද්ධ ගුරුවරුන්ගේ අභිලාෂය පරිදි වෙසක් පිංකම් එදින සංවිධානය කරන ආකාරයක් ද අපහට දැනගන්නට ලැබී ඇත. මේ ලිපියෙහිලා මා විසින් කිසිදු ආගමකට අගෞරවයක් හෝ අපකීර්තියක් සිදුනොකරමි. වෙසක් උත්සවය ප්‍රමුඛ සෙසු ආගමික උත්සව තුළින් කිතුනු අපට ඉගෙන ගැනීමට හා අධ්‍යයනය කිරීමට බොහෝ කරුණු කාරණා පවති. වඩා වැදගත් වනුයේ බාහිර මෙන් පුහු ආටෝපයන්ට ජනතාව යොමුකිරීම, සංවිධානය කිරීම නොව ප්‍රතිපත්තිමය වශයෙන් දිවියට අන්තර්ගත විය යුතු දේවල් කරා ජනතාව හුරුපුරුදු කිරීමය. මෙහිදී දන්සල් වැනි දේවල් තුළින් බොහෝ ස්ථානවල බෞද්ධකොඩිය අපකීර්තියට පත්වේ. ආවාට ගියාට? වාහන නවත්වන්නට...... යනාදි ලෙස දන්සල් වල යොදා ගන්නේ මෙම බොදුනු පූජනීය ධජයයි. මෙහිදී වෙසක් කූඩු, පහන් පූජාව හා තොරණ තුළින් නිරූපනය කරන්නේ බොදු සිරිතයි. ඇතැම් අවස්ථාවල මේවාට වැඳුම් පිදුම් කරන අවස්ථාද අප දැක ඇත්තෙමු. එම නිසා කතෝලිකයන් වන අප මේවාට අනුබල දීම මෙවැනි පරයා යන ආකාරයක් ද දිස්වේ. තවද අපගේ උතුම් මංගල්‍යයන් වන පාස්කු හා නත්තල් වෙනුවෙන් මෙවැනි සංවිධානය කිරීම් සිදු කෙරෙත්ද? යන ප්‍රශ්නයක් මෙහිදී නැගේ. මහසිකුරාදාට උපවාස බිදීමට පිපාසයට සිසිල් බීම වීදුරුවක් හෝ නොදෙන කතෝලිකයෝ, සම්මාදම් වලින් ද, මාස ගණනක සූදානමින් ද වෙසක් උත්සවය අරභයා බත්, සිසිල් බීම, අයිස්ක්‍රීම්..... යනාදි දේ පුහුආටෝපයට ලබාදෙනු දක්නට ලැබේ. මෙහිදී කිතුනු අපේ උතුම් දායාදයක් ලෙස පාස්කු මංගල්‍යය හෝ නත්තල් මංගල්‍යය අරභයා දිළිඳු පවුල් වෙත, මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ආධාර උපකාර රහසිගතව ලබාදීම සිදුකළ යුතු නොවන්නේද? එම නිසා සෙසු ආගම් වලට ගරු කරන ලාංකේය කිතුනුවන් ලෙස අපගේ කිතුනු අනන්‍යතාවයන් පළුදු කර නොගෙන සියල්ලන් හා සමයාන්තර සංහිඳියාව ගොඩනඟමින් රට දැය, සමාජය ගොඩ නැගිය යුත්තෙමු.

**අසේල දසනායක**
රාගම්මුල්ල

# නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය විටින් විට අක්‍රියවීම දේව ශාපයක්ද?

**කතුතුමනි,**

ස්වර්ගස්ථවූ ගරු ප්‍රැන්ක් මාකස් හිමිපාණෝ නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය ඉදිකිරීමට විරුද්ධව ප්‍රසිද්ධියේ ප්‍රකාශයන් කළහ. එකල පැවති රජයට මෙම කරුණ සම්බන්ධව බලවත්සේ විරුද්ධ වූ අතර කතෝලික ජනතාවද උන්වහන්සේ සමඟ වීදි බැස කළුකොඩි ඔසවා විරෝධතාවය ප්‍රකාශ කරන ලදී. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීමෙන් තලවිල සිද්ධස්ථානයට බලවත් ලෙස හානි සිදුවන බවත්, පරිසර හානි සිදුවන බවත් උන්වහන්සේ කරුණු සහිතව පෙන්වා දුන්හ. ඉංජිනේරුවන්ගේ මතද, වෙනත් ඉංජිනේරු සමාගම්වල මතද හේතු සාධක සහිතව ශාසන සේවක මණ්ඩලයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. මේ නිසා ගල් අඟුරු බලාගාරය ඉදිකිරීමේ වැඩකටයුතු බොහෝ දුරට ප්‍රමාද විය. කතෝලික මැති ඇමැතිවරුද මෙයට විරුද්ධව සිටියත් තනතුරු ඉදිරියේ ඒ සියල්ල පාවා දුන්හ. කතෝලිකයන්ගේ සහ ප්‍රදේශවාසීන්ගේ විරෝධතා මධ්‍යයේ පසුකාලීනව බලාගාරය ක්‍රියාත්මක විය.

එය විවෘත කිරීමේ සිට මේ දක්වා හරිහැටි ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. විවෘතකළ මෙම කෙටිකාලය තුළදී එහි යම් යම් අක්‍රීයතාවයන් ඇතිවී දවස් ගණන් සති ගණන් විදුලිය ඇණහිටින ලදි. එහි පාලනාධිකාරයද විටින් විට මාරු වූ බවක් ද කියැවේ. මෙම අක්‍රීයතාවය පිළිබඳ නොයෙක් මත ජනතාව තුළ පැතිර යමින් පවතී. සමහරුන්ගේ විශ්වාසය නම් නොපෙනෙන බලයක් නිසා මෙම තත්ත්වය උදාවී ඇති බවයි.

**ක්‍රිස්ටෝපර් ජාන්ස්**
රාජකදළුව

# මිරිස්වත්ත දෙව්මැඳුරු බිම අන්‍යාගමික භූමියක් වෙයිද?

**කතුතුමනි,**

මිරිස් වත්ත ශු. ආනා මුණිවරියගේ දෙව් මැඳුරට ඇත්තේ සියවසකට එපිට ඉතිහාසයකි. එම භූමියේ ඉදිකර ඇති ගොඩනැගිලි අතරින් 1936 ඉදිකරන ලද ලෝකා ලෝක විද්‍යාලය කිතුනු සභාවට අයිතිවූ පාසලකි එය කොළඹ නුවර පාරට මුහුණලා පිහිටි අතර අනිකුත් පාසල දෙව්මැඳුර ඉදිරිපිට ගම්පහ පාරට මුහුණලා පිහිටා ඇත. මේ දෙකම කැප්පෙටි පොළ ප්‍රාථමික විදුහල් නමින් පවත්වාගෙන යයි. මෙම පාසල් දෙකේ දරුවන් හා දෙමව්පියන්ගෙන් මෙම දෙව්මැඳුරේ නේවාසික පියතුමාට විශාල කරදර සිදුවෙන අතර පියතුමාගේ අධ්‍යාත්මික කටයුතු වලට බාධාවක් සිදුවන බැවින් දෙව්මැඳුර උදේ කාලයේ විවෘතව තැබීමට බැරිය. ඊට ප්‍රධාන හේතුව පාසලට ළමයි රැගෙන එන දෙමව්පියන් දරුවන් පාසලට ඇතලුකර දෙව්මැඳුරේ ඉදිරි පසත් පියතුමාගේ ලැගුම් ගෘහය අවටත් රැඳී සිටීමයි. මෙම ප්‍රශ්නය පිළිබඳව පාසල් ප්‍රධානීන් දැනුවත් කළත් කිසි පලක් නැත.

පෝයට පෙර දින දෙව්මැඳුරු බිමේ ශබ්ද විකාශන යොදා වැඩසටහන් පැවත්වීම. දෙව් මැඳුර ඉදිරිපිට පෙරහර පැවැත්වීම වැනි දේ නිසා දෙව් මැඳුරු බිම අනාගතයේ දී වෙනත් ආගමික කටයුතු වලට යොදා ගැනීමේ අනතුරක් පවතී. මේ බැරෑරුම් ප්‍රශ්නය ගැන හිටපු මීසම් සේවක පියතුමාද ධර්මසේවා සභාවේ සාමාජිකයන් සමඟ එක්ව විසඳුම් සොයන්න ගත් උත්සහය එතුමා වෙනත් මීසමකට මාරු වී යෑමෙන් අඩාලවිය. ඊට පසු ප්‍රශ්නය යටපත්වූ අතර දැන් නැවතත් මේ ක්‍රියාකාරකම් වැඩිවී ඇත.

මේ ගැන වර්තමාන මීසම් සේවක ගරු ජූඩ් සුරාජ් පොන්සේකා පියතුමා ධර්මසේවා සභාව සමඟ මැදිහත්ව ඇත. සභා පාලකයන්ගේ අවධානයට මේ බැරෑරුම් ප්‍රශ්නය යොමුවේවායි මීසම් වාසී අපි බලාපොරොත්තුවෙමු.

**බෙනඩික් මුණසිංහ**
මිරිස්වත්ත

# සුදුසු තැනට සුදුසු දේ අඳිමු පළඳිමු

**කතුතුමනි,**

ජේසුන් ක්‍රිස්තුන් වහන්සේ දිව්‍ය පූජය තුළ වැඩිසිටින සේක. එය අපගේ විශ්වාසයයි. දේවස්ථානය ශුද්ධ වු ස්ථානයකි. අද නව පරපුර නොයෙකුත් විලාසිතා රැගෙන දේවස්ථානය වෙත ඇදී එන්නේ තමන්ගේ විලාසිතාව ඔවුන්ගේම වචනයෙන් කිවහොත් 'පැෂන්' එක ප්‍රදර්ශනය කිරීමට මිස ජේසු සමිඳාණන් වෙනුවෙන් භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගී වීමට නොවේ. දෙව්මැඳුරකට මෙවැනි විකෘති විලාසිතා නොගැලපෙන බව අමුතුවෙන් කිව යුතු නොවේ. විශේෂයෙන් තරුණ පරපුර ටීෂර්ට්, කමිස වැනි තද වර්ණයෙන් යුත් ඇඳුමෙන් සැරසී එන විට දිව්‍ය පූජාවේ සිටින සෙසු සැදැහැවතුන්ට බාධා ඇති වේ.

දිව්‍ය පූජා යාගයේ දී අප සිත් යොමු විය යුත්තේ දෙවියන් වහන්සේ වෙතටයි. නමුත් මෙවන් දේ නිසා අපගේ සිත් එක්තැන් කර ගැනීමට අපහසුයි. ඇඳුම් පැළඳුම් වල තිබෙන රූපවලට සැදැහැවතුන්ගේ සිත යොමුවීමට ද පුළුවනී. තමන්ගේ ගරුත්වය තබා ගැනීම කාන්තාව සතු වගකීමකි. දිව්‍ය පූජා යාගයට නුසුදුසු ලෙස කිසිදු හිරිකිතයකින් තොරව තමාගේ අඩ වත නිරූපණය කිරීම ඇත්තෙන්ම කිතුනු අපට කණගාටු දායකයි. මෙවන් පාපතර ක්‍රියාවලීන් දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජීවමාන ජේසුන් වහන්සේගේ සිත රිදෙනවා නොඅනුමානයි. සැදැහැවත් ජනයාත් මෙවැනි අවස්ථාවලදී සිතින් පාපයට වැටෙන අවස්ථා එමටයි. දේවස්ථානයේ දී තව තවත් පව් පුරවාගැනීමක් සිදුවේ. ශුද්ධ ස්ථානයකට සුදුසු චාම් සරල ඇඳුමකින් සැරසීම වඩාත්ම යෝග්‍යයි.

තමාගේ ජංගම දුරකථනය ද පැයකට හෝ විසන්ධි කරගැනීමට බැරි කමක් නොමැත. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට අපගේ උතුම් වන්දනාවත්, ගරුත්වයත්, මහිමයත්, ප්‍රශංසාවත් හිමිවිය යුතු නොවේ ද? දිව්‍ය ජේසුව ලබාගැනීමේ දී තමාගේ පාවහන් පටි ගලවා දණ හොවා ජීවමාන ජේසුන් වහන්සේව ලබාගන්නේ නම් කොපමණ ගරුත්වයක් ද? කාලයත් සමඟ කතෝලික අපගේ සිරිත් විරිත් ගිලිහී යති. කිතුනු අපගේ සිරිත් හැටියට අපි මෙවන් උතුම් දේ ගිලිහී යාමට ඉඩ නොදෙමු.

විලාසිතා වැනි නොයෙකුත් අපේ සංස්කෘතියට නොගැළපෙන විකෘති දේ අප දෙව්මැඳුරුවලට නුසුදුසු බැවින් ඒවා වළක්වා ගැනීමට උත්සාහ කරමු. ගරු පියතුමන් මාර්ගයෙන් තම තමන්ගේ දේවස්ථානවල මෙවැනි දේ වළක්වාගැනීමට විශේෂ වැඩසටහන් දියත් කරනමෙන් මම ඉල්ලා සිටිමි.

**බී. ඒ. මනෝජ් දිවංක**
බණ්ඩාරවෙල

# ගබ්සාව නීතිගත කිරීම මිනීමැරීමට අනුමතිය දීමක් !

**කතුතුමනි,**

අංගවිකල දරුවන් බිහිවීම වැලැක්වීම කියා හෝ අවිවාහක තරුණියන් වෙතින් දරුවන් බිහිවීම වැලැක්වීම කියා හෝ කුමන හෝ ගබ්සාවක් සිදුකිරීමට අනුමැතියදීම මිනීමැරීමට ප්‍රසිද්ධියේම අනුමැතිය දීමකි. මේ පිළිබඳව අගරදගුරු තුමන් ඇතුළු රදගුරුතුමන්ලා කණ්ඩායමක් පසුගියදා විශේෂ මාධ්‍ය හමුවක්ද කැඳවා ප්‍රකාශයක්ද නිකුත් කර තිබුණි. එහිදීද එතුමන්ලා එම කවරාකාර හෝ පනතක් සම්මත කිරීමෙන් සිදුවන විනාශය ගැන කරුණු ඉදිරිපත් කර තිබුණු අතර ඊට එකහෙලාම විරුද්ධත්වය ප්‍රකාශ කර තිබුණි.

අද ඇතැම් අංග විකල දරුවන් උසස් අධ්‍යාපනය ලබා ඉංජිනේරු, වෛද්‍ය වැනි වෘත්තීන්හි මෙන්ම කලා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතා ඇති අයද සිටින අතර මෑතකදීද අංගවිකල දරුවෙක් අපොස (සාපෙළ) ඉතා උසස් අන්දමින් සමත්වීමක් ගැන වාර්තා විය. එමෙන්ම අංගවිකල ලෙසින් හෝ පූර්ණ මිනිසකු ලෙසින් හෝ මෙලොව එළිය ලැබීමට මව් කුස පිළිසිඳ ගන්නා සෑම දරුවකුටම අයිතියක් තිබිය යුතුය. එය කිසි ලෙසකින් හෝ වැලැක්වීම හෝ වැලැක්වීමට ක්‍රියාකිරීම සාපරාධි ක්‍රියාවක් වන අතර මිනී මැරීමක් බව කිව යුතුය. තරුණියක් හෝ කාන්තාවක් හෝ ගැබ් ගත් විට කවර හේතුවක් නිසා හෝ එම ගැබ විනාශ නොකළ යුතුය. එම කලලය ප්‍රාණයකි. කෙසේවෙතත් අවිවාහක තරුණියන් විවාහ වනතෙක් ආරක්ෂාවී සිටීමට තමන් දැනගත යුතුය. ඒ සඳහා වන දේශනා, සාකච්ඡා, රූපවාහිනියෙන්ද විකාශය වන අතර ලිංගික විෂය පිළිබඳ පොත් පත්ද ඇතැම් ආයතනයන් වෙතින් නිකුත් කර ඇත. විශේෂයෙන් අදාල තරුණියන් සඳහා වැඩමුළු සංවිධානය කර ඔවුන් දැනුවත් කිරීමට ආගමික අංශ හෝ සමාජ සේවය දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ නම් මැනවි. මේ පිළිබඳව වගකිව යුතු අංශවල අවධානය යොමුවිය යුතුය.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත



# දේව කැඳවීම සහ දිව්‍ය සත්ප්‍රසාදය

විශ්ව දේව කැඳවීම් දිනය පවත්වන අද දින, දේව කැඳවීම (පූජකවරය සඳහා කැඳවීම) සහ දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති නෛතික සම්බන්ධතාවය පිළිබඳ අදහස් කිහිපයක් ගොනු කිරීම මෙම කෙටි ලිපියේ අරමුණයි. ප්‍රථමයෙන්ම අප වටහා ගත යුතු කාරණය වන්නේ දේව කැඳවීම මනුෂ්‍ය ජීවිතයේ හැම ක්ෂේත්‍රයකටම සම්බන්ධ වෙන බවයි. දෙවියන් වහන්සේ මුලින්ම මිනිසා හෝ ගැහැනිය කැඳවන්නේ "හිස්බවින්" "පැවැත්ම" වෙතටයි. දෙවෙනුව ඔහුට හෝ ඇයට කැඳවීමක් ලැබෙනුයේ මිනිස් දිවියක් ගතකිරීමටයි. තෙවනුව උන්වහන්සේ අපව කැඳවන්නේ කතෝලික විශ්වාසය වෙතටයි. අවසාන වශයෙන් උන්වහන්සේ මිනිසා හා ගැහැනිය කැඳවන්නේ පූජකවරය හෝ විවාහ ජීවිතය වෙතයි.

දෙවෙනුව අප වටහාගත යුතු කාරණය් වන්නේ දෛනික ජීවිතය තුළ මිනිසා හෝ ගැහැනිය විවිධ ක්ෂේත්‍රයන් තුළ සේවාව සඳහා කැඳවනු ලබන බවයි. කෙනෙක් වෛද්‍ය සේවයට ද තවකෙක් හෙදි සේවයට ද, කෙනෙක් ගුරු සේවයට ද තවකෙක් සමාජ සේවයට ද, කෙනෙක් අත්‍යවශ්‍ය සේවයට ද, තවකෙක් අවශේෂ සේවයට ද, කෙනෙක් උසස් යැයි සැලකෙන සේවයට ද, තවකෙක් සුළු සේවයට ද කැඳවනු ලබයි. සේවාවන් විවිධ වූවත් එකිනෙකට වෙනස් වූවත් ඒ හැමෙකක්ම මිනිස් සමාජයේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ.

උදාහරණයක් ලෙස කුණු කසල එකතු කිරීම සේවා ස්ථරයේ පහළම ඇති එතරම් උසස් යැයි නොසැලකෙන ගණයේ සේවාවකි. එහෙත් නිව්යෝර්ක් නගරය තුළ, මෙම කුණු කසල එකතු කරන්නන් දවසක එක වරුවක් පමණක් සිය සේවාව ලබා නොදුනහොත් (වර්ජනය කළොත්) හවස වන විට මුළු නිව්යෝර්ක් නගරයම ගඳ ගසන්නට පටන් ගනී. ඒ තරමට ඒ සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්ව ඇත.

මේ පසුබිම තුළ දේව සේවය සඳහා විශේෂිත වූ පිරිසකට ලැබෙන දේව කැඳවීම සුවිශේෂ කැඳවීමකි. එය දෙවියන් වහන්සේගේ ත්‍යාගශීලිබවේ තිළිණයක් හැටියට ලැබෙන කැඳවීමකි. ඒ කැඳවීම ලැබීමට කිසිවකුට අයිතියක් නැත.

භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා විසින් එතුමාගේ පූජකවරයේ පනස්වන සංවත්සරය පැවැත්වූ අවස්ථාවේ "Gift and mystery" යන නමින් පොතක් නිකුත් කරන ලදි. එහිදී එතුමා දේව කැඳවීම හඳුන්වන්නේ තිළිණයක් හා අභිරහසක් වශයෙනි. දෙවියන් වහන්සේ කිසියම් පුද්ගලයකු පූජාප්‍රසාදිවරයකු වීමට කැඳවන්නේ ඇයිද යන්න අපගේ මනසින් වටහා ගැනීමට අපහසුයි. එය දෙවියන් වහන්සේගෙන් එ තැනැත්තාට ලැබෙන විශේෂ තිළිණයකි. එය අපගේ මනසින් වටහාගත නොහැකි අභිරහසකි.

අප අමතක නොකළ යුතු වැදගත් කරුණක් නම් ස්වාමින් වහන්සේ ක්‍රියාත්මක වන්නේ ස්වභාවික දේවල් තුළින් බව සිහි තබා ගැනීමයි. උදාහරණයක් ලෙස නතානියෙල් ක්‍රිස්තුන් වහන්සේ සොයා ගියේ කුතහලය නිසයි; ජුවාම්ගේ ජාකොබ්ගේ මවට අවශ්‍ය වුනේ ඔවුන්ව ස්වාමින් වහන්සේගේ රාජ්‍යයේ උසස් තැන්වල රඳවන්නයි.

අවශ්‍ය වන්නේ කෙලෙසද කැඳවීම ලැබුණේ නැතිනම් ලැබෙන්නේ යන්න ගැන සොයන එකට වඩා ඇයිද කැඳවීමක් ලැබුණේ කියා සොයාගන්න එකයි. එම ප්‍රශ්නයට ඇත්තේ එකම එක පිළිතුරයි. ඒ පිළිතුර නම් ස්වාමින් වහන්සේම පමණක් දන්නා හේතුවක් හෝ හේතුන් නිසා වන බවයි. කිසියම් තැනැත්තකුට කැඳවීමක් ලැබුණේ ඇයිද යන්නට පිළිතුරු දන්නේ ස්වාමින් වහන්සේ පමණි.

කැඳවීම ලත් තැනැත්තාගේ යුතුකම වන්නේ ඒ කැඳවීමට අවංකව ප්‍රතිචාරය දැක්වීමයි. උන්වහන්සේ තමාට දුන් කැඳවීම ස්තුති පූර්වකව භාර ගෙන, උන්වහන්සේ වෙනුවෙන් පමණක් ජීවත් වීමයි. උන්වහන්සේගේ ප්‍රේමයට තමාව වැළඳගැනීම සඳහා ඉඩදීමයි. "මා පසුපස එන්න. මම ඔබ මිනිසුන් දිනන්නන් කරන්නෙමි." එසේ නම් දේව කැඳවීම ලත් තැනැත්තාගේ අරමුණ ඉලක්කය විය යුත්තේ දේව සේවය වෙනුවෙන් මුළුමනින්ම කැපවීමයි.

මෙම උත්තරීතර කැඳවීම හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති නෛතික සම්බන්ධතාවය අවබෝධ කර ගැනීමට අප දැන් උත්සාහ කරමු.

කතෝලික ධර්මය හා එහි පැවැත්ම ගැන කතා කිරීමේ දී දිව්‍ය සත්ප්‍රසාදීය සත්‍යතාවය කතෝලික පූජකවරයට බෙහෙවින් වැදගත් වේ. "දිව්‍ය සත්ප්‍රසාදයේ සක්‍රමේන්තුව ගැන කථා නොකර පූජකවරයක් ගැන කතා කළ නොහැකිය. ඒ තරමට දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරය අතර සමීප සම්බන්ධතාවයක් පවතී." (බලන්න, විලියම් ඉවාන්ස් ලියනාරච්චි, "දිව්‍ය සත්ප්‍රසාදය සහ පූජකවරය, "දිව්‍ය සත්ප්‍රසාදය : විවිධ පැතිකඩ" පිටු 79 - 86)

දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරය යනු සක්‍රමේන්තු ස්ථාපිත කළ මහ බ්‍රහස්පතින්දා දින අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ දී ක්‍රිස්තුන් වහන්සේ පූප රැගෙන ආශිර්වාදය පවසා, එය කඩා, සිය ශ්‍රාවකයන්ට දෙමින් පැවසුවේ "මේ මාගේ ශරීරයයි" රැගෙන අනුභව කරන්න." මිදි රස කුසලානය පිළිගන්වමින් උන්වහන්සේ පැවසුවේ "මේ මාගේ රුධිරයයි. රැගෙන පානය කරන්න." ඉන්පසු උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටියේ "මා සිහිකිරීම පිණිස මෙය සිදුකරන්න" කියායි.

"මා සිහිවීම පිණිස මෙය සිදුකරන්න" ශුද්ධවූ බයිබලය තුළ "සිහිකිරීෘම" යන සංකල්පයේ පසුබිම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ මෙම ඉල්ලීම අපට වටහා ගත හැකිය. "සිහිකිරීම" යන සංකල්පයේ සාමාන්‍ය අර්ථය මනසට සිහි කැඳවීමකි. ඒ අනුව සිහිගැන්වීමේ ක්‍රියාව තුළ, අතීතයට සම්බන්ධ වූ දෙයක්, පුද්ගලයෙක් ස්ථානයක් හෝ සිද්ධියක් අපගේ මනසේ අපි මවා ගනිමු. උදාහරණයක් ලෙස පෙර වසරේ පාසල් නිවාඩුව තුළ මා ගිය විනෝද චාරිකාව තුළ සිදු වූ දේ. මේ වසරේ විනෝද චාරිකාව යන අවස්ථාවේ මා නැවත පුනරාවර්තනයක යෙදෙමි. එහෙත් ජුදෙව් සන්දර්භය තුළ (ඒ මිනිසා බයිබලය තුළ) සිහිකිරීම පැවැත්ම මානසික අභ්‍යාසයන් නොවේ. එය මනසට සීමා වූ දෙයක් නොව ක්‍රියාවකට සම්බන්ධ වූ දෙයකි. උදාහරණයක් හැටියට දකුණේ සොරා ස්වාමින් වහන්සේගෙන් ඉල්ලූ ඉල්ලීම "ජේසුස් වහන්ස ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කළ මා සිහි කළ මැනව. (ලූක් 23:42). සඳහන් කළ හැකිය. මෙහි දී එම සොරාගේ ඉල්ලීම වන්නේ හුදෙක් මනසින් පමණක් සිහිකිරීමක් නොවන වග ඉතාම පැහැදිලිය. ඔහුගේ ඉල්ලීම වන්නේ ක්‍රියාව තුළින් සිහිකිරීමකි. එවන් සිහිකිරීමක් තුළ ඔහුට යහපතක් සිදුවේ යැයි ඔහු අපේක්ෂා කරයි.

මේ පසුබිම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ වචන අපට අවබෝධ කරගත හැකිය. එම වචනවල පැහැදිලි අර්ථය වන්නේ "අනාගතයේ දී ඔබ මෙය සිදුකරන කොයි මොහොතේ දී හෝ ඔබ කරනා දෙය තුළ මා සිහි කරන්න. මා කළ දේ කිරීම තුළින් මා සිහි කරන්න" එසේ නම් ක්‍රිස්තුන් වහන්සේගේ පැතුම තම ශ්‍රාවකයන් විසින් උන්වහන්සේ සිහිපත් කළ යුත්තේ ක්‍රිස්තුන් වහන්සේ කළ දේ කිරීමෙනුයි. එසේනම් අප කළ යුත්තේ එකට එකතු වී, අප එකිනෙකා අතර පූප සහ මිදියුෂ බෙදා ගැනීමයි. දිව්‍ය සත්ප්‍රසාදය සිදු කරන විට අප එය පිළිවෙතක් ලෙස හා ජනවන්දනාවේ ක්‍රියාවක් ලෙස සිදුකරනු ලබයි.

එසේම මෙම නියෝගයට තවත් ගැඹුරු අර්ථයක් ඇත. ක්‍රිස්තුන් වහන්සේ පවසන්නේ උන්වහන්සේ ශ්‍රාවකයන් සමඟ බෙදාගන්නා මෙම පූප උන්වහන්සේගේ ශරීරය බවයි. කුමක්ද එහි අර්ථය? එනම් තමා මුළුමනින්ම දීමයි. "ඔබ උදෙසා පුද දෙනු ලබන..." පූප සමඟ පුද දෙනු ලබන්නේ උන්වහන්සේවමයි. එම පූප ජනතාව වෙනුවෙන් පිදුන යාගයේ සළකුණකි. සක්‍රමේන්තුවකි. එසේම "ඔබ වෙනුවෙන් වගුරුවන ලද රුධිරය" යන්නෙන් අර්ථයත් එලෙසය. ජීවිතය පිහිටා ඇත්තේ රුධියතුළ බව ජුදෙව්වරු විශ්වාස කළහ. (බලන්න ලෙවි 17:15). එම නිසා රුධිරය වැගිරීම යනු තම ජීවිතය පුද කිරීමයි. ඔබ බෙදා ගන්නා මිදි යුෂ, මා පූජා කළ ජීවිතයේ සළකුණකි. සක්‍රමේන්තුවකි.

මේ නයින් බලන කල ක්‍රිස්තුන් වහන්සේගේ නියමයේ අර්ථය වන්නේ ජනතාව වෙනුවෙන් පුදකරන ලද උන්වහන්සේගේ ජීවිත යාගයයි. අවසාන රාත්‍රි භෝජනය තුළ උන්වහන්සේ පැවසූ වදන් උන්වහන්සේගේ මුළු ජීවිතයම සාරාංශකොට දක්වයි : එනම් ජනතාවගේ පහසුව පිණිස උන්වහන්සේගේ වචන සහ ක්‍රියා, තීරණයන් සහ කැපවීමය. ඒ උන්වහන්සේ ගත කළ පරිත්‍යාගයේ ජීවිතයයි. එහි උච්චස්ථානය වන්නේ කුරුසියේ පිදූ යාගයයි.

උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටින්නේ, පූප සහ මිදියුෂ බෙදා ගැනීම තුළ ඉන් සංකේතවත් වන එම පරිත්‍යාගයට, එම යාගයට හවුල් වන්නටයි. අන් අය වෙනුවෙන් කැප වෙන්නට, වැය වෙන්නට හා මැරෙන්නටයි. උන්වහන්සේට මුළුමනින්ම නතු වන්නටයි. පූජකවරය සඳහා වූ උත්තරීතර දේව කැඳවීම ලැබෙන්නේ අන්න එවැනි ජීවිත කැපවීමකටය. පූජකවරය යනු ජීවිතය පූජා කිරීමයි. දිව්‍ය සත්ප්‍රසාදය ද එවැනි ජීවිත යාග යකි. එසේ නම් දේව කැඳවීම හා දිවය සත්ප්‍රසාදය සහතිකවම එකින් එකට සම්බන්ධ වේ. දිව්‍ය සත්ප්‍රසාදය යනු කුරුසියේ අසමසම යාගය සිහිකරන සහ පරිස්මරණය කරන සක්‍රමේන්තු යාගයයි. ජේසුස් වහන්සේගේ මරණය එහි නැවත සිදු නොවේ (රෝම 6:9). එහෙත් කඩන පූපය සහ බෙදා ගන්නා මිදියුෂ යන සළකුණු මඟින් උන්වහන්සේගේ මරණය සිහිකරනු ලැබේ. උන්වහන්සේ අන්තිම රාත්‍රි භෝජනයේ කළ දෙයින් ද, එම මරණයම සංකේතාත්මකව කලින් දැන්වීය. එහෙයින් දිව්‍ය සත්ප්‍රසාදය ජේසුස් වහන්සේගේ විශිෂ්ට ජීවිත පූජා කිරීමේ සක්‍රමේන්තුවයි. එම සක්‍රමේන්තුව සිදු කරනු ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් පෙනී සිටින, උන්වහන්සේගේ තැන ගන්නා පූජාප්‍රසාදි තුමායි. මෙලෙසින් දේව කැඳවීම හා දිව්‍ය සත්ප්‍රසාදයේ ඇති කිට්ටු සබැඳියාව තවදුරටත් සහතික වේ.

දිව්‍ය සත්ප්‍රසාද යාගය තුළ දිව රහස් කරන අවස්ථාවේදී පූප සහ මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය හා රුධිරය බවට පරිවර්තනය වේ. දිව රහස් කිරීම තුළ, වලංගු ලෙස පූජකවරය ලත් තැනැත්තෙක් "මේ මාගේ ශරීරය, මේ මාගේ රුධිරය" යැයි ප්‍රකාශ කරන විට ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය මත මෙම පරිවර්තනය සිදුවේ. මෙය අප හඳුන්වන්නේ "භාවාර්ථ පරිවර්තනය" ලෙසයි. මෙතැන සිදුවන්නේ ඇස් බැන්දුමක් නොවේ. පියතුමා එම වචන ප්‍රකාශ කරන විට, ඔහු ක්‍රියා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උපකරණයක් ලෙසයි. එය සිදුවන්නේ තමාගේ බලයෙන් නොව, ක්‍රිස්තුන් වහන්සේගේ සේවකයා ලෙස උන්වහන්සේගේ නාමයෙන් සිදුවන දේව බලය නිසාය. එම නිසා මෙම පරිවර්තනය සිදුවන්නේ දේව බලයෙනි. එය ස්වාභාවික නැත. එය ස්වභාවිකත්වය ඉක්මවා යන බලයකි. එය දේව ක්‍රියාකාරිත්වය මතම සිදුවන දෙයකි.

පූජාප්‍රසාදිතුමා විසින් මෙම ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් හා උන්වහන්සේ තුළය. (In Persona Christi) මෙහිදී පූජාප්‍රසාදිතුමා ක්‍රිස්තුන් වහන්සේ සමඟ තමා අනන්‍යකර ගනී. දිව්‍ය පූජාව අවස්ථාවේ පූජාප්‍රසාදිතුමා පවසන්නේ "මේ මාගේ ශරීරයයි. මේ මාගේ රුධිරයයි" මිස "මේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයයි.", "මේ ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයයි." කියා නොවේ. පූජකවරය තුළ දිව්‍ය සත්ප්‍රසාදයේ ගැඹුරුතම සම්බන්ධය පවතින්නේ එතැනයි.

පූප සහ මිදි රස ස්වාමින් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හරවන ශුද්ධවන්ත කිරීමේ හා ප්‍රේමයේ අභිරහස සහ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය, පූජාත්වරය සක්‍රමේන්තුව දානය කරනු ලබන අවස්ථාවේ පූජකවරය ලබන තැනැත්තා තුළ ක්‍රියාකාරී වේ. දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරය අතර එකිනෙක මත සිදුවන විශේෂ ක්‍රියාකාරිත්වයක් ඇත. මෙම ක්‍රියාකාරිත්වය අන්තිම රාත්‍රි භෝජනය සිදුවන "උඩු මහල" කරා දිව යයි. මෙම සක්‍රමේන්තු යුගලය උපත ලද්දේ එකටයි. එසේම එහි ගමනාන්තය ද ලෝක අවසානය සමඟ ස්ථිර ලෙස බැඳී ඇත.

පූජකවරය උපදින්නේ දිව්‍ය සත්ප්‍රසාදය තුළිනි. සකල සාන්ත සභාව පවතින්නේ දිව්‍ය සත්ප්‍රසාදය තුළින් බව අපට සත්‍ය වශයෙන්ම පැවසිය හැකිනම් ඒ සත්‍යතාවයම පූජකවරය සඳහා ද වලංගු වේ. (බලන්න - ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව xxii සැසිවාරය DS 1752). ඉහත දී අප සඳහන් කළ Gift and mystery යන කෘතියේ භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා සඳහන් කරන ආකාරයට "පූජකවරයෙන් තොරව දිව්‍ය සත්ප්‍රසාදයක් නොතිබිය හැකිවාසේම, දිව්‍ය සත්ප්‍රසාදයෙන් තොරව පූජකවරයක් ද පැවතිය නොහැකිය" (පිටු 77 - 78).

උක්ත කරුණු වලට අනුව දේව කැඳවීම් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඉතා පැහැදිලි නෛතික සම්බන්ධතාවයක් ඇති වග මනාව ඔප්පු වේ. අවසාන වශයෙන් පැවසිය හැක්කේ දේව කැඳවීම හඳුනාගත හැකි වන්නේ යහපත් පවුල් පසුබිමක් තුළින් බවයි. යහපත් පවුල් පසුබිමක් සැකසෙන්නේ යාච්ඤා දිවිය හරහා ය. යාච්ඤා දිවියේ කේන්ද්‍රස්ථානය විය යුත්තේ දිව්‍ය සත්ප්‍රසාදයයි. එසේ නම් දේව කැඳවීම හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් ඇති බව සක් සුදක් සේ අපට පැහැදිලිය.

**ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා**
ජාතික දෙව්සත්හල - අම්පිටිය

# ඔබව ව
# උන්වහ
## අති උතුම් 

### ආදරණීය පූජක පුතුනි,

**Presbyterorum Ordinis** හෙවත් පූජාප්‍රසාදිතුමන්ගේ දූත සේවාව සහ ජීවිතය පිළිබඳ දෙවන වතිකාන කතිකා ප්‍රකාශනය, පූජකවරය හඳුන්වා දෙන්නේ මෙසේය: "ශුද්ධවූ පූජකවරය ප්‍රදානය මඟින් සහ තම රාජගුරුප්‍රසාදි වහන්සේගෙන් ඔවුන් ලබන දූත සේවාව මඟින්, පූජාප්‍රසාදිතුමන් ව ගුරුතුමාණන් ද, පූජකවරයාණන්සහ රජතුමාණන් ද වන ක්‍රිස්තුන් වහන්සේගේ සේවාවට උසස් කරනු ලැබේ. දේව ජනතාව, ක්‍රිස්තු දේහය සහ ශුද්ධාත්මයාණන්ගේ දේව මන්දිරය ලෙස මිහිපිට සාන්ත සභාව අඛණ්ඩව ගොඩනැගීමේ උන්වහන්සේගේ දූත සේවාවට ඔවුහු පංගුකාරයෝ වෙති." මේනයින් බලන කල, ආදර පියවරුනි, ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේගේ නොමැකෙන ලාංඡනයෙන් සලකුණු කරනු ලබන සහ මෙල්කිසදෙක් ගේ පරපුරේ උත්තම පූජකවරයාණන් වන ස්වාමින් වහන්සේගේ පූජාප්‍රසාදිතුමන් ලෙස ආලේප කරනු ලබන අද දින ඔබ ලබාගන්නා තිළිණයන්ගේ වටිනාකම සහ ගරුත්වය පිළිබඳව සහ අනාගතයේ දී ඔබ විසින් ප්‍රතිචාර දැක්විය යුතු දූත සේවාවේ ඉල්ලීම් පිළිබඳව මේ මොහොතේ දී මෙනෙහි කිරීම වැදගත් වන බව මාගේ හැඟීමයි.

ක්‍රිස්තුන් වහන්සේගේම දූත සේවාවේ අංගයන් වන ගුරුවර, පූජකවර සහ රාජකීය යන තෙවැදෑරුම් කාර්යභාරය අද පටන් ඔබේම කාර්යභාරය බවට පත් වේ. ඉහත අප ගෙන හැර පෑ Presbyterorum Ordinis ප්‍රකාශනයේ උපුටා දැක්වීම සඳහන් කළ පරිදි ඔබ මත අපගේ දෑත් තැබීම මඟින්, ක්‍රිස්තුන් වහන්සේගේ තෙවැදෑරුම් දූත සේවාව ඔබේම කාලය සහ සන්දර්භය තුළ ඉටු කිරීම සඳහා සාන්ත සභාවේම සේවාව වෙත ඔබව ස්ථාපනය කරනු ලැබේ. එම නිසා ඇත්තෙන්ම ඔබ ලබාගන්නේ ක්‍රිස්තුන් වහන්සේගේම දූත සේවාව මිස ඔබගේම දූත සේවාව නොවන බව නිරන්තරයෙන්ම සිහියේ තබා ගැනීම වැදගත් වේ. එම අවබෝධය එක් අතෙකින් ඔබට ඔබගේ සේවාව සඳහා උපකාරි වන දැඩි ආත්ම විශ්වාසයක් ලබා දිය යුතු අතරම අනෙක් අතින් ඔබ තුළින් සහ ඔබ මඟින් තමන් වහන්සේගේ ම දූත සේවාව ඉටු කර ගැනීමේ ස්වාමින් වහන්සේගේ ම විධි ක්‍රමය ලෙස ඔබට විඳින්නට සිදුවිය හැකි විවිධාකාරයේ දුක් වේදනාවන් නිහතමානීව බාර ගැනීමට ඔබව පෙළඹවිය යුතුවේ.

### ක්‍රිස්තුන් වහන්සේ සමඟ සහභාගිත්වයට කැඳවීම

එය එසේ වන නිසා, ඔබගේ දූත සේවාව තුළින් ඔබ මත පවරනු ලබන වැදගත් ම ඉල්ලීම වන්නේ ඉතා සමීපව සහ ගැඹුරින් ස්වාමින් වහන්සේ සමඟ ඒකාබද්ධ වීමය. ඇත්ත වශයෙන්ම ඔබගේ දිනපතා මූලික තෝරාගැනීම, වෙනත් විධියකින් කියන්නේ නම්, ඔබගේ බිම් මට්ටමේ මනාපය විය යුත්තේ එයය. ඔබ ශ්‍රේෂ්ඨ දේ කිරීම හෝ ප්‍රාතිහාර්ය බඳු දේ සිදුකිරීම හෝ ස්වාමින් වහන්සේට අවශ්‍ය වන්නේ නැත. උන්වහන්සේට අවශ්‍ය වන්නේ, ඔබගේ ජීවිතය තුළින්

කලා සංග්‍රහය

# ප්‍රජා අයිතිය අහිමි කළ සුනිල් සාන්ත

**හෙළ සගයුවෙහි නව මඟක් සනිටුහන් කළ ගීත කෝකිලයා දැයට බිහිවීම හා සමුගැනීම බක් මාසය තුළදී ම සිදුවීම සුවිශේෂ සිදුවීමකි. 1915 අප්‍රේල් 14 පමුණුගම, සෙත්තප්පාඩුවේදී උපත ලබා අනතුරුව ජාඇල, දෙහියාගාත පදිංචිව සිට අවසන් සමයේ රාජගිරියේ ජීවත් ව 1981 අප්‍රේල් 11 දින සිය හඬ නිහඬ කළේය. ඒ ජෝශප් ජෝන් නමින් බෞතිස්ම ලැබූ සුනිල් සාන්ත නමින් හැඳින්වූ හෙළ ගීතයේ පෙරග මන්කරුවාය සුනිල් සාන්ත. එම ප්‍රිය ජනක නම සවන් වැකුණු සැනින් කෙනකු තුළ මැවෙන විවිධ සිතුවම් පෙළකි.**

ඒ වනවිටත් හින්දුස්ථානේ සංගීතයට නැඹුරුව තිබූ අපේ සංගීතය හා ගීත කලාව එම අගාධයෙන් මුදවා ගෙන අපේකම නිවැරදිව හෙළි පෙහෙළි කළ, උඩුගං බලා ගිය යුග පුරුෂයෙක්. රූ සපුවෙන් ග්‍රීක දෙවියකු බඳු, කඩවසම් සිරුරින් යුතු මහා පෞරුෂයක් ඇති පුද්ගලයෙක්, බස නිසි ලෙස නිවැරදිව, හසුරුවමින්, උසුරුවමින්, ගැඹුරු හඬින් ගී ගයා රසිකයන් මන්මත් කළ ගායකයෙක්. තමා යන මඟ නිවැරදිය යන දැඩි ආස්ථානයෙහි පිහිටා මියන තෙක් පිළිවෙත් නොසිඳීම ඔහුගේ උතුම් ගුණයයි. ඔහු පිළිබඳ මා ප්‍රිය කළ විශිෂ්ට ගුණාංගය නම් ඔහුගේ ප්‍රතිපත්ති ගරුකත්වයයි. මෙවන් පුද්ගලයන් වැඩි වැඩියෙන් බිහි විය යුතු අත්‍යවශ්‍ය මොහොතක සුනිල් සාන්ත අනුගාමිකයන් තුළවත් එම ගති ස්වභාවයන් වගා කරගෙන නොතිබීම ශෝචනීය තත්ත්වයකි.

ඕළු පිපීලා, වෙළ ලෙල දෙනවා, හඳපානේ, හඳපානේ ලංකා ලංකා පෙම්බර ලංකා, බෝවිටියා දං පළුකන් වාරේ, මිහිකත නලවාලා වැනි ගී බණ්ඩයක් ඇසුණුවිට සුනිල් සාන්ත සළකුණ දිස්වේ. මෙවන් යුගයක එවන් ගීයක් ඇසීමට පවා අප වාසනාවන්ත විය යුතුය. ඇතැම් විද්‍යුත් මාධ්‍ය විසින් කොත්ත රොටි බාස්ලා වැනි සංගීතඥයන් දොට්ට දමන, වැසිකලට පොළවෙන් මෙරුන් මතුවන්නා සේ ගායනයන් බිහිවන කාලයක සුනිල් සාන්ත වැනි සංගීතඥයන් ගීතයන් හා වාදනයන් රස විඳීම අපට ආශ්වාදය ගෙන දෙයි. සුනිලුන් පමණක් නොව ආනන්ද සමරකෝන්, ඩබ්ලිව්. ඩී. අමරදේව, නන්දා මාලිනී, වික්ටර් රත්නායක වැනි විශිෂ්ටයන් ක්ෂෙත්‍රය තුළ අමරණීය වී ඇත්තේ තම විෂයය ගැඹුරට ම හදාරා එම පෝෂණයෙන් හා නිසඟ කුසලතාවෙන් රසික ජනතාවට නැවුම් නිර්මාණ දායාද කළ හෙයිනි. එදා අනුන්ගේ ගී ගැයීම සොරකම වැනි බරපතළ ක්‍රියාවන් ලෙස සැලකූහ. සුනිල් සාන්තයන් සංගීතයේ නව මඟක් සොයා ගියේ තම විෂය ගැඹුරටම හැදෑරීමේය. නිර්මාණ ශක්තිය ඔහු තුළ ඇති බව එම අධ්‍යයනයේදීම ඔහු පසක් කර තිබුණි. ඒ ගායනය හා වාදනය දෙඅංශයෙන්ම ප්‍රථම පංතියේ ප්‍රථමයා ලෙස භාත්ඛණ්ඩ සංගිත පීඨයේ විශාරද උපාධිය සමත් වීමෙනි. එක් අතෙකින් මෙය ශ්‍රී ලංකාවට වාර්තාවකි. එනම් එවැනි ජයග්‍රහණයක් ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා මෙම සංගීතඥයා වීමය.

සුනිල් සාන්තයන් හින්දුස්ථාන් සංගීතය හැදෑරූ නමුත් තමාට පෙර අය මෙන් එම සංගීතය එහෙම පිටින්ම ශ්‍රී ලංකාවේ වග ාකිරීමේ රුදාවක් ඔහුට තිබුණේ නැත. එහෙත් ඒ වනවිට කුමාරතුංග මුනිදාස වැනි දෙස බස රැසට ඇළුම් කළ පිරිස් විසින් ඇති කළ ඇල්ම ඔහු තුළ අලුත් උනන්දුවක් වගා කළේය.

"රටට දැයට හිත දපා
මඳකට දිවි ලොබ ලොපා
කළ මෙහෙයක් නැති දෙපා
හෙළයකු දැකුමත් එපා"

මෙවැනි පැදි කියවා ඇති කරගත් උනන්දුව විසින් තමා රටට, දැයට යමක් කිරීමේ අටියෙන් අලුත් අලුත් දෑ නිර්මාණය කළේය. කුමාරතුංග පඬිවරයාගේ පොතපත හැදෑරීමෙන් නොනැවති හෙළ හවුලේ සුබැසියන් ඇසුරින් ලබාගත් ශික්ෂණය ඔහු නිසි මඟට යොමු කළේය.

මේ නිසාම ගීතයේ බස පිළිබඳව සුනිල් සාන්ත විශේෂ සැළකිල්ලක් යොමුකර ඇත. ගීතයක ගායකයාගේ හඬ, තනුව, සංගීතය හා බස ගැනද සුනිල් සාන්ත තරම් අනික් සංගීතඥයන් උනන්දුවක් දක්වා ඇද්ද යන්න විමසීමට යොමුකරමි. බස, ගේය පද රචනය තුට්ටුවට වැටී ඇති තත්ත්වයක් තුළ සුනිල් සාන්ත අමරදේව, වික්ටර් රත්නායක වැනි සංගීතඥයන්ගේ ගීත වල ගේය පද රචනය කොතරම් අගය කළ යුතුද කිවහොත් එය කියවා අසා සාහිත්‍ය කෘතියක් මෙන් රස විඳිය හැකිය. ආරම්භයේදී තමාගේ පදමාලාව සිය ගීතයට යොදාගත් සුනිල් සාන්ත පසු කාලයේදී ප්‍රවීණ ගීත රචකයන්ගේ ඇසුර ලබාගත්තේය.

හෙළ බසට ඇති ඇල්ම සුනිල් සාන්තයන්ගෙන් ප්‍රකාශ කෙරෙන්නේ මුල්යුගයේ ඔහුගේ ප්‍රබන්ධයන් සියල්ලන්ම වාගේ හෙළ හවුලේ ළබැඳියන් වීම නිසාය. කුමාරතුංග මුනිදාස, රැ. තෙන්නකෝන්, අරිසෙන් අහුබුදු, අමරසිරි ගුණවඩු, ගුණපාල සේනාධීර, මෝසැසි පෙරේරා පියතුමා හා හියුබත් දිසානායකයන් ඒ අතර මුල්තැන්හී ලා ගැණෙනි.

හියුබත් දිසානායකයන්ගේ ගීතවත් බසින් නිසි ලෙස එල නෙලාගත්තේ සුනිල් සාන්තයන්ය. ගීත පබැඳුමෙහිදී අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව ඊට මැදිහත් වීම නිසා වටිනා නිර්මාණ පෙළක් රටට දායාද කිරීමට සමත්වී ඇත.

මෙවන් පිටිසරේ - මේ දුගී පැලේ (මල්මිහිර)
මේ ගෝපලුවනයේ (මිහිරියාව)
ආදර නදියේ - පීනමු රිසිසේ (සුනිල් හඬ)
සන්සුන් සීත දල්වා (හේලි මිහිර)
රැල්ල නැඟෙන්නේ - වැල්ල බලා ගලන්නේ (මිහිරියාව)
පියකරු නුවර වැවේ (මල් මිහිර)
උපන් බිම අපේ (සුනිල් හඬ)
සුවඳ රෝස මල් නෙලා (සුනිල් හඬ)
කුරුළු ආදරේ සතුටු සාගරේ (සුනිල් හඬ)
මිහිකත නළවාලා (මිහිරියාව)
පිරුණු ඒ සොමියදේ (මිහිරියාව)

(මිහිකත නළවාලා ගීතයේ ගුරුවරිය අප සිත් තුළ චිත්‍රණය කිරීමට යොදාගන්නා බස මටසිලිටිය.

"සුදු හෙළ සාරිය හැඳලා
හැඩ කොට ඉඟවට රැළි ලෙළවා
දිගු නිල් වරලස පීරා නිසි
ලෙසැ මල් ගවසා බැඳලා
ගෙලවට මුතුමාලේ - දෝතේ
වළලු සැලේ"

වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම නියම ගැමිකතකි. පාසල් ගුරුවරියක්. ඇගේ ගමන මිහිකත නැළවීමකි.

"සිරියා සපුරා සිරියා පතුරා
යන සුරතල් ලීලා"

ගී බණ්ඩයේ අවසන් පේලිය ද්වනිතාර්ථ නඟන්නේ ලීලා ගුරුවරියගේ ගමනේ ලාලිත්‍යයයි. ඇගේ සුරතල් ගමනේ චිත්තරූප ශ්‍රාවක සිත්හි ජනිත කරයි.

පරිසර දූෂණය පිළිබඳව මෙවැනි උනන්දුවක් හෝ බරපතළ තත්ත්වයක් නොතිබූ වකවානුවක ගීත රචකයෝ, ගායකයෝ පරිසරයට මහත් සේ පෙම් බැඳින්නට අමතක නොකළහ. මෙම අවධියේ ආනන්ද සමරකෝන්ගේ බොහෝ ගීතයන්හි වස්තු විෂය හැටියට පරිසරය මාතෘකා බවට පත්වේ. ඊට නොදෙවෙනි අයුරින් සුනිල් සාන්තව පරිසරය ගීතයට විෂයකර ගනී. මුතුරාජවෙල්යායේ සොබාවික අසිරිය විඳීමේ වාසනාව ලැබූ සුනිල් සාන්තයන්ගේ කවි සිත පිබිදීම අරුමයක් නොවේ. දනන් මුවඟ නිතර කියැවෙන ඕළු පිපීලා, හඳපානේ, බෝවිටියා දං පළුකන් වාරේ වැනි ගීත ලියැවෙන්නේ ඒ අනුවය. ඉර නැඟීමේ ගීතය සොබාවික පරිසරය සිත්තම් කළ සිතුවම් පෙළකි. නැගෙනහිරේ හිමිදිරියේ එළිය වැටෙන්නේ යන එම ගීයෙනහි. කුකුළන් හැඩලීම, කපුටන් හා අනෙකුත් පක්ෂීන්ගේ අවදිවීම වවුලන්, බකමූනන් සැඟවී යන හැටි. දරුවන්ගේ පාසල් ගමන, හිරු එළියට මල් පිපෙනා ආකාරය රැගත් දර්ශනයන්ය. ඉර බැසීමේ ගීතය ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාකාරකම් දිස්වෙන අවස්ථාවකි.

සොබාදහමේ අසිරිය නිති බැති පෙම් ඉපිද වූ කවියකුගේ සිතිවිලි සුනිල් සාන්තයන් මෙන්ම ඔහු සමඟ මනා ඇසුරක් තිබූ හියුබත් දිසානායකයන්ගේ රචනාවලින්ද විශද වෙයි. මල් පිබිදීගෙන එන්නේ, පවන් සලන්නේ, මා නළවන්නේ, මල් සුවඳේ, මඳ සුළඟේ, නැළැවී සැනසෙන්නේ, ගුවන් තොටිල්ලේ, වලා තුරුල්ලේ එවන් ගී කීපයකි. ඔහු තම ගී නිර්මාණ බිහිකළ පරිසරයට කොතරම් ප්‍රිය කළේද කිවහොත් ගම අතහැර රාජගිරියට පදිංචියට යන්නේ බලවත් පෙරැත්තයක් අනුවය. එම පරිසරයේ ඇතැමුන් ඔහුට සතුරුව සිටියත් තම පරිසරයට ඇති සෙනෙහස අත්හැරීමට ඔහු මැලිවෙයි.

සුනිල් සාන්තයන් ජීවත්ව සිටියා නම් තමාගේ ගී වලට ජීවය දුන් පරිසරයට සිදුවී ඇති විපත දැක බලවත් ලෙස කම්පා වනු නියතය. වන ජීවී පනත යටතේ පරිසරය සුරක්ෂිත කිරීමට කොහොත් අණ පනත් තිබුණත් දේශපාලනඥයන්ගේ අමනකම් නිසා එය විනාශ කෙරෙමින් මහා පරිමාණ ව්‍යාපෘති නිසා දඬුගං ගඟ ආශ්‍රිත ප්‍රදේශය නතුකර ගැනීමේ ආදිනව මතුවෙන්නේ පරිසරයේ සුන්දරත්වය විනාශ වී එය රළු, කටුක බිමක් බවට පත්වීමත් සමඟය. තමා නිතර ගීතයට නැඟූ ළා ගොයම, බොරුපත්, කෙකටිය, දිය හබරල වැනි පැළෑටි ද ඕළු, බඳුවද, කිණිහිරි, ඉද්ද ආදි පුෂ්පයන්ද විනාශ වී හමාරය. බෝවිටියා, දං, පළුකන්, කජු, බාලොලියා, කරඹ රසවිඳීමේ හැකියාවක් නැත. කුරුලතා වලින් සුසැදි පොලිති, මලිති, බටිති, වවුලන්, බකමූණන්, කොකුන් නිතර ගැවැසුණු සරුකෙත් වතු කතරක් බවට පත්වීමේ ලකුණු පහළ වී තිබේ.

සුනිල් සාන්තයන්ගේ ජීවිතය පිළිබඳ කෙටි සටහනක් තැබුවහොත් එම දරුවා කුඩා කාලයේදීම මව්පිය සෙනෙහස අහිමිවූ අයෙක් බව කිවයුතුය. ඉපැදී තෙමසකින් පියා මිය යන්නේ සර්පයෙක් දෂ්ට කිරීමෙනි. පියා අහිමිවූ කල්හි මව දරුවන් සමඟ ජාඇල, දෙහියාගාතයට පදිංචියට පැමිණෙයි. ජෝශප් ජෝන්ට තෙවසරකින් මවද අහිමි වෙයි. මිත්තණිය සමඟ හැදෙන වැඩෙන දරුවා සිංහල හෝඩිය කියවන්නේ දෙහියාගාත රෝ. ක. විදුහලේදීය. ඊට පසු පාසල් කීපයකම සෙවන පතන්නට සිදුවෙයි. සිසු ජීවිතය හමාර කිරීමෙන් පසුව ඔහුට උගැන්වීමේ අවස්ථාව ලැබේ. හේ පුහුණු ගුරුවරයෙකි. පාසල් වල උග න්වන අතර තම සිසුන් තරග වලට ඉදිරිපත් කර ජය ලබාගත්තේය. මේ අතර සංගීතය වැඩිදුර හැදෑරීමේ ජෝශප් ජෝන්ගේ අවශ්‍යතාවය සපුරාලන්නේ සොහොයුරු රෝගුස්ය.

ඉන්දියාවේ ශාන්ති නිකේතනයෙන් ඇරඹි සංගීත අධ්‍යපනය කෙළවර වන්නේ භාත්ඛණ්ඩ සංගීත පීඨීයෙනි. එහිදී මහාචාර්ය රතන්ජංකර් යටතේ කරන හැදෑරීම් වලින් පසුව විශාරද පරීක්ෂණයට මුහුණදී ගායනය හා වාදනය යන අංශ දෙකෙන් ප්‍රථම පංතියේ ප්‍රථමයා හැටියට සමත්ව ශ්‍රී ලංකාවට කීර්තියක් අත්පත් කර දුනි. මෙවැනි සාමාර්ථයක් ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා සුනිල් සාන්තයන්ය. ඉගෙනීමේ කටයුතු සඳහා රජයේ ශිෂ්‍යත්වයක් ලැබුණි. අතිරේක වියදම් පියවාගත්තේ ආපසු ගෙවීමේ පදනම මත සිය සොහොයුරාගේ උනන්දුවෙන් ඥාතින්ගෙන් හා හිතවතුන්ගෙන් මාසිකව ලබා ගන්නා ණය මුදලකිනි.

මෙවැනි ජයග්‍රහණයක් ලැබ සංගීතයේ උන්නතිය සඳහා අපේක්ෂාවන් රැසක් ඇතිව මව්බිමට ගොඩබට සුනිල් සාන්තට සංගීත පරීක්ෂක තනතුර අහිමි කරයි. ඔහුට අත්හැර ගිය ගුරුපත්වීමත් ප්‍රදානය කරයි. තනතුර ප්‍රතික්ෂේප කරයි. පළමු කළකිරීම හා ප්‍රතික්ෂේප වීම සිදුවන්නේ මෙහිදීය. සංගීතය පිළිබඳ සුනිල් සාන්ත කළ හැදෑරීම් ඔස්සේ ඔහුගේ නැවුම් අපේක්ෂාවන්ගෙන් එලනෙලා ගන්නට පාලකයන්ට හෝ නිලධාරින්ට අවශ්‍යතාවයක් නොවීය. රටට ගැලපෙන දේශීය සංගීතයක් නිර්මාණය කිරීමේ සුනිල් සාන්තගේ පර්යේෂණ වලින් එළදායි මෙහෙවරක් කරවා ගැනීමට තරම් බුද්ධි ප්‍රභාවක් වගකිව යුත්තන් සතුව නොතිබීම අඳෝමැයි ජාතියට.

දේශීය සංගීතයක් සඳහා ජාතික මෙහවරක සුනිල් සාන්ත නියැලෙන විට රටේ ප්‍රබල සංනිවේදන මාධ්‍යය ගුවන් විදුලිය හින්දුස්ථාන විකාරයක් කරපින්නාගෙන බඩපිනුම් ගසමින් සිටියේය. සුනිල් සාන්තයන්ට සිදුවූයේ මෙයට එරෙහිව හුදකලා සටනක නියැලීමටය. ශිල්පීන් වර්ග කිරීම නමැති කෙමනක් අටවා ගුවන් විදුලියෙන් සුනිල් සාන්ත පිටමං කිරීමට කුමන්ත්‍රණය කළේ ගුවන් විදුලියයි. එම පරීක්ෂණය මෙහෙයැවීමේ සියළු සුදුසුකම සුනිල් සාන්ත සතුව තිබියදී මහාචාර්ය රතන්ජංකර් ගෙන්වන්නේ සුනිලුන්ගේ ස්ථාවරය පැහැදිලිව දැනගෙනය. සුනිල් සාන්තට ගුවන් විදුලිය තහනම් විය. හින්දුස්ථාන් කරයෝ ජයගත්හ. පරාජය වූයේ සුනිල් සාන්ත නොවේ. මේ පිළිබඳව ආචාර්ය තිස්ස අබේසේකරයන්ගේ කියමනක් උපුටු දක්වමි.

"මුනිදාස කුමාරතුංග මාර්ටින් වික්‍රමසිංහ යන පඬුවන් විසින් මතුකරන ලද සිංහල සම්ප්‍රදාය නියෝජනය කළ මහා සංගීතකරුවා සුනිල් සාන්තය. එම සංගීත ආර එහි ප්‍රාථමික අදියර ඉක්මවා මල්එල දැරීමට ඉඩ හැරියෙන් නම් එද එය අතු ඉතිලා වැඩුණු මහා සම්ප්‍රදායන් වනු නොඅනුමානය. ඉන්දියානු ගැති බමුණු කුලය සුනිල් සාන්තට හෝ ඔහුගේ ගී ආරට හෝ හිස ඔසවා නැඟී සිටීමට ඉඩ නොහැරීයෝය."

ජීවත්ව සිටියදී නොමරා මැරූ සුනිල් සාන්තයන්ට තමන් අතින් සිදුවූ වරද නිවැරදි කරන්නට අද ද ක්‍රියාකර නැත. ඔහුගෙන් වූ සේවය අගයන්නට කිසිවත් කර නැත. බිරිඳට දරුවන්ට පිංසිදුවන්නට ගී ස්වල්පය සුරැකි තිබේ. මේ මහා සංගීතකරුවා වෙනුවෙන් ඔහුට නිගරු කරන්නට අතුපාරකට නමද වරද්දා ඔහුගේ නම පුවරුගත කර ඇත. උගත් පාසල නම් කරන්නට නොදී එය වැසීයාමට ආසන්නය. සංස්කෘතික මධ්‍යස්ථානයක් සුනිල් සාන්ත නමින් නම් කරන්නට ගත් උත්සාහය දේශපාලන බල මහිමයෙන් වැළකුනි. ආනන්දකුමාරස්වාමිගේ නම මැකී යන කාලයක සුනිල් සාන්තයන්ගේ නමට කුමක් විය නොහැකිද?

**ඇල්ප්‍රඩ් නෙල්සන්**



---

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 201

### ස්ප්‍රීතු සාන්තු

"පිත් පුත් ස්ප්‍රීතු යන තිදෙනා - සුරලොව ත්‍රිත්වය නම් දරනා" වරදන සිංහල වචන මදිවට spiritus sanctus යන උතුම් ලතින් වචනත් විකෘත වී ගොසිනි. ධීර වීර සුබිත මුදිත, දෙගුණ තෙගුණ විලාසය අනුකරණයෙන්දෝ ස්ප්‍රින්තු සාන්තු නම් මෙලෝ පරලෝ නැති වහරක් පැතිරෙමින් පවතී. Spirit වෙතින් නිපදෙන spirited, spirituous, spiritual වචනවලත් බොහෝ යුරෝපීය භාෂාවලත් හල් න් යන්න නැති ස්ප්‍රීතුව මිසක් වෙන කිසිවක් නැත. සොර සුරාපොලවල් වැටලීම් මාධ්‍යවල වාර්තාවෙද්දී, පවා ස්ප්‍රීතු බැරල් කියා නිවැරදිව සටහන්වේ.

පෙර ජන වන්දනාව අනුව ඔක්තෝබර් 25 සාන්ත ක්‍රිසාන්තුස් Chrysanthus මුනිතුමාගේ මංගල්ලය විය. ඒ නම ක්‍රිසාන්තස් / ක්‍රිසැන්තස් වී ක්‍රිසාන්ත හා ක්‍රිසාන්ති ලෙස නම කෙටි වී දරු දැරියනට නම් තැබිණ. සුශාන්ත, නිශාන්ත, උපශාන්ත යන නිදොස් නම් අනුව යමින් ක්‍රිශාන්ත/ ක්‍රිශාන්ති බිහිවිය. බුදුනු කිතුනු හැමට අද පොදුවූ ක්‍රිශාන්ත හා ක්‍රිශාන්ති නාමවල වරද නම් සිංහලේවත් සංස්කෘතේවත් 'ක්‍රි' කියන උපසර්ගයක් නැතිවීමයි. ටික දෙනෙක් Chryshantha හා Chryshanthi ලෙස ලියා සාන්තුවරයා සමරති. සිංහලෙන් නම් එසේ කළ නොහැකිය. ක්‍රියා හා ක්‍රිෂ්ණ වචනවල ඇත්තේ උපසර්ග නොවේ. ආනන්ද, උපනන්ද, සුනන්ද අතරට ක්‍රිනන්ද ආවිට ඔබට වරද වැටහේවි. සුසන්තා සුශාන්තගේ වැරදි ශබ්ද කිරීමකි. කපුරු මල ක්‍රිසැන්තමම්ය.

ජසින්තාත් අසුන්තාත් සිංහල නම් නොවේ. ස්පාඤ්ඤ ආදි භාෂාවල ජසින්තා නම් හයසින්ත් මලයි. Assumpta යන ලතින් වචනය එක්ව මරියා නම ඇකිය හැකිය. තේරුම අහසට එසවුණු හෙවත් ස්වර්ගාරෝපිත යනුයි. අසුන්තා වුණේත් ලතින් අසුම්ප්තාය.

තිමති TIMOTHY සිසිල් CECIL ඇමන්ඩා AMANDA මෙලනි MELANIE සිංහල වචනවලට සමීපතාවක් පෙන්නුවද විවිධ යුරෝපීය භාෂාවල නම්ය. ස්පාඤ්ඤ RAUL නම දකුණු ආසියාවේ රාහුල හා සම්බන්ධයක් නැත. RAUL යනු රෙජිනෝල්ඩ් නමේ සංක්ෂිප්තයක් බව ක්‍රිස්තියානි නම් පිළිබඳ ශබ්දකෝෂයක සඳහන්ය.

---

161

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු




රත්නපුරේටයි මහින්නෙ කළුතරටයි දිය ගලන්නේ
ඒකයි මේ කුඹේ අරන් යාපනයේ කැරි සරන්නෙ
රාල ඉන්නෙ මීගමුවෙයි සබරගමුවෙ මුනා පැන්නෙ
ඒකයි මේ රාලහාමි මේ හැටි මුම හම තලන්නෙ

ඌ පැන පැන පලයල්ලා තම මැඩිදුර නෑ
කට මැත තුම දොඩපල්ලා මිලි වී තම නෑ
මොර කර දිය මාපල්ලා මාළු නාම නෑ
දුර යන කොට කියපල්ලා "අපි ඕමට නෑ

ගායනය : ගඟ අද්දර පොඩි රාලහාමි

---




## "දුටු නොදුටු" එළිදැක්වුණු වගයි.

ගරු ශිරාන් චාමක පියතුමන් අතින් නිර්මාණය වූ "දුටු නොදුටු" නමුවූ සිතුවිලි එකතුව (පද්‍ය සංග්‍රහය) එතුමන්ගේ කුළුඳුල් දිව්‍ය පූජාව දින නිවසේ දී එළිදැක්වුණු වගයි.

බැසිල් ෆොන්සේකා විසිනි

# ඉන්දියානුවෝ සුවය පතා තෝමස් මුනි කන්ද නගිති

ඉන්දියාවේ මලයාතුර් ප්‍රදේශයේ ඇති කන්දෙහි සාන්ත තෝමස් මුනි ජාත්‍යන්තර ආසන දෙව් මැඳුර පිහිටා ඇත. ක්‍රිස්තු වර්ෂ 52 දී එහි පැමිණි සාන්ත තෝමස් මුනි තුමා නිහඬ යාච්ඤාව සඳහා එම කන්දට ගිය බව ඉන්දීය කතෝලිකයන්ගේ විශ්වාසයයි.

ඒ කන්ද මත එතුමාගේ පා සටහන ද ඇති බවට ඔවුහු තරයේ විශ්වාස කරති. වර්ෂය පුරාවටම ලක්ෂ සංඛ්‍යාත ජනයා මෙම කන්දෙහි පිහිටි සාන්ත තෝමස් මුනිතුමාගේ ආසන දෙව් මැඳුරට වන්දනාවේ යති. එහි වන්දනාවේ පැමිණෙන වන්දනා කරුවන්ගේ සංඛ්‍යාව ශුද්ධවූ සතියේදී අතිශයින් ඉහල යන බැව් ආසන දෙව් මැඳුර භාරව සිටිනා සේවියර් තෙලක්කාර් පියතුමා විසින් සනාථ කැරේ. මේ වසරේ මහා සිකුරාදා දින ලක්ෂ දහයකට වැඩි වන්දනා කරුවන් පැමිණ සිටි බැව් ද එතුමා ප්‍රකාශ කරයි. බොහෝ සුවවීම් ද සිදුවුන බැව් එතුමා විසින් දක්වා ඇත.

ජෝශප් කුඩියස්පරි ධීවරයෙකි. ඔහු කලින් හර්ද සැත්කමකට පාත්‍ර වී සිටියත්, 1999 වර්ෂයේදී වෛද්‍යවරුන් විසින් අවැසි යයි පැවැසූ ශලය කර්මය සිදුවූයේ නැත. ජෝශප් කුඩියස්පරි පවසා සිටිනුයේ සාන්ත තෝමස් මුනි අනුහසින් ඔහුගේ හර්ද රෝගය ප්‍රාතිහාර්යක් ලෙසින් සවු වී ඇති බවයි. මෙබඳු ප්‍රාතිහාර්ය ජනක සුවවීම් රාශියක් වාර්තා වී ඇති බැව් කතෝලික මාධ්‍යයන් විසින් වරින් වර හෙළි දැක්වේ.

## වෙළෙඳපොළ තුළ ඇදහිල්ල ජීවත් කරවන්නැයි ව්‍යාපාරිකයන්ට අනුශාසනා

"කිතුනු ව්‍යාපාරිකයන් විසින් වෙළඳපොළ තුළ සිය ඇදහිල්ල සහ කාර්ය භාරය සංයුතියක් ලෙසින් ඒකාග්‍රතාවයට පත් කළ යුතු වේ. වෙළඳපොළේ කාර්ය භාරය සතුව ඇති වෙනසක් කිරීමේ බලය තුළින් සකළ මැවිල්ල මිනිසාගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මෙහෙයවිය යුතු වේ.

කාර්දිනල් පීටර් ටුර්කසන් උතුමාණන් විසින් මෙබඳු අදහස් ප්‍රකාශ කරනු ලැබුවේ ජගත් කිතුනු ව්‍යාපාරිකයන්ගේ 24 වැනි සැසිවාරයේදීය. විවිධ රටවල් වලින් පැමිණි කිතුනු ව්‍යාපාරිකයන් 2000 කට අධික සංඛ්‍යාවක් සහභාගි වූ මෙම සැසිවාරය පසුගිය මාර්තු 30 වැනිදා, ප්‍රංශයේ ලියොන් හිදී පවත්වනු ලැබීය "වෙළඳ පොළ තුළ සාධාරණය ද දයා ප්‍රේමය ද පවත්වාගෙන යනු ලැබීමෙන් මිනිසාට මැවිල්ලේ සාධාරණත්වය සමබරව පවත්වාගෙන යෑමට හැකිවනු ඇත." මෙම අදහස් ගැබ්ව ඇති "ව්‍යාපාරික නියමුවාගේ කැඳවීම" නමැති ප්‍රකාශනය ද බෙදා හරිනු ලැබීය.

"ජීවිත තුළ පවත්නා බෙදුනු සංකල්පය ව්‍යාපාර ලෝකයේ ඇවැන්ත ප්‍රශ්න වලට හේතු වී ඇතැයි ද දැක්වීය. ආර්ථික බලය යොදා ගනිමින් පොදු යහපත යටපත් කොට ඇත. ආර්ථික ජීවිත පැවැත්ම හා පරම යහපත පවත්වාගෙන යාම කරුණු දෙකක් ලෙස සැළැකේ. මෙම තත්ත්වය එදා ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කළ නොහැක යන සත්‍යතාවය හුවා දක්වයි. එබැවින් බෙදුනු ජීවිත පැවැත්ම ව්‍යාපාරිකයාට මෙන්ම ජනතාවට ද හිතකර නොවනු ඇත. මෙවන් කරුණු ද සැසිවාරයේදී අවධාරණය කරනු ලැබීය. එබැවින් අධ්‍යාත්මික ජීවිත පැවැත්ම කිතුනු ව්‍යාපාරිකයාගේ ජීවිතය හා බැඳී තිබිය යුතුය. එමෙන්ම නිරන්තරයෙන් සක්‍රමේන්තු ජීවිතය තුළ ව්‍යාපාරිකයා සිය පැවැත්ම පදනම් කරගත යුතුය. යාච්ඤාව ද දිව්‍ය සත්ප්‍රසාදය ද විසින් ව්‍යාපාරිකයාගේ ජීවිත දැකුම ගොඩනංවාලිය යුතුය. එමගින් ව්‍යාපාරිකයාගේ ජීවිතය හා ව්‍යාපාරික මෙහෙවර බිඳුනු පැවැත්මක් ලෙස නොව සංගෘහිත පැවැත්මක් ලෙසින් එල දරණු ඇත." කාර්දිනල් ටුර්ටන් උතුමාණන් විසින් ජගත් කිතුනු ව්‍යාපරිකයෝ එලෙසින් බලගතු කරනු ලැබූහ.

## දෙව් මැඳුරු තහනම් කිතුනුවන් වෙනුවෙන් යදින සතියක්

ලෝකය පුරා 30 ට වැඩි රටවලැ වෙසෙනා කිතුනුවන්ට එකට රැස්වී දේව මැඳුරක් තුළ දෙවිඳු නමස්කාර කිරීම තහනම්ය. නැතහොත් දේව නමස්කාරය කරන්නාවූ කිතුනුවන්ට විවිධ පීඩාවන්ය. එමනිසා ඒ ඒ රටවලැ බොහෝ කිතුනුවෝ දේවස්ථාන වලින් බැහැරව කඳු. කැළෑ, කාන්තාර ආදී ස්ථාන වල හොර රහසේ එකට රැස්වී දෙවිඳුන් යදිති. විශේෂයෙන් නත්තල් සහ පාස්කු සමයන්හිදී මෙවන් පිඩනයන් උග්‍රවේ.

මෙම පාස්කු සමයේදී චිනයේ බිජින් නගරයේ එක් දෙව් මැඳුරකට රැස්වූ කිතුනු පිරිස පළවා හැර දෙව් මැඳුර වසා දමා ඇත. ඔවුන්ට සිදුවූයේ රහස් ස්ථානයකට ගොස් පාස්කු මෙහෙයයන් පැවැත්වීමටයි. කිතුනු දෙව් මැඳුරක් පවත්වාගෙන ගිය නොහැකි සවුදි අරාබිය වැනි රටවල ද කිතුනුවන් සිය ආගමික වන්දනාවන් පවත්වනු ලබන්නේ කාන්තාරයේ හොර රහසේය. ඉන්දියාව, පකිස්තානය, බංගලාදේශය වැනි රටවලැ ඇතැම් ප්‍රදේශයන් හි මෙම තත්ත්වය පිළිබඳ වාර්'තා වේ. එම නිසාවෙන් දෙව් මැඳුරක් හෝ නිවසක් තුළ දේව නමස්කාරය කළ නොහැකි තත්ත්වය හමුවේ එම පිඩිත ජනතාව වෙනුවෙන් දෙවිඳුන් හමුවේ පෙනී සිටීම අප හැමගේ යුතුකමක් යයි ජාත්‍යන්තර පරෝපකාර කිතුනු සංඝය පවසයි. එමනිසාවෙන් එසේ පිඩා විඳින කිතුනු ජනතාවන් වෙනුවෙන් එළිමහනේ යාච්ඤා කිරීමේ සතියක් ලෙසින් මැයි මස 20 සිට 27 දක්වා ප්‍රකාශයට පමුණුවා ඇත. එම සතිය තුළදී කිතුනු පිඩිතයන් වෙනුවෙන් එළිමහනේ යාච්ඤා පවත්වන ලෙසට හැකි හැම අයගෙන්ම ඉල්ලීමක් කරත.

## දෙව් මැඳුරු තහනම් කිතුනුවන් වෙනුවෙන් යදිනා සතියක්

ලෝකය පුරා 30 ට වැඩි රටවලැ වෙසෙනා කිතුනුවන්ට එකට රැස්වී දේව මැඳුරක් තුළ දෙවිඳු නමස්කාර කිරීම තහනම්ය. නැතහොත් දේව නමස්කාරය කරන්නාවූ කිතුනුවන්ට විවිධ පීඩාවන්ය. එමනිසා ඒ ඒ රටවලැ බොහෝ කිතුනුවෝ දේවස්ථාන වලින් බැහැරව කඳු. කැළෑ, කාන්තාර ආදී ස්ථාන වල හොර රහසේ එකට රැස්වී දෙවිඳුන් යදිති. විශේෂයෙන් නත්තල් සහ පාස්කු සමයන්හිදී මෙවන් පිඩනයන් උග්‍රවේ. මෙම පාස්කු සමයේදී චිනයේ බිජින් නගරයේ එක් දෙව් මැඳුරකට රැස්වූ කිතුනු පිරිස පළවා හැර දෙව් මැඳුර වසා දමා ඇත. ඔවුන්ට සිදුවූයේ රහස් ස්ථානයකට ගොස් පාස්කු මෙහෙයයන් පැවැත්වීමටයි. කිතුනු දෙව් මැඳුරක් පවත්වාගෙන ගිය නොහැකි සවුදි අරාබිය වැනි රටවල ද කිතුනුවන් සිය ආගමික වන්දනාවන් පවත්වනු ලබන්නේ කාන්තාරයේ හොර රහසේය. ඉන්දියාව, පකිස්තානය, බංගලාදේශය වැනි රටවලැ ඇතැම් ප්‍රදේශයන් හි මෙම තත්ත්වය පිළිබඳ වාර්'තා වේ. එම නිසාවෙන් දෙව් මැඳුරක් හෝ නිවසක් තුළ දේව නමස්කාරය කළ නොහැකි තත්ත්වය හමුවේ එම පිඩිත ජනතාව වෙනුවෙන් දෙවිඳුන් හමුවේ පෙනී සිටීම අප හැමගේ යුතුකමක් යයි ජාත්‍යන්තර පරෝපකාර කිතුනු සංඝය පවසයි. එමනිසාවෙන් එසේ පිඩා විඳින කිතුනු ජනතාවන් වෙනුවෙන් එළිමහනේ යාච්ඤා කිරීමේ සතියක් ලෙසින් මැයි මස 20 සිට 27 දක්වා ප්‍රකාශයට පමුණුවා ඇත. එම සතිය තුළදී කිතුනු පිඩිතයන් වෙනුවෙන් එළිමහනේ යාච්ඤා පවත්වන ලෙසට හැකි හැම අයගෙන්ම ඉල්ලීමක් කරත.

## පාස්කු ඉරිදා බෝම්බයෙන් 38 ක් මරුට

නයිජීරියාවේ කඩුනා ප්‍රදේශයේ, කිතුනු දෙව් මැඳුරු කීපයක් පිහිටා ඇත. පාස්කු ඉරිදා එම දෙව් මැඳුරු තුළ පාස්කු මෙහෙයයන් පටන් ගෙන තිබුණි. රටේ පවත්නා නොසන්සුන්කාරි කිතුනු පීඩනයන් මධ්‍යයෙහි. විශේෂයෙන් දේවස්ථාන ප්‍රදේශ වටා ආරක්ෂක සංවිධාන තර කොට තිබුණි.

බෝම්බ රැගත් මරාගෙන මැරෙන අයෙක් පදවාගෙන ආ මෝටර් රථයක් දෙව් මැඳුරු දෙකක භූමිභාග යන්ට ඇතුළු වීමට යත්න දැරුවත් ආරක්ෂක සංවිධාන හේතු කොට ගෙන ඒවාට ඇතුළු වීමට ඔහුට නොහැකි විය. දේවස්ථාන කරා ඇදී යාමට නොහැකි බැව් තේරුම් ගත් බෝම්බ කරු දෙව්මැඳුරු ආසන්නයේ දී බෝම්බ සහිත රිය පුපුරුවා හැරියේය. ඒ අවට කඩ සාප්පු ද කුඩා හෝටල් ද පිහිටා තිබිණි. තවද පෙට්‍රල් වෙළඳ සැලක් ද එහි විය. බොහෝදෙනාගේ පොදු වාහනය වන යතුරු පැදි විශාල සංඛ්‍යාවක් ද නවතා තිබුණි. මාර්ගයේ සිටි ජනතාව ද එහා මෙහා යමින් සිටියහ. මෙම සාපරාධි බෝම්බ පිපිරවීමෙන් මුළු පරිසරයම ශෝකාලාපයක් බවට පත්විය. ආරක්ෂක භටයින් පැමිණ විශාල සංඛ්‍යාවක් ආරෝග්‍ය ශාලා වලට පිටත් කර යවන ලදී. පසුව කළ නිරීක්ෂණ අනුව 38 දෙනෙක් මරමුවට පත්ව සිටියහ. කඩුනා ප්‍රදේශය පිහිටා ඇත්තේ නයිජීරියාව උතුර හා දකුණ වශයෙන් බෙදනු ලබන මායිමේය. එම උතුරු මායිමේ වෙසෙන කිතුනුවන්ගේ සංඛ්‍යාව විශාලයි. එබැවින් එහි වෙසෙන කිතුනුවන්ට කෙරෙන පහරදීම් නිරන්තරයෙන් සිදු වෙයි. මේ වසරේදී පමණක් එම පහරදීම් මගින් 380 දෙනෙක් මරා දමා ඇත. එම ඝාතනයන් සඳහා වගකීම භාරගෙන ඇත්තේ බොකොහරාම් නම් අන්තවාදී සංවිධානයයි.

## "ටයිටැනික්" නෞකාවේ හිරවූ පිරිස් අතහැර නොගිය වීර පූජකවරයා



ඓතිහාසික ටයිටැනික් නෞකාව සාගරයේ ගිලී ගියේ වර්ෂ 1912 අප්‍රේල් මස 15 වැනිදාය. එම ඓතිහාසගත සිද්ධිය සමග එහි ගමන් කළ තෝමස් බයිල්ස් පියතුමාගේ ජීවිත පරිත්‍යාගයද කතෝලික ඇදැහිලිවන්තයන් තුළ ගෞරවාදරයට පත්ව ඇත.

තෝමස් බයිල්ස් පියතුමා ටයිටැනික් නෞකාවේ ගමන් කළේ නිව්යෝර්ක් නගරයට යාමටයි. එහිදී පැවැත්වීමට නියමිතව තුබු සිය සොහොයුරාගේ විවාහ දිවිය ආසිරි ගැන්වීම ඔහුගේ ගමනේ අරමුන වී ඔහු ගමන් කර ඇත්තේ සාමාන්‍ය මගීන් ගමන් කළ නෞකා මැදිරියේය. එදින උදේ නෞකාවේ සිටි මගීන් වෙනුවෙන් දිව්‍ය යාගය පුද දුන්නේය. අයිස් කුට්ටි කන්දක ගැටී ටයිටැනික් නෞකාව මුහුද ජලයෙන් පිරෙන්නට පටන්ගත් විට තෝමස් පියතුමා අනෙක් අයගේ සහයට ඉදිරිපත් විය. ඒ සමගම සියල්ලන් සමග හඬ නගමින් දෙවිඳුන් යදින්නට ද පටන් ගත්තේය. ජීවිත ගළවා ගැනීමේ බෝට්ටුවකින් ඔහු පිටතට ගෙන යාමට ඒ අය ඉදිරිපත් වූවත් ඔහු ඊට අකමැති විය. සියල්ලන් බේරා ගැනීමට යත්න දැරුවත් එම උත්සාහය සාර්ථක නොවන බැව් පියතුමාට දැනී ගියේය. එක් තැන රැස්වූ සියයකට වැඩි කතෝලික, ප්‍රොතෙස්තන්ත හා ජුදා ඇදැහිළිවන්තයන් මුහුදු ජලය විසින් ගිලගනු ලබද්දී තෝමස් පියතුමා හඬ නගා දෙවිඳුන් අමතමින් මරණ මංචකයේ සිටි ඒ සියළු දෙනාට පොදු සමාව ලබාදුන්නේය. සියල්ල නිමා වුවද ගරු තෝමස් බයිල්ස් පියතුමාගේ සිරුර පවා හමු නොවීය. ඉන් පසුව එතුමාගේ පවුලේ අය X වැනි ශුද්ධෝත්තම පියාණන් හමුවූ විට එතුමා විසින් පවසනු ලැබුවේ, ගරු තෝමස් බයිල්ස් පියතුමා ප්‍රාණපරිත්‍යාගි වරයකු බවයි. වර්ෂ 1912 අප්‍රේල් මස 15 වැනිදා ටයිටැනික් නෞකාවේ ඔහු හා ගමන් කළ අනෙක් අය වෙනුවෙන් සිය දිවිය පරදුවට තැබූ ගරු තෝමස් බයිලිස් පියතුමා සැබෑ පූජක විරුවෙක් යැයි කතෝලික පුවත් වාර්තා කරයි.

## ත්‍රස්ත ක්‍රියා හමුවේ මීසම් මට්ටමේ ආරක්ෂක සංවිධාන

පකිස්තානයේ විරුද්ධවාදී දේශපාලන හා සුළුතර ආගමික කණ්ඩායම් පාදක කොට ගෙන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් දැන් දැන් වර්ධනය වී ඇත. මේ වසරේ පසුගිය සති 3-4 ඇතුළතදී එම කොටස් ඉලක්කකොට සියයකට වැඩි පිරිසක් මරණයට පාත්‍ර කොට ඇත. උදාවී ඇති බියකරු තත්ත්වය යටතේ කතෝලික මීසම්වල ජීවත් වන ඇදැහිළි වන්තයන්ගේ ආරක්ෂාව සළසාලීමේ අරමුනින් ක්‍රියාකාරකම් දියත් කරමින් පකිස්තානයේ දකුණුකරයේ කිතුනු නායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් අප්‍රේල් 14-15 දිනයන් හි කරච්චියේදී පැවැත්විණි. මෙම ආරක්ෂක ක්‍රියාදාම මෙහෙයවනු ලැබුවේ යුක්තිය හා සාමය පිළිබඳ කොමිෂන් සභාවේ අනුග්‍රහය යටතේ ෆ්‍රැන්සිස්කාන නිකාය විසිනි. දැනටමත් මෙසේ පුහුණුව ලබා ඇති කණ්ඩායම් 10 ක් විසින් රටපුරා ඒ ඒ තන්හි ඇදැහිළිවන්තයන්ගේ ආරක්‍ෂාව පිළිබඳ සක්‍රිය ක්‍රියාදාමයන් පවත්වාගෙන යනු ලබයි. මෙම ආරක්ෂක මෙහෙයුම් කණ්ඩායම් නීතිඥවරුන් ද වෘත්තිකයන්ද සමාජ ක්‍රියාකරුවන්ද විසින් මෙහෙය වනු ලබයි. "පකිස්තානයේ ත්‍රස්ත ක්‍රියාකාරකම් නිරන්තරයෙන් වර්ධනය වෙමින් පවති. සුළුතර ආගමිකයන් ද ඉලක්ක කොට ඇති හෙයින් ඔවුන් හට ආරක්ෂාව සැළැසීම සභාවේ වගකීමක් ලෙසින් පිළිගෙන ඇත. එබැවින් ඔවුන් හට ආරක්ෂාවත් සිත් සාමයත් ගෙන ඒම සඳහා ආරක්ෂක සංවිධාන තරකරමින් පවතී." මෙලෙස ප්‍රකාශ කළේ යුක්තිය හා සාමය පිළිබඳ සංවිධානයේ රෂිඩ ගිල් නම් නියාමක වරයාය.

## ලෝකය පුරා මිලියන 400 ක් දරුවෝ වහල් සේවයේ

අප්‍රේල් මස 16 වැනිදා දාරක වහල් සේවයට එරෙහි ලෝක දිනයයි. ඊට සමගාමීව "වතිකාන ඉන්සයිඩර්" පුවත් මඟින් ලොවට හෙළිකර ඇත්තේ ස්පාඤ්ඤයේ ආගම් සංවිධානය විසින් කරැති සමීක්ෂණයක් අනුව ලෝකය පුරා ඒ ඒ රටවලැ මිලියන 400 ක් දරුවන් වහල් සේවාවන් හි යොදවා ඇති බවයි. විශේෂයෙන් යුරෝපා වෙළඳපොළේ අලෙවිය සඳහා ආසියා හා අප්‍රිකා රටවලැ නිපදවනු ලබන විසිතුරු භාණ්ඩ ද ඇඳුම් පැළැඳුම් ද පරිඝණක අකුරු කොටස් ආදීය ද ඒ ඒ රටවලැ බාල වයස්කාර දරුවන් වහල් සේවාවෙහි සොයා ගැනීම මඟින් නිපදවන බැව් "වතිකාන ඉන්සයිඩර්" පුවත් තවදුරටත් වාර්තා කරයි. දාරක වහල් සේවයට එරෙහි ලෝක දිනය වන අප්‍රේල් 16 වෙනිදා හා බැඳි අනුවේදනීය සත්‍ය කථාවක් ද වේ. මිය යද්දී 14 වයසැති වූ ඉබ්බාල් මෂී පකිස්තාන ජාතික කිතුනු දරුවෙකි. සතර වයසේ සිට ඔහු පකිස්තානයේ රෙදිපිළි නිෂ්පාදනය කරන කම්හලකැ වහල් සේවාවෙහි යොදවා තිබිණි. වයස 12 වනතෙක්ම ඔහු එම වහල් සේවාවෙහි නිරතව සිටියේය. ඉන්පසු ඔහු එම වහල් සේවයෙන් මිදී පැනගත්තේ ජීවිතය පරදුවට තබාය. තමා හා තමා වැනි අනෙක් දරුවන් විසින් අත්දුටු වහල් සේවය පිළිබඳ සාක්ෂි ඔහු ලොවටම හඬගා ප්‍රකාශ කළේය. මෙලෙස යුරෝපා එක්සත් සංගමය හමුවේද ඔහුගේ අත්දැකීම් ප්‍රකාශ කරනු ලැබුවේ ලොව වෙසෙනා වහල් දරුවන් හට සෙතක් සළසන අයුරිනි. විවිධ ආගමික හා සමාජ සංවිධාන විසින් විවිධ රටවලට රැගෙන ගිය ඔහු අනෙකුත් වහල් දරුවන් වෙනුවෙන් කඳුළු හඬක් නැගුවේය. එහෙත් තක්කඩි ධන කුවේරයන්ගෙන් නම් ඔහුට මිදීමක් නොමැති වී ඒ අනුව අප්‍රේල් 16 වැනිදා 14 වයසැති ඉබ්බාල් මෂී අභිරහස් අන්දමින් ඝාතනය කරනු ලැබීය. එහෙත් ඔහුගේ නාමය දාරක වහල් ඉතිහාසයේ අමරණීයත්වයට පත්ව තිබේ. කරැති සමීක්ෂණයට අනුව ඉන්දියාවේ හා පකිස්තානයේ ගොඩනැගිලි කර්මාන්තයේද, බ්‍රසීලයේ කාර්මික අමතර කොටස් නිෂ්පාදනයේද, මියන්මාරයේ සීනි කර්මාන්තයේ ද, චීනයේ පුපුරන සුළු ද්‍රව්‍යයන් නිපැයීමේ ද, කොංගෝවේ ඛනිජ ද්‍රව්‍යයන් නිෂ්පාදනයේද, ඊජිප්තුවේ කපු කර්මාන්තයේද මහා පරිමාන වශයෙන් දරුවන් වහල් සේවාවෙහි යොදවා ඇති බැව්ද වාර්තා කරැත.

විශේෂාංග

# අප සැමගේ සුරැකි පියා වූ කම්කරු ශු. ජුසේ මුනිතුමා



**ශුද්ධවූ ජුසේ තුමා දාවිත් රජ පෙළපතේ මව්පියන්ගෙන් උපත ලැබ රාජකීය වංශයට හිමිකම් ලැබීය. එසේ වුවද, ලෞකික සැප සම්පත් නැතිව දිළිඳු විය. එතුමාගේ ප්‍රිය භාර්යාව වූ කන්‍යා මරිය තුමිය ද ලෞකික සැප සම්පත් අතින් දිළිඳුය. දේව පුතනුවන් වූ ජේසු සමිඳුන් ද දිළිඳු භාවයට ආදර්ශයක් වෙමින් එම දිළිඳු පවුලෙන් උපත ලැබීම දේව කැමැත්ත විය.**

ශුද්ධවූ ජුසේ තුමා වඩු කාර්මිකයකු වශයෙන් රැකියාව කරමින් ශ්‍රමය යොදා දහඩිය මහන්සියෙන් හරිහම්බකර එම දිළිඳු ශුද්ධවූ පවුල නඩත්තු කළේය. ජේසු සමිඳාණන් වහන්සේ ද ශුද්ධවූ ජුසේ තුමාගේ වඩු පට්ටලයේ වෙහෙස මහන්සි වී වැඩ කරමින් ශුද්ධවූ ජුසේ තුමාට සහය විය.

ශුද්ධවූ ජුසේ තුමා ජේසුස් වහන්සේගේ සුරැකි පියාණන් වුවද, ජනතාව ඔවුන් වහන්සේව හැඳින්වූයේ "වඩුවාගේ පුතා" ලෙසය. (ශු. මතෙව් 13:55, ශු. මාක් 6:3). නැතිනම් "ජෝසෙප්ගේ පුතා" ලෙසය. (ශු. ලූක් 4:22). මේ අයුරින් තමන් වහන්සේව ජනතාව ඇමතීම ගැන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කිසිවක් වදාළ බවක් සඳහන් වන්නේ නැත. මෙයින් පැහැදිලි වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ ද කම්කරුවකු බව පිළිග නිමින් සියලුම කම්කරුවන් හා ඔවුන්ගේ දහඩිය මහන්සිය හා සේවාවන් ආශිර්වාද කළ බවය.

ශු. ජුසේ තුමා හැම විටම දේව අණට කීකරු විය. තම උරුමය වන රාජකීය බලය පසුපස හඹාගියේ නැත. දුප්පත්කම වැළඳ ගනිමින් අපගේ ආදි මව්පියන්ගේ පාපයට දඬුවමක් හැටියට දහඩිය හෙලා මහන්සි වී වැඩ කිරීමට දෙවි මහෝත්තමයාණන් වහන්සේ දුන් අණට කීකරු විය. යටත් විය. ඉමහත් ඉවසීමෙන්, කරුණාවෙන් හා දයාවෙන් අන්‍යයන්ගේ යහපත උදෙසා කටයුතු කළේය. වෙහෙස මහන්සි වී වැඩ කරමින් අඟහිඟකමින් පිරුණු දුක්බර දිවියක් ගත කළ ද කිසිවිටෙක දෙවි මහෝත්තමයාණන් වහන්සේට විරුද්ධව මැසිවිලි කීවේ නැත. තමන්ගෙන් ඉටුවිය යුතු සේවයට, තම වගකීම්වලට වඩා තමන්ට ලැබිය යුතු දේ ගැන තම අයිතිවාසිකම් ගැන පමණක් කටයුතු කරන කම්කරුවන් වූ අප සැමට ශුද්ධවූ ජුසේ තුමා කදිම ආදර්ශයකි.

ශුද්ධවූ ජුසේ තුමා ගැන ශුද්ධ ලියැවිල්ලේ සඳහන් වන්නේ බොහෝ අල්ප වශයෙනි. එතුමාගේ මුළු ජීවිත කාලය පුරාම කිසි ප්‍රාතිහාර්යයක් හෝ ප්‍රසිද්ධ ක්‍රියාවක් සිදුකළ බව සඳහන් වන්නේ නැත. එතුමා "ධර්මිෂ්ඨයෙක්" නැතහොත් "සත් පුරුෂයෙක්" ය කියා පමණක් ශුද්ධවූ බයිබලයේ සඳහන් වේ. එම එක වචනය එතුමා ගැන බොහෝ දේ කියා පායි. ශුද්ධවූ බයිබලයේ "ධර්මිෂ්ඨයෙක්"ය කියා සඳහන් වන අනෙක් පුද්ගලයා ආබ්‍රහම් තුමාය. එතුමාගේ විශ්වාසය නිසා එතුමා ධර්මිෂ්ඨයකු ලෙස ගණන් ගැණුනු බව කියැවේ. ශුද්ධවූ ජුසේ තුමා ගැන ද කිව යුත්තේ එයමය.

කම්කරුවකු වූ ශුද්ධවූ ජුසේ තුමා යහපත් ස්වාමිපුරුෂයකු වූ බැවින් සැම ස්වාමිපුරුෂයකුටම ආදර්ශයකි. ජම්ම පාප දෝෂයෙන් නිදොස්ව පිළිසිඳුන කන්‍යා මරියතුමිය කන්‍යාභාවය තුළ සිටිමින්ම දිව්‍ය ගැලවුම්කාරයාණන් වහන්සේගේ මව වීම දේව කැමැත්ත සහ සැලැස්ම විය. ඇය විවාහ නොවී සිටියේ නම් ජුදෙව්වරුන්ගේ දෝෂ දර්ශනයට ලක්වනු නොඅනුමානය. ඇයට දයාබර සැමියෙක් මෙන්ම උපදින්නට සිටින දිව්‍ය බිළිඳාට සුරැකි පියකු අවශ්‍ය විය. ඒ කාරණා සියල්ලක්ම සම්පූර්ණ වීමට දෙවි වරමින් හා දේව කැමැත්තෙන් ශුද්ධවූ ජුසේ තුමා තෝරා පත් කරගනු ලැබීය.

ශු. ජුසේ තුමා මරිය තුමිය සමඟ විවාහ ගිවිස ගෙන සිටිය නමුත් ඔවුන් එක්වන්නට පෙර ශුද්ධාත්මානුභාවයෙන් ඇය ගැබ් ගත්තාය. මේ බව ශුද්ධවූ ජුසේ තුමා දැනගත් නමුත් එය කෙසේ වූවාදැයි එතුමා නොදත් බැවින් ඇයට හානියක් නොවන පිණිස ඇය රහසින් අත්හැර දමන්නට තීරණය කළේ ඒ ගැන ඉමහත් දුකට හා ශෝකයට පත් වෙමිනි. අද කාලයේ විවාහක පුරුෂයකු හෝ විවාහ ගිවිසගත් ආදරවන්තයෙක් තම බිරිඳ හෝ ආදරවන්තිය අන් කෙනෙකුගෙන් ගැබ්ගත් බව දැනගන්නට ලැබුණු පසුව කටයුතු කරනුයේ ඊට වඩා හාත්පසින්ම වෙනස් අයුරින්ය. ඒවා ගැන ලියන්නට පවා බැරි තරමට භයංකාරය. සමහරවිට එය මිනීමැරුමකින් ද කෙළවර වන අවස්ථා ද ඇත. එහෙත් ජුසේ තුමා කිසිම භයංකර දෙයක් කළේ නැත. මරියතුමියට අහිතකර ඇයට හානිකර කිසිවක් කළේ නැත. පසුව දේව කැමැත්ත දැන ගන්නට ලැබුණු විගස ඉතාමත් ප්‍රීතියෙන් පිනා යමින් එතුමා ඇය කැන්දාගෙන ගියේය.

"ජෝසෙප් නින්දෙන් අවදි වූ විට ස්වාමින් වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස සිය බිරිඳ කැන්දාගෙන ගියේය." (ශු. මතෙව් 1:24).

> **"ශුද්ධවූ ජුසේතුමාට කිසිම ආකාරයක තාන්නමාන්න, ගරු බුහුමන් ලැබුණේ නැත. එතුමා කිතු සමිඳුන් වදාළ ආකාරයටම තමකම නසා දිනපතාම සිය කුරුසිය දරාගෙන ජේසු සමිඳුන් අනුව ගියාවූ ප්‍රථම ගෝලයා බවට සැකයක් නැත."**

ශුද්ධවූ ජුසේ තුමා කිසිම පිරිමියකු නොකරන, කරතැයි සිතිය නොහැකි අති ප්‍රබල දෙයක් කළ ශ්‍රේෂ්ඨ මෙන්ම විශිෂ්ට ගණයේ පිරිමියකු බැවින් ද අපි එතුමාට වඩාත් ගෞරව කළ යුතු වෙමු. සිය බිරිඳ වූ කන්‍යා මරිය තුමිය සමඟ එකම නිවසේ එක වහලක් යට එකට සිටිමින් ඇයගේ කන්‍යාභාවය ආරක්ෂා කරගැනීමට ඇයට සහය වෙමින් මුළු ජීවිත කාලය පුරාවටම ඇය සමඟ කිසිම ආකාරයක ලිංගික සම්බන්ධතාවයක් නොපැවැත්වීමය. විවාහකයකු හැටියට මෙහි ඇති බැරෑරුම්කම, අසීරුතාවය මම හොඳින් දනිමි. යක්ෂයාගෙන්, ලෝකයාගෙන් මෙන්ම මාංශයාගෙන් ද එන්නාවූ විවිධාකාර දුර්පරික්ෂාවන් ජයගෙන එලෙස ජීවත්වීම අතිශයින්ම ශ්‍රේෂ්ඨය. මරියතුමියගේ කන්‍යාභාවය ගැන කතා කරමින් ඇයට ප්‍රශංසා කරන ගෞරව කරන අපි එතුමියට එම කන්‍යාභාවය රැකගැනීම සඳහා සකල අයුරින්ම සහය වූ ඇයගේ ප්‍රේමණීය පුරුෂයා වූ ශුද්ධවූ ජුසේ තුමාට ද එලෙසින්ම ප්‍රශංසා කළ යුතු වෙමු. ගෞරව කළ යුතු වෙමු. ඇය සමඟ කිසිදා ලිංගික සබඳතාවයක් නොපැවැත්වුවද ශුද්ධවූ ජුසේ තුමා මරිය තුමියට තම හදපත්ලෙන්ම ප්‍රේම කළේය. තම දිවි පරදුවට තබා සැම අයුරින්ම ඇය රැකබලා ගත්තේය. තමන්ට හැකි පමණින් ඇයට හැම සම්පතක්ම ලබා දෙමින් දයාබර සැමියකු ලෙස තම යුතුකම් කොටස ඉටු කළේය. කම්කරුවකු, සැමියකු ලෙසින් මෙන්ම පියකු ලෙසින් ද සැම පියෙකුටම ශුද්ධවූ ජුසේ තුමා ආදර්ශයක් දුන්නේය.

කන්‍යා මරිය තුමියගෙන් උපත ලද ජේසු පුතුට ශුද්ධවූ ජුසේතුමා ජනිත කළ පියා නොවූවත් සාමාන්‍යයෙන් මව්පියන් තම දරුවාට දක්වන ප්‍රේමයට වඩා අති මහත් ප්‍රේමයකින් ශුද්ධවූ ජුසේ තුමා ජේසු පුතාට ප්‍රේම කළේය. දෙවි පියාණන් වහන්සේ තම දිව්‍ය පුතනුවන්ට සුරැකි පියා කොට ශුද්ධවූ ජුසේ තුමා තෝරා පත් කළ කල්හි එතුමාගේ හද තුළ පියෙකුට යෝග්‍ය ප්‍රේමයක් ජනිත කළ සේක. ජේසු පුතා පියාණෙනි, තාත්තේ කියා ජුසේ තුමා අමතා ප්‍රේමයෙන් සහ ගෞරවයෙන් ජීවත් වූ බවට සැකයක් නැත. මෙම දේව පුත්‍රයා ලොව මැවුම්කරුවාණන් ද, ගැලවුම්කරුවාණන් ද බව ශුද්ධවූ ජුසේ තුමා හොඳාකාරව දැන සිටිය බැවින් ඔවුන් වහන්සේට ප්‍රේමයෙන් හා ගෞරවයෙන් ආමන්ත්‍රණය කිරීම ගැන කිසිම සැකයක් නැත. මෙම සුරැකි පිය පුතු සම්බන්ධය අරන් හදාගත්තා වූ දරුවන් සිටින කැපකරු මව්පියන්ට ද තමන්ට වඩා උසස් තත්ත්වයක් හොබවන පුතුන් සිටින්නාවූ පියවරුන්ට මෙන්ම එම දරුවන්ට ද කදිම ආදර්ශයකි.

ශුද්ධවූ ජුසේතුමාට කිසිම ආකාරයක තාන්නමාන්න, ගරු බුහුමන් ලැබුණේ නැත. එතුමා කිතු සමිඳුන් වදාළ ආකාරයටම තමකම නසා දිනපතාම සිය කුරුසිය දරාගෙන ජේසු සමිඳුන් අනුව ගියාවූ ප්‍රථම ගෝලයා බවට සැකයක් නැත. ජේසු උපතට පෙර සිය බිරිඳ වූ ගැබ්බර මරියතුමියව කොටළුවකු පිට නංවාගෙන දෙපයින්ම බෙත්ලෙහෙමට යෑම, බෙත්ලෙහෙමේ අතන මෙතන ඇවිදිමින් තම නෑසිය මිතුරන් සහ අනිකුත් අය අතර දරු ප්‍රසූතියට තැනක් සෙවීම, තැනක් නොමැතිව කිසිවකුගේ පිළිසරණක් නොමැතිව අවසානයේ දී කරන්නට වෙන කිසිවකුත් නොමැති වූ විට ගවයන් අතර ගවහලක දරු උපත සිදුවන්නට ඉඩ හැරීම, පසුව දේව අණට හිස නමමින් රාත්‍රියේ දී ජේසු බිළිඳු සහ මරිය තුමිය අවදි කරවාගෙන අති දුෂ්කර ගමන් මාර්ග යකින් ඔවුන් දෙදෙනා කොටළුවකු පිට නංවා දෙපයින්ම ඊජිප්තු දේශයට යාම, එම ආගන්තුක රටෙහි අති දුෂ්කර හත් වසරක දිවි පෙවෙත, දොළොස් වසරේ දී ජේසු පුතා නැතිවීම, ජේසු පුතාගේ ප්‍රසිද්ධ ජීවිතය ඇරැඹීමට පෙර මරිය තුමිය හා ජේසු පුතා තනිකර දමා යනාදී දුක් කරදර සියල්ලක්ම දේව අණ හා දේව සැලැස්ම සේ සලකා ඉතාමත් සතුටින් විඳ දරා ගත්තේය. එතුමා සාමාන්‍ය වඩු කම්කරුවකු ලෙස වෙහෙස මහන්සි වී උපයාගත් දෙයින් ශුද්ධවූ පවුල නඩත්තු කළේය. එතුමාගේ මුළු ජීවිත කාලයම අප සැමට ආදර්ශයකි

මේ හැම දෙයටම වඩා එතුමාගේ මරණය අප හැමට ආදර්ශයක් ගෙන දෙයි. මෙලොව උපන් කිසිම මිනිසකුට එවන් සුභ මරණයක වරම් ලැබුණේ නැත. ලෙඩ දුක් සෑදී එතුමා ගත දුබලව සිටියේය. දුබල වූවත් එතුමා සිටියේ සතුටින්ය. මන්දයත් ලෙඩ ඇඳේ එතුමාට උපස්ථාන කළේ මරිය තුමිය පමණක් නොව ලොව මවා පාලනය කරන දෙවි මහෝත්තමයාණන් වහන්සේගේ මනුකය ගත් පුතනුවන් වූ ජේසු සමිඳාණන් වහන්සේත් එතුමාට උපස්ථාන කළ සේක. එතුමාගේ මරණ මොහොතේ දී එතුමා ළඟ සිටිමින් එතුමාගේ ප්‍රාණය පියාණන් වහන්සේට භාර කළේත් ජේසු සමිඳාණන් වහන්සේම ය.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය මත ඇණ තුනකින් එල්ලී සිටින විට කුරුස පාමුල සිටියේ මරිය තුමිය පමණය. ශුද්ධවූ ජුසේ තුමා ඊට පෙර මිය ගිය බැවින් කුරුස පාමුල සිටිය නොහැකි විය. එබැවින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අප සැමගේ මෑණියන් කොට මරියතුමියව ශුද්ධවූ ජුවාම් අපෝස්තුළුතුමාට සංකේතයක් හැටියට භාර දෙන විට අප සැමගේ සුරැකි පියා ලෙස භාර දීම ද සංකේතවත් විය. එබැවින් අප පවුල්වල ආරක්ෂකයාණන් මෙන්ම මුළු ශුද්ධවූ සභාවේම ආරක්ෂක සුරැකි පියා ලෙස ශුද්ධවූ ජුසේ මුනිතුමා සලකනු ලබන්නේ ඉමහත් ගෞරවයෙනි.

**නීතිඥ සී. එම්. සුසිල් ගුණරත්න**
කලමුල්ල, කළුතර

# ජා-ඇල වික්ෂෝප මාතා දෙව්මැඳුරේ දෙදහස් වන වික්ෂෝප නොවානය

### ශීර්ෂ පාඨය

"එසේය, ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් වනු ඇත." (ලූක් 2:35)

### මූලාරම්භය

ප්‍රථමයෙන් කෙටි හැඳින්වීමක් කිරීම උචිත වන්නේමය. එබැවින් එය සැකෙවින් මෙලෙස සනිටුහන් කරමි. එදා ක්‍රි.ව. 1233 අගෝස්තු මස 15 වෙනි දින විය. වර්තමානයේ අප සාන්ත සභා මාතාව දේවමාතාවන් වහන්සේ සුරලෝ වැඩීමේ මංගල්‍යය සමරනු ලබන දිනය වේ. ඉතාලියේ ෆොරන්ස් නුවර පසිඳු බැතිමත් සිටුවරුන් සත් දෙනකුට දර්ශනය වූ අප පෙම්බර දේව මාතාවෝ එතුමියගේ වික්ෂෝපයන් ගැන ලොව පුරා දේශනා කරනු පිණිස විශේෂ තාපස පංතියක් පිහිටුවන මෙන් ඉල්ලා සිටියහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භ වූ මෙම නොවාන භක්තිය "සර්වයිට්" තාපසයන් විසින් ලොව පුරා ප්‍රචලිත කරන ලදි.

### ශ්‍රී ලක් දෙරණේ රෝපණය වීම

"මවගේ දුඃඛ මාර්ගය" නමැති මෙම නොවාන බැතිය අප ලක්බිමේ රෝපණය වන්නට විය. කෙමෙන් කෙමෙන් ප්‍රචලිත වූ මෙම නොවාන භක්තිය, කොළඹ අගරදගුරු වසමේ එතුමිය නමට කැපකොට ඇති ජා-ඇල දේවස්ථානයේ ද ආරම්භ විය.

### දෙව්මැඳුර පිහිටීම

දුකට දිරිය වන අප සුපෙම්බර වික්ෂෝප දේව මෑණියන් වහන්සේ නමින් කැප කොට ඇති මෙම මුල් දෙව්මැඳුර, වසර 210 දුරාතීතයකට හිමිකම් කියනු ලබන්නීය. ජා-ඇල නදිය අසබඩ දුම්රිය පාරට මුහුණලා, නගරය මධ්‍යයේ ඉදිකොට ඇත. ඉපැරැණි පෞරාණික වස්තු බීජයක් සනිටුහන් කළ පැරැණි දෙව්මැඳුර දැන් නව මුහුණුවරක් ගනිමින් ප්‍රතිසංස්කරණය කොට ඇත. තවමත් එසේ වෙමින් පවතී.

### මෙම බැතිය හා යාවජීව කල්වාරිය

එදා කිතු සමිඳුන් දිවි පිදූ "ගොල්ගොතා" නම් වූ කඳු ගැටය සංකේතවත් කරවමින්, ඉහත කී දෙවි විමනට යාබදව පිහිටි කල්වාරි කඳු ගැටය එහි යාවජීව භාවය ඔප් නංවයි. මෙනයින් බලන කල වික්ෂෝප දෙවි මව් වැඩ සිටීමත්, කල්වාරි කඳු ගැටය පිහිටීමත්, එහි වසරක් පාසා පැවැත්වෙන පාස්කුවත් ආශ්චර්යජනකය. එබැවින්, වික්ෂෝප නොවාන භක්ති අභ්‍යාසය පැවැත්වෙන දෙව්මැඳුරු අතුරින් ජා-ඇල සිද්ධස්ථානය ද ප්‍රමුඛස්ථානයක් ගන්නා බවට අටුවාටීකා අනවශ්‍යය.

### පළමු කාදිනල් හිමි අවසරය

කොළඹ අගරදගුරු පදවියේ එවකට නියමුවාණන්ව වැඩ විසූ අති පූජ්‍ය දේව ධර්මාචාර්ය තෝමස් බෙන්ජමින් කාදිනල් කුරේ අගරදගුරු හිමිපාණන්ගේ නිල අවසරයත්, එතුමන්ගේ නිසි මඟ පෙන්වීමත්, දේව අනුග්‍රහයත් දානය නොකරන්නට, මෙම වික්ෂෝප නොවාන බැතියේ ආරම්භයක් ඇති නොවන්නට ඉඩ තිබිණ. එබැවින්, ස්වර්ගස්ථ වූ අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් හට මීසම් වාසීන්ගේ භක්ති ප්‍රණාමය හා ගෞරවාදරය හිමිවේ.

### නිර්මාතෘවරයාණෝ

"සීදේවි" යනු විරුදාවලි නම්ලත් නිමල මරිය නිකායික පරලෝ සැපත් ගෞරවනීය කේ. විලියම් පෙරේරා පියතුමන්ගේ පාලන සමයේ දී මෙම නොවාන බැතිය ආරම්භ විය. වියත් ලේඛකයකු හා ප්‍රබල දේශනවාදියකු වූ ද, ගරු ජෝශප් ඇළුවීෂියස් නි.ම.නි. පියතුමන් මෙම භාරධූර කර්තව්‍යයට සහය දෙමින්, එය තමන් කරපිට ගනිමින් මෙම නොවාන බැතිය දියත් කරන්නට යෙදුනි. මෙයට ආරම්භයක් වශයෙන් උපයෝගී කරගනු ලැබූයේ ඩබ්. ඇම්. නිකුලස් පෙරේරා, මිෂනාරි අපෝස්තලික ගරු පියතුමන් විසින් රචිත වික්ෂෝප නොවාන පොතය. එය භාවිතයට ගනිමින් මෙම තුන් හවුලේ එකමුතුවෙන් එය දියත් කරවමින්, නොවාන අඹරේ දියඹට ගෙන යන්නට සමත් වූහ.

### රදගුරුහිමි සහභාගිත්වය

වර්ෂ 1973 ක් වූ මැදින් මස 09 වෙනි දින (චතාරික සමයේ පළමුවෙනි සිකුරාදා) අති උතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු, එවකට කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඉමහත් උත්සවශ්‍රීයෙන් ආරම්භක නොවාන මෙහෙය සිදුකෙරිණ.

### නිත්‍ය සන්තර්පනය

මෙම නොවාන ආරම්භයේ සිට මේ දක්වා වසර සතළිසකට (40) ආසන්න කාලය තුළ අපගෙන් සමුගනිමින් සදහටම මෙලොවින් වියෝ වූ ගිහි පැවිදි සියලු දෙනාහට වික්ෂෝප මෑණියන්ගේ මධ්‍යස්ථකමින් දෙවි මහෝත්තමයාණෝ ඔවුන් හට ස්වර්ගීය සම්පත් දානය කරන ලෙස අපි අයැද සිටිමු.

### සමාප්ති සටහන

දහසකුත් එකක් කම්කටොළු මැද්දේ බාධක හිරිහැර කරදර විඳ දරා ගනිමින්, අප දයාබර වික්ෂෝප දෙවි මව්ගේ පිළිසරණ පතා, ඕතුමියගේ පාද පද්මය නමදින්නට පැමිණෙන දුර බැහැර සිට මෙන්ම, අවට ගම්වාසී සැදැහැ ජනතාවට ජා-ඇල ග්‍රාමවාසී සියල්ලන්ගේ උත්තමාචාරය හිමිවේ.

අප මව්බිමට ස්ථිර සාමයත්, සහජීවනයෙන් යුතුව එකමුතුකම අග තැන් ගනිමින් සියලු ජන කොටස් එකාමෙන් ජීවත් වීම පසක් කර ගැන්ම සඳහා මෙම නොවාන පීඨකය තෝතැන්නක්ම වේවා! යනු අපගේ ඒකායන පැතුම වේ. මුළු ලෝ පුරා සාමය, සමාදානය, සතුට රජ කෙරේවා! අප රට සියලු සතුරු කරදර හා බලපෑම් වලින් මිදී නිදහස රැකදේවා! අප කිතු සමිඳුන්ගේ මෑණියන් වන සුපෙම්බර වික්ෂෝප දේව අම්මා හට පිදෙන මෙය, එතුමිය හට පූජෝපහාරයක්ම වේවා! යනු අපගේ නිති පැතුමයි.

**එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු**
ජා-ඇල

වෙහෙසෙන මිනිස්සු

# විසිඑක්වන සියවසේ සුපිරි වහල්ලු



ශුද්ධවූ බයිබලයේ නික්මයෑම ග්‍රන්තයේ සඳහන් ප්‍රකාර ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ පාරාවෝ රජුගේ වහල් බවින් මුදවා ගැනීම සඳහා දෙවියන් වහන්සේ ඔවුන්ගේ සුසුම් ලෑම් සහ මොරගෑසීම් වලට සානුකම්පිතව සවන් දී මෝසෙස් තුමාව වහලුන්ගේ මිදුම්කරුවා හැටියට පත්කොට ඔවුන්ව කිරෙන් හා මීපැණියෙන් ඉතිරෙන සාරවත් විශාල දේශයකට පමුණුවාලීය.

1886 මැයි පළමු වැනි දින පැය 24 ක් වූ දිනයකින් පැය 8 කට සීමා වූ රැකියා වැඩමුරයක් පැය 8 කට සීමා වූ විවේක කාලයක් හා පැය 8 කට සීමා වූ අධ්‍යාපනික කාලයක් ඉල්ලා ශ්‍රමික ජනතාව වැඩ වරා, වීදි බැස උද්සෝෂනය හා පෙළපාලි පැවැත්වූහ.

එම වැඩ වර්ජනය හා පෙළපාලියේදී හාම්පුතුන් කුලියට ගත් කුලී හේවායන්ගේ තුවක්කු බට වලින් නිකුත් වූ රුදුරු මාරාන්තික වෙඩි උණ්ඩ වරුසාවෙන් කම්කරු හදවත් පසාරු කොට ඔවුන් අමු අමුවේ මරා දමන ලදි. බුර බුරා උනුවී වැගුරුණු ඔවුන්ගේ රක්තවර්ණ රුධිරයෙන් පෙඟුණු වස්ත්‍ර කොඩි මෙන් ඔසවාගෙන නැවත පෙළපාලි යාම හේතුකොට කම්කරු ධජය රක්තවර්ණ විය. කම්කරු පාට රතුවිය. ඒවනාහි වැඩ කරන ජනතාවට ආවේනික ඔවුන්ගේ ලේවල වර්ණයය, පාටයි, ස්වභාවයයි.

**නිදහස් වෙළෙඳ (වහල්) කලාපය**

නිදහස් වෙළෙඳ කලාප සේවක සේවිකාවෝ අපනයනය සඳහා නිමි ඇඳුම් නිෂ්පාදනය තුළින් අප රටට විදේශ විනිමය උපයා දෙති. අප රටේ ආර්ථිකය ශක්තිමත් කරන විදේශ විනිමය ඩොලර් කෝටි ගණන් ස්වකීය දුක් මහන්සියෙන් හා ශ්‍රම ශක්තියෙන් මෙරටට ගලා ඒමට සලස් වන ඔවුන් නිදහස් වෙළෙඳ (වහල්) කලාපය තුළ තවමත් යාන්ත්‍රික වහලුන්ය.

ශ්‍රී ලංකාවේ ඇඟළුම් කරුවන්ගේ සුබ සාධනය සඳහා වූ මධ්‍යස්ථානය ඇඟළුම් හල් 200 ක තෝරාගත් සේවක, සේවිකාවන් යොදාගෙන කරන ලද සමීක්ෂණයකින් හෙළිදරව් වී ඇත්තේ බොහෝ කම්හල් වල ස්ථිර සේවයෙ 'යාන්ත්‍රික ක්‍රියා කරවන්නන් හට ගෙවනු ලබන්නේ සොච්චම් වැටුපක් බවයි. වධාත්ම පීඩාවට පත්ව සිටින කොටසක් හැටියට සැලකෙන ඇඟළුම් සේවිකාවන්ගේ වැටුප් ඊටත් වඩා අනන්තය. ඇතැම් ඇඟලුම් හල් වල සේවක සේවිකාවන්ට නීත්‍යානුකූලව ගෙවිය යුතු වැටුපටත් වඩා අඩුවෙන් වැටුප් ගෙවන බවද, අති කාල දීමනා නොගෙවීමට ප්‍රයත්න දරණ බවද, බොහෝවිට දීමනා වලින් ගෙ වන්නේ අඩක් පමණක් බවද ඉන් අනාවරණය වී ඇත.

සංස්කෘතික හා සාමාජීය ගැටලු රාශියකට මුහුණ දෙමින්ද බොහෝ විට අතිශය දුඃඛිත නේවාසික ජීවිත ගතකරමින් මහන්සි වන ඇඟලුම් සේවකයන් හා විශේෂයෙන් සේවිකාවන් ලබාගන්නා ලේ කඳුළු වැනි වේතන විවිධ ක්‍රම මගින් සූරා කෑමට ලක්වේ.

ලැබී ඇති ඇතැම් හදිසි ඇනවුම් සංඛ්‍යාව නිම කිරීම සඳහා ගෙවිය යුතු අතිකාල වේතන ගැන කිසිම තැකීමක් නොමැතිව තේ කෝප්පයක් හා බත් වේලක් පමණක් සපයා දී දිනයට නියමිත වැඩ මුරයට අමතරව නොකඩවා එක දිග ටම රාත්‍රි 3 හෝ 4 ක් සේවිකාවන්ගේ ශ්‍රමය හා සේවය සූරා ගෙන ඇති කම්හල් පාලකයන් සිටින බවද එම සමීක්ෂණයෙන් අනාවරණය වී ඇත.

"අප රටේ සම්මත කම්කරු නීති හා අනපනත් අනුව යම් කාන්තාවක් රාත්‍රි 10 සිට උදේ 5.30 වන තෙක් සේවය කිරීමේදී ඒ සඳහා ඒ කාන්තාවගේ කැමැත්ත ප්‍රකාශ කරන ලද අත්සන් පත්‍රයක් තිබිය යුතුය. අතිරේක වේලාවද එම කාන්තාව කරන සේවය සඳහා සාමාන්‍ය වේලාවට ගෙ වන වේතනය මෙන් එකහමාරක ගුණයක් වැඩියෙන් ගෙවිය යුතුය. මේ අයට විවේකාගාර, කෑම් බීම් හා අවන්හල් පහසුකම් සැපයිය යුතුය. එකී කොන්දේසි ඉටුකරන සේවා යෝජකයන්ට පමණයි කම්කරු කොමසාරිස් තුමා බලය දෙන්නෙ."

සම්මත කම්කරු නීතියත්. කම්හල් හිමියන් නීති විරෝධි ලෙස බලයෙන් කාන්තාවන් රාත්‍රි සේවයේ යෙදවීමත් අතර තෙරපෙන එකී කාන්තාවන්ගේ රන් වටිනා ශ්‍රමය සූරා කෑම පිලිබඳව සොයන්නේ, වග කියන්නේ කවුද?

"යුක්තිය නොපිට පෙරලන මානව අයිතිවාසිකම් වලක්වන ඔබට වන විපතක මහත" (අමෝස් 5:7)

"නීතිය පිළිපැදීම බොහො 'යාග පූජා ඔප්පු කිරීමක් වන්නේය. පනත් වලට ඇළුම්ව සිටීම සමගි පූජා ඔප්පු කිරීමක් වන්නේය." (උපදේශකයා 35)

නිදහස් වෙළඳ කලාපයෙ සේවිකාවන් වැඩි දෙනෙක් සිටගෙන වැඩ කිරීම හේතුකොට ගෙන තරුණි ශ්‍රම ශක්තිය සීඝ්‍රයෙන් ක්ෂය වී යෑමේ හේතුවෙන් විවාහ වීමෙන් පසුව දරුවකු ප්‍රසූත කිරීමට තරම් ශක්ති සම්පන්න සිරුරක් හා හිතකර සෞඛ්‍ය තත්ත්වයක් ඔවුනට අහිමි වේ. ඒ පිළිබඳව එක් නිදහස් වෙළඳ කලාප සේවිකාවක් මෙසේ ප්‍රකාශ කළාය.

"මා නිදහස් වෙළඳ කලාපයේ සේවය සඳහා පැමිණ දැනට වසර 8 ක් ගෙවී ගොස් ඇතත් මට ඉතිරිව ඇත්තේ කටුක ජීවිතයක තිත්ත අත්දැකීම් සහ වැහැරී ගිය කෙසඟ සිරුරක් පමණි."

> "දේව සමාන කමට, දේව ස්වභාවයට මවන ලද උතුම් මැවිල්ලක් වන ශ්‍රමිකයාට, වැඩකරන මිනිසාට හිමි ගරුත්වය කෙලසමින් ප්‍රසිද්ධියේ නිගාකරද්දී කම්කරු අභිමානය සහ පිළිගැනීම ඉහත සඳහන් කර ඇති සිදුවීම් තුළින් අහිමි කරද්දී මෛත්‍රිය, කරුණාව, ප්‍රේමය, මිනිස් සිත් සතන් තුළින් පහකරද්දී, වැඩිහිටි සහ තරුණ කම්කරු ජනතාව නියත වශයෙන්ම වහලුන් බවට ඇස් පනාපිට පරිවර්තනය කරද්දී ඔවුන්ගේ රන්වැනි වටිනාකම, ගරුත්වය හා ශ්‍රමයේ අභිමානය ඉස්මතුකරමින් තමාගේ සම්පූර්ණ ජීවිත කාලය තුළම තරුණ ක්‍රිස්තියානි කම්කරු (ත.ක්‍රි.ක) ව්‍යාපාරය නිර්මාතෘ කාදිනල් ජෝශප් කාර්ඩයින් හිමිපාණන් මොරගසා මෙසේ ලොවට ප්‍රකාශ කළහ.කම්කරුවා වහලකුවත්, යන්ත්‍රයක දැති රෝදයක් හෝ බර අදින තිරිසන් සතෙකුවත් නොවේ. ඔහු හෝ ඇය දේව දරුවෙකි. සෑම කම්කරු තරුණ තරුණියකටම නොවෙනස් කළ හැකි මෙහෙයයක් හා සදාකාලික ඉරණමක් ඇත" යන්නයි. "

**නිදහස් වෙළෙඳ කලාපයේ තරුණ ප්‍රාණ පරිත්‍යාගි වරයා**

රජය විසින් කඩි මුඩියේ සම්මත කරගැනීමට උත්සහ දැරූ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනතින් කටුනායක නිදහස් වෙළඳ කලාප කම්කරු තරුණ, තරුණියන් හට අහිතකර ලෙස බලපාන අසාධාරණ කොන්දේසි හා අනපනත් වලට එරෙහිව ගෙන ගිය උද්සෝෂන හා විරෝධතා ව්‍යාපාරය මර්ධනය කිරිමට පොලිසිය විසින් වෙඩි තබා කටුනායක වෙළඳ කලාප සේවක කතෝලික තරුණ කම්කරුවකු වූ රොශේන් ශානක රත්නසේකර සොහොයුරා අමු අමුවේ ඝාතනය කරන ලදි. පුරා වසර 83 ක ශ්‍රී ලංකා කම්කරු අරගල සහ වෙඩි තැබීම් ඉතිහාසයේ පළමුවරට තරුණ කම්කරුවකු ස්වකීය සහෝදර තරුණ කම්කරු ජනතාවගේ විමුක්තියත්, ගැලවීමත් උදෙසා ස්වකීය ජීවිතය මුළුමනින්ම පූජා කරමින් ප්‍රාණ පරිත්‍යාගිවරයකු වූ පළමුවැන්නා රොශේන් ශානක සොහොයුරා බව මෙම මැයි දිනයේදී කෘතවේදිව නැවත මතක්කරගත යුතුව ඇත.

සාමාන්‍ය, සරල දිවි පෙවෙතකට අදාල සිරිත්, විරිත්, ඇවතුම්, පැවතුම් වලින් ලක්වැසි ජනතාව ඉවතට තල්ලු කොට ක්ෂණික, ඉස්තරම්, සුපිරි, සුඛෝපභෝගි, සරුවපිත්තල මානසික ඇබ්බැහියාවකට යොමු කරවන ඇති හැකි අයට සුපිරි ගනයේ සේවාවන් සැපයීමේ අටියෙන් ව්‍යවසායකයේ හා සේව්‍ය පක්ෂයේ ආරම්භ කොට පවත්වාගෙන යන සුපිරි ඇඟළුම් වෙළඳසල් හා සාප්පු සංකීර්ණ සුපර්මාර්කට්, සුපිරි අවන්හල් සහ රස කඩ ආදියෙහි සේවයේ නිරත සේවක, සේවිකාවන්ගේ රැකියා තත්ත්වයන් ඉතාමත් දුඃඛිත දායකය. බැලූ බැල්මට එසේ නොපෙනුනත්, ඔවුන් වනාහි මෙතෙක් නොඇසූ නවීන පන්නයේ සුපිරි වහල් සේවකයන් කොටසකි.

නූතන විලාසිතා හා මෝස්තර ප්‍රචලිතකරනු වස් ආනයනික රෙදි පිළි සහ නිමි ඇඳුම් ඇතුළු රූප ලාවන්‍ය, පාවහන් හා විවිධාකාර භාණ්ඩ අලෙවිකරන සමහර සුපිරි අලෙවිහල් වල වැඩ කරන සේවක කොටස් උදේ 9.00 ට සේවා ස්ථානයට පැමිණිය යුතුයි. පැමිණීමේ ඉතා සුළු ප්‍රමාද දෝෂයක් වුවහොත් එයට දඬුවම වරුවක පඩි කැපීම හෝ එදිනට පඩි රහිතව පෙරලා ගෙදර යැවීමයි. පළමුවෙන්ම බුදුබණට කන්දී, පිළිපැදිය යුතු, දිනයට නියමිත, උපදෙස් වලට සවන්දී, ජාතික අභිමානය නැංවීම සඳහා ජාතික ගීය ගයා ආරම්භ කරන දිනයේ වැඩ මුරය රාත්‍රි 10.00 දක්වා එක දිගටම නොකඩවා කළ යුතු අතර ඉතාමත් හදිසි අවස්ථාවක් වූවත් සේවා ස්ථානයෙන් බැහැර යෑමට අවසර නැත.

දිවා ආහාර වේලාව හැර අන් සෑම අවස්ථාවකම හිටගෙන වැඩ කළ යුතුය. අසනීපයකදී වූවත් වාඩිවීමට පුටුවක් වත් නැත. දිනයේ වැඩ වුරය අවසන් වන විට එකී සේවකයන් හට හිසරදය, පිටකොන්ද රිදීම හා දෙපා ඉදිමීම හට ගැනේ. එය එසේ වූවත් අසනීප නිවාඩුවක්නම් ගත නොහැක. අසනීප වූ විටෙක වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කලහොත් පාලකයාගේ අභිමතය පරිදි එම සහතිකය ප්‍රතික්ෂේප කිරීම, දඬුවම වශයෙන් දිනක පඩි කැපීම හා පහල තත්ත්වයේ තනතුරකට හෙලා දැමීම හෝ රැකියාවෙන් අස්කිරීම අනිවාර්යයෙන්ම සිදු කෙරේ. මන්දයත් මෙකී සේවකයන්ට සේවා කොන්දේසි අන්තර්ගත පත්වීමේ ලිපියත්, නියමිත නිවාඩු ප්‍රමාණය සති අන්ත නිවාඩු වැටුප්තලය, අතිකාල ගාස්තු සේවය ස්ථිර කරන කාලය ගැන කිසිම ලිපියක් නොසැපයේ. කාලයක් සේවය කළත් සේවය ස්ථිර කිරීමේ ලිපියක් නම් කිසි විටෙක නොසැපයේ. ඉරුදින ඇතුළු සතියේ දින 7 ම රැකියාව කළයුතු අතර පෝය දිනයන්හි දී පවා අවශ්‍ය වැඩ කිරීම අනිවාර්ය කරනු ලැබේ. මෙකී දිනයන් හිදී පවා ගෙවීම් කරනු ලබන්නේ සාමාන්‍ය ගෙවීම් කරන පරිදිය. මෙයාකාරයෙන් පාලකයන්ගේ අභිමතය පරිදි සේවකයන් රැකියාවෙන් නෙරපීමේ අසීමිත බලය හා අවකාශ පාලක පන්තිය සතුකර ගෙන ඇත.

මෙවන් අසාධාරණ තත්ත්වයන් යටතේ වැඩ කරන සේවක/ සේවිකාවන් හට ඔවුන්ගේ රැකියා ස්ථානය අපායකි. සුපිරි වහල් කඳවුරකි. සිපිරි ගෙයකි. මෙම ක්‍රමය පාලක පැලැන්තියට ගජවාසියකි. මන්දයත් අස්වී යන සේවකයන් සඳහා වාර්තා ගොනු කිරීම. පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම අනවශ්‍යවන හෙයිනි. ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් (E.P.F) සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ (ETF) සේවය දායකත්වය ඉබේම අහිමි කෙරේ. මාසයට නියමිත සේවක වැටුප් ගෙවනු ලබන්නේ අනිත් මාස 10 වැනි දින හෝ 15 වැනි දීය. එතෙක් මෙම සේවකයන් යැපෙන්නේ කෙසේද? රැකියාව එපාවී අස්වී යන සේවකයන් වැටුපේ හිඟ මුදල් ලබා ගැනීමට අඩුතරමින් මාස තුනක් මිඩංගු කළ යුතුය. මේ වනාහි අද පවතින සුපිරි ආයතනවල සුපිරි වහල් සේවයේ යෙදෙන්නන් මුහුනපාන ගැටලු වලින් ස්වල්පයකි.

නියමිත දිනට වැටුප් නොගෙවීමේ රෝගය දැන් දැන් වෙනත් ආයතන වලටත් බෝවීමේ ප්‍රවනතාවයක් ඇත. පසුගිය දිනවල ලංකා ගමනාග මන මණ්ඩලයේ විවිධ පළාත්වල පිහිටි ඩිපෝවල සේවකයන් වැඩ වර්ජනය කළේ ඔවුනට මාසයේ එක් නිශ්චිත දිනයක වේතන ගෙ වන ලෙස ඉල්ලා උද්සෝශනය කරමිනි.

කම්කරු අණ පනත් සම්මත වී ඇත්තේ හුදෙක් කම්කරුවන් උදෙසා වූවත් රජය දකුනු අතින් දුන් සේවක වරප්‍රසාද රජය විසින්ම ඒවා වම් අතින් නැවත ඩැහැ ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටීමයි. උදා: වෘත්තීය සමිති ආඥා පනතින් රැකියා කරන ජනතාවගේ වෘත්තීය සමිති අයිතින් පිළිගෙන තහවුර ැකළත් හදිසි අවස්ථා විදි විධාන පනත හා අත්‍යවශ්‍ය සේවා පනත ප්‍රකාශ කිරීම තුල ඉහත සඳහන් අයිතීන් නිශ්ප්‍රභ කෙරේ. ඊටත් වඩා නවීනතම ක්‍රියා මාර්ගය වී ඇත්තේ එවන් අවස්ථා පොදු ජනයාගේ යහපත සඳහා යැයි කියමින් අධිකරණ වාරණ නියෝගයන් ප්‍රකාශයට පත්කොට නීතිමාර්ග යෙන් තහනම් කිරීමයි. පරිපූරක වෛද්‍ය සේවා මණ්ඩලය ආරම්භ කළ වැඩ වර්ජනය 2012 මාර්තු මස 21 වැනි දින සිට නතර කිරීමට සිදුඋනේ අධිකරණ නියෝගයට ගරු කිරීම හා හිස නැමීමක් වශයෙනි.

**ධීවර ජනතාව වෙනුවෙන් දිවි පිදු පළමු කතෝලික ධීවර කාර්මිකයා**

හලාවත එගොඩ වැල්ල ධීවර කාර්මිකයින් භූමිතෙල් මිල පහත හෙලන ලෙස ඉල්ලා කළ උද්සෝෂනයේදී ලංකා ඉතිහාසයේ පළමුවැනි වරට 33 හැවිරිදි කතෝලික තරුණ ධීවර කාර්මික දෙදරු පියෙකු වන ඩබ්. ඇන්ටනි ප්‍රනාන්දු සහෝදරයාගේ වටිනා ජීවිතය ආරක්ෂක භටයින්ගේ වෙඩි උණ්ඩයකට ගොදුරුවී අමු අමුවේ ඝාතනයට ලක්විය. ධීවර යාත්‍රාව පමණක් නොව තම ආදරණීය බිරිඳ ඇතුළු දරු දෙදෙනා (සිය පවුල) හැර දමා සහොද්‍ර ධීවර කාර්මිකයින්ගේ රැකියා අයිතිය, පහසුකම්, සංවර්ධනය හා විමුක්තිය සොයා ගිය ගමනේදී ස්වාමින් වහන්සේ වෙනුවෙන් වේඩිකා දිවි පිදීම තුළ ඔහු කුරුසිය දරාගෙන සම්පූර්ණයෙන්ම හිස් විය. නම මසක් ඇතුලත කම්කරු රණ බිමෙහි දිවි පිදු දෙවැනි ප්‍රාණ පරිත්‍යාගි වරයා ඇන්ටනි සොහොයුරාය. මෙවර සමරණ මැයි දිනයේදී ඔහුව නැවතවරක් කෘතවේදිව සිහිපත් කරන්නේ ඔහුට පුදනා ගෞරවාන්විත පූජා උපහාරයක් වශයෙනි.

දේව සමාන කමට, දේව ස්වභාවයට මවන ලද උතුම් මැවිල්ලක් වන ශ්‍රමිකයාට, වැඩකරන මිනිසාට හිමි ගරුත්වය කෙලසමින් ප්‍රසිද්ධියේ නිගාකරද්දී කම්කරු අභිමානය සහ පිළිගැනීම ඉහත සඳහන් කර ඇති සිදුවීම් තුළින් අහිමි කරද්දී මෛත්‍රිය, කරුණාව, ප්‍රේමය, මිනිස් සිත් සතන් තුළින් පහකරද්දී, වැඩිහිටි සහ තරුණ කම්කරු ජනතාව නියත වශයෙන්ම වහලුන් බවට ඇස් පනාපිට පරිවර්තනය කරද්දී ඔවුන්ගේ රන්වැනි වටිනාකම, ගරුත්වය හා ශ්‍රමයේ අභිමානය ඉස්මතුකරමින් තමාගේ සම්පූර්ණ ජීවිත කාලය තුළම තරුණ ක්‍රිස්තියානි කම්කරු (ත.ක්‍රි.ක) ව්‍යාපාරය නිර්මාතෘ කාදිනල් ජෝශප් කාර්ඩයින් හිමිපාණන් මොරගසා මෙසේ ලොවට ප්‍රකාශ කළහ.

කම්කරුවා වහලකුවත්, යන්ත්‍රයක දැති රෝදයක් හෝ බර අදින තිරිසන් සතෙකුවත් නොවේ. ඔහු හෝ ඇය දේව දරුවෙකි. සෑම කම්කරු තරුණ තරුණියකටම නොවෙනස් කළ හැකි මෙහෙයයක් හා සදාකාලික ඉරණමක් ඇත" යන්නයි.

**විවියන් සිල්වා**



*මාතලේ දිසාවේ පශ්චත්තාප දිනය ඉකුත්දා පැවැත්වුණි. මාතලේ දිසාවේ මීසම් හයක් මාතලේ, රොටවැව, වහකෝට්ටේ, නිකවැහැර, මහනුවර, මහවෙල මීසම් වලින් ඉතා විශාල ගිහි ජනතාවක් මෙයට සහභාගි වූහ. චතාරික දේශන සිංහලෙන් ගරු අයිවන් ජයසුන්දර, දෙමහලෙන් ගරු අමිල් පියතුමන් විසින් පවත්වන ලදී.*

දිව්‍ය පූජාව මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මේ මෙහෙය දිසා නායක ගරු ඩිලාන් ප්‍රනාන්දු හා වහකෝට්ටේ ජාතික සිද්ධස්ථානය පාලක ගරු යොවාන් සවරියමුත්තු පියතුමන් විසින් සංවිධානය කරන ලදී.

**(ඒ.ආර්.ඇන්. මඩසේකර)**



කටුවපිටිය සා. සෙබස්තියන් දෙව්මැඳුරේ මහ සිකුරාදා දින පැවති තුන්පැය ධ්‍යානය දේව මෙහෙයෙන් පසු ශ්‍රී කුරුස සිපාචාර කිරීම සඳහා බැතිමතුන් මෙසේ පෙළ ගැසී සිටි අවස්ථාව හා ශ්‍රී කුරුස සිපාචාර කරන ඉතාමත් ගෞරවනීය අවස්ථාවයි මේ. මෙම අවස්ථාවන් මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු පියතුමා සහය මීසම් සේවක ගරු ජූඩ් සුරේෂ් පියතුමන්ලාගේ මූලිකත්වයෙන් සිදු කරන ලදී. **(සේයා - ඇග්නස් සියඹලාපිටිය)**



පමුණුගම මීසමේ ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහිපත් කරමින් තුන්පැය ධ්‍යානය පමුණුගම පාස්කු මණ්ඩපයේදී පැවැත්විණි. ශා. ජෝශප් මිතුරු කළ මෙය සංවිධානය කළ අතර මීසම් සේවක ගරු ආනන්ද විතාන, ගරු මංජුල නිරෝෂන් ගරු චින්තක පෙරේරා පියතුමන් ශ්‍රී වාක්‍ය දේශනා කරමින් ජනතාව ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්තිය කෙරෙහි යොමු කළහ.

**(සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**



තිබ්බොටුගොඩ මීසමට 125 වන ජුබිලි වසර වෙනුවෙන් ශාන්ත වින්සෙන්ති පාවුලා සමිතිය සංවිධානයෙන් සහ මීසම් සේවක ගරු රංජිත් ටෙරී පියතුමාගේ මෙහෙය වීමෙන් නොබෝදා දේවස්ථාන භූමියේදී අක්ෂි සායනය, වෛද්‍ය සායනය සමග ඇන් කන්නාඩි බෙදා දීමත් සමග ලේ දන් දීමේ ප්‍රජා සත්කාර සේවාවක් පවත්වන ලදී. ගණේමුල්ල සිංහ සමාජය සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය අනුග්‍රහයෙන් අසරණ පවුලකට රෝද පුටුවක් පරිත්‍යාග කරන අවස්ථාව මෙහි දැක්වේ.

**(කැලිස්ටස් ඇන්ටනි)**

## රත්මලානට ජුසේ මුනි නව ප්‍රතිමාවක් !



රත්මලාන සා. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මීසම් සේවක රොනී වික්‍රමසිංහ පියතුමාගේ ඉල්ලීම පරිදි මැයි මස 1 වන දින පවත්වනු ලබන වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් මොරටුවේ රේමන් ප්‍රනාන්දු මහතා විසින් මැහෝගනී දැවයෙන් නිර්මාණය කරන ලද අඩි 22 ක් උසැති කම්කරු ජුසේ මුනිඳුන්ගේ මෙම පිළිරුව ඒ මහතාගේ 85 වන නිර්මාණයකි. එදින සැදැහැවතුන් ආසිරි ගැන්වීම සිදු කෙරෙනුයේද මෙම පිළිරුවෙනි. එය ජයන්ත පීරිස් මහතාගේ ප්‍රදානයකි. **(ඇන්ටනි ක්‍රිස්ටෝෆර්)**

# ගරු ඩී. එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා සග සුව දිනයි

සිය 59 වසරක පූජක දිවියෙන් වසර 51 ක් සක්‍රියව සමිඳුන්ගේ එඬේර සේවයේ යෙදෙමින් හලාවත පදවියට අනුපමේය සේවයක් කළ දියගු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා වසර 87 කුත් මස 06 ක් ආයු වළඳා අප්‍රේල් මස 07 වැනි දින ස්වර්ගස්ථ විය.

1924 ඔක්තෝබර් මස 11 වැනි දින හලාවතදී උපත ලද එතුමා හලාවත ශාන්ත මරියා පිරිමි පාසලේ මූලික අධ්‍යාපනය හදාරා පසුව ශාන්ත මරියා විදුහලේද කොළඹ ශාන්ත ජෝශප් විදුහලේ හා වෙන්නප්පුව ජෝශප් වාස් විදුහලේද අධ්‍යාපනය ලැබීය. ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය සමත්වීමෙන් පසු මාස හයක කාලයක් ජෝශප් වාස් විදුහලේ ගුරු වෘත්තියේ යෙදුනු එම්මානුවෙල් පියතුමා 1946 දී අම්පිටියේ පාප්තුමාගේ දෙව්සත්හලට (වර්තමාන ජාතික දෙව්සත්හලට) ඇතුළු විය. දෙව්සත්හලේදී දර්ශනවාදය හා දේව ධර්මය හැදෑරූ එතුමා ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේය.

1953 අගෝස්තු 24 වැනි දින දෙව්සත්හලේදී එවක ත්‍රිකුණාමලය රදගුරු අති උතුම් ඉග්නේෂස් ග්ලෙනි හිමිපාණන් අතින් පූජකවරය ලද අප පියතුමා හලාවත පදවි පූජක සේවයට එක්විය. එතුමාගේ මුල්ම පත්වීම කටුනේරිය මීසමේ සහයක ලෙස විය. 1954 සිට පස් වසරක් එම මීසමේ සේවය කිරීමෙන් පසුව 1959 දී එම්මානුවෙල් පියතුමා පොල්ගහවෙල මීසම භාරව පත්වීම් ලැබීය. එම මීසමෙහි එතුමාගේ සේවය දෙවසරකට සීමාවූ අතර එම කාලය තුළ එහි ශාන්ත බර්නදෙත් විදුහලේ කළමණාකරු තනතුරද දැරීය.

1960 දී මාරවිල ශාන්ත පාවුළු දෙව්සත්හලේ අධ්‍යක්ෂ ධූරයට පත්කරනු ලැබූ එතුමා 1961 දී වැඩිදුර අධ්‍යාපනය සඳහා රෝමය ලබා පිටත්විය.

රෝමයේදී දේව ධර්මය, ජන වන්දනාව හා මනෝ විද්‍යාව හැදෑරූ පියතුමා ආචාර්ය උපාධියෙන් උසස් ලෙස සමත්විය. එම කාලය තුළ එතුමා තරුණ සේවාවන් අරබයාද විශේෂඥ දැනුමක් අත්කර ගත්තේය. 1964 දී පෙරලා ශ්‍රී ලංකාවට පැමිණි එම්මානුවෙල් පියතුමා යළි ශාන්ත පාවුළු දෙව්සත්හලෙහි අධ්‍යක්ෂ පදවියට පත් කරනු ලැබීය. දෙව්සත්හලෙහි පූජක සිසුන් විනයකාමී හා ජනතා සේවය මුල්තැන්හිලා සලකන පිරිසක් කිරීමට එම්මානුවෙල් පියතුමා ඇප කැපවිය. එතුමා අතින් පුහුණුව ලබා පූජකවරය ලද සිසුන් මෙන්ම විවිධ හේතූන් මත දෙව්සත්හල අත්හැර ගිය සිසුන්ද එතුමාගේ ජීවිතයේ අවසානය දක්වාම නිතර එතුමන් බැහැදැකීමට පැමිණීම සුලබ දසුනක් විය.

1969 දී යළි මීසම් සේවයට එක්වූ පියතුමා ඉරබඩගම මීසම් සේවක ලෙස පත්වීම ලැබීය. එවකට නොදියුණු ප්‍රදේශයක්වූ ඉරබඩගම හා මීසමට අයත් ගම් දනව් වල ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතය මෙන්ම සාමාජීය ජීවිතයද නංවාලීමට වෙහෙස වී කටයුතු කළ පියතුමා පෙර පාසල් ගමක් පාසා ආරම්භ කළේය.

1973 දී එම්මානුවෙල් පියතුමා තලවිල ශාන්ත ආනා සිද්ධස්ථානයේ පාලක ලෙස පත්වීම ලැබීය. අද මෙන් පහසුකම් නොතිබූ එම අවදියේ තලවිල කරා පැමිණි වන්දනාකරුවනට වූව සැපයුනේ සීමිත පහසුකම්ය. තලවිල ගම්වාසීන් ජීවත් වූයේද දැඩි දුෂ්කරතා මධ්‍යයේය. සිද්ධස්ථානය සංවර්ධනය කරන අතරම ගම්වාසීන්ගේ ආර්ථිකය නගාසිටුවීමටද එතුමා පියවර ගත්තේය. හලාවත පදවි සෙඩෙක් ආයතනය, සර්වෝදය සංවිධානය හා ඕලන්දයේ සෙබෙමෝ ආයතනය සම්බන්ධ කරගනිමින් විවිධ ව්‍යාපෘති හරහා ජන ජීවිතයේ සංවර්ධනයක් ඇති කිරීමට එතුමාට හැකිවිය. තරුණ ප්‍රජාවට ආදායම් මාර්ග විවර කරමින් එතුමා තලවිල ප්‍රදේශයේ තරුණ සමූහ ගොවිපල තුනක්ද ආරම්භ කළේය.



එම වකවානුවේ සුළු වශයෙන් එළවළු වැවීම හැර තලවිල ප්‍රදේශයේ ප්‍රධාන වගාව වූයේ දුම්කොළය. තලවිල මීසම් ගෘහ භූමියේ රතුලූනු වගාව අත්හදා බැලූ අප පියතුමා එහි සාර්ථකත්වය පෙන්වා ප්‍රදේශයේ ගොවීන් රතුලූනු වගාවට යොමු කර ඔවුන්ගේ ආර්ථිකය සවිමත් කළේය. දැනට මෙරට ප්‍රධානතම රතුලූනු වගා ප්‍රදේශය වන කල්පිටිය අර්ධද්වීපයේ එම වගාවේ පුරෝගාමියා ලෙස එතුමාගේ නම ඉතිහාසගත වේ. තලවිල ජලමාල නිකායේ කන්‍යාරාමය මෙන්ම කුරිඤ්ඤම්පිටියේ ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයද එතුමාගේ යුගයේදී බිහිකරන ලද ඒවාය. තලවිලට නුදුරු කන්දකුලියේ හා කෝවිල්මුනේ පාසල් ආරම්භ කරන ලද්දේද මෙම පියතුමාගේ මූලිකත්වයෙනි.

තලවිල මීසමේ වසර හතක ඉතා වෙහෙසකර එහෙත් සාර්ථක සේවා කාලයකින් පසු එම්මානුවෙල් පියතුමා පත්කරන ලද්දේ කටුනේරිය මීසම් සේවක ලෙසය. 1980 සිට 1986 දක්වා කටුනේරියේ සේවයෙන් පසු 1987 දී නිවාඩුවක් සඳහා එක්සත් ජනපදයට ගිය පියතුමා වසරක කාලයක් නිව්යෝක් අගරදගුරු පදවියේ මීසමක සහයක පියතුමා ලෙස කටයුතු කළේය.

1988 දී යළි ලංකාවට ළඟා වීමෙන් පසු අප පියතුමා හලාවත පදවි පවුල් අපෝස්තලික සේවාවේ අධ්‍යක්ෂ ලෙස පත්කරනු ලැබීය. තමන් වෙත පැවරෙන කවර මෙහෙවරක්වුව කැපවීමෙන් ඉටුකිරීම අරමුණු කරගත් පියතුමා පවුල් සේවාව පදවියේ සෑම අස්සක් මුල්ලක් නෑර ගෙනයමින් සේවා විමධ්‍යගත කළේය. මාරවිල, නයිනමඩම හා පාලකුඩාවේ පවුල් සේවා මධ්‍යස්ථාන බිහිවූයේ එතුමාගේ මෙහෙයවීමෙනි. විවාහපේක්ෂිත පවුල්වලට සීමාවී තිබූ පෝෂණ වැඩසටහන් විවාහ වූ යුවල් සඳහාද පැවැත්වීම එම්මානුවෙල් පියතුමාගේ සංකල්පයක් විය. පවුල් සේවාවට සම්බන්ධව සිටියදී එතුමා හලාවත පදවි සභා අධිකරණයටද සිය සේවය ස්වෙච්ඡාවෙන් ලබාදුන්නේය.

1995 දී පවුල් සේවාවෙන් ඉවත්වී අඹකදවිල මීසමේ මැදවත්ත දෙව්මැඳුර සිය නවාතැන කරගත් එම්මානුවෙල් පියතුමා එම ධීවර ගම්මානයේ ජනතාව සඳහා විශාල සේවයක් ඉටු කළේය. ගම්වාසීන් හට විටෙක ආදරබර පියෙකු විටෙක දයාබර සොහොයුරෙකු වූ එතුමා කෙරෙහි ඔවුන් තුළ වූයේ දැඩි ආදරයකි. බැඳීමකි. මිනිසුන් අතර ජීවත් වීමට දැඩි කැමැත්තක් දැක්වූ පියතුමා සිය දිවියේ අවසානය ගත කිරීම සඳහා තෝරාගත්තේ පදවියේ විශ්‍රාමික පියතුමන් සඳහා වූ පූජක නිවහන නොව ලන්සිගම ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයය.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉතාමත් අල්පේච්ඡ ජීවිතයක් ගත කළ එම්මානුවෙල් පියතුමා සතුව තිබුණේ අත්‍යවශ්‍ය භාණ්ඩ කීපයක් පමණි. එතුමා සරළ දිවියක් ගතකළ තවුසකු විය. එතුමාගේ ජීවිතයේඑකම අරමුණ වූයේ දෙවියන් වහන්සේටද දේව ජනතාවටද සේවය කිරීමය. දෙවියන් වහන්සේගේ එම යහපත් දාසයා සිය මැවුම්කාරයාණන් වෙත හැරී ගියේ සිය පූජක ජීවිතයේ වගකීම් අකුරටම ඉටු කිරීමෙන් පසුවය.

**(ලිඩ්වින් කිරිඇල්දෙණිය)**

## ගාල්ල පදවියේ ක්‍රිස්තු සංචාර වැඩපිළිවෙලක්

*දේව වචනයේ වසර තුළ දේව වචනය පවුල් වෙත ගෙන යාමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට මරිය හමුදා සේනාටස් සභාව පියවර ගෙන ඇත. මේ අනුව මරිය හමුදා ජාතික අධ්‍යක්ෂ රොනී පොන්සියස් පියතුමාගේ මග පෙන්වීම යටතේ සෙනාටස් සභාපති නිව්ටන් ප්‍රනාන්දු සහෝදරයා සකස් කළ වාර්ෂික වැඩ සටහනට අනුව පළමුවෙන්ම ගාල්ල පදවියේ ක්‍රිස්තු සංචාරයක් සිදු කිරීමට පියවර ගෙන ඇත.*

ඒ අනුව පසුගිය දිනක සෙනාටස් සභාපති නිව්ටන් ප්‍රනාන්දු හා කොමිටිසියම් ලේකම් බෙනී ජයමාන්න සහෝදරවරු ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන් හා මරිය හමුදා පදවි අදියුරු බීඩ් සිල්වා ගරු පියතුමා හමුවී කළ සාකච්ඡාව අනුව ගනේගම මීසම් සේවක ගරු බොනිපස් පෙරේරා ගරු පියතුමන් පළමුව තම මීසමෙන් ක්‍රිස්තු සංචාරය ඇරඹීමට කළ ආරාධනය කොළඹ අප ස්වාමිදූගේ කොමිටිසියම් සභාව සෙනාටස් සභාපති සහෝදරයාගේ හා මරිය හමුදා ජාතික අදියුරු පියතුමාගේ මග පෙන්වීම අනුව පිළිගෙන ඇත.

**(බෙනී ජයමාන්න)**



මීගමුව සාන්ත පීතර දේවස්ථානයේ කුරුස යාගික ජනතාව චතාරික දින 40 පුරාම පාදනමස්කාරය නැමැති භක්ති අභ්‍යාසයෙහි යෙදුනහ. එම ජනතාව මහත් භක්තියෙන් පාද නමස්කාරයෙහි යෙදී සිටි අයුරු. **(රේමන්ඩ් අපෝන්සු)**

## පළමු මහ බ්‍රහස්පතින්ද අද වාර්ෂික සළකුණක් පමණි

*තම ප්‍රතිවාදියා මරා දමා හෝ සිරකර තබා තම නායකත්වය රැක ගන්නට වර්තමාන ශ්‍රී ලාංකීක දේශපාලකයා කටයුතු කරනු පෙනේ. කතෝලික සභාවෙහිද සමහර නායකයන් තම අභිමතය වෙනුවෙන් අසරණයන් පාගා දමා ධර්මය වෙනුවට අධර්මය තම මීසම් තුළ පතුරවනු පෙනේ යැයි පසුගියදා දෙහිගහපිටිය මීසම් සංඝයේ කොටසක් සහ පමුණුගම මීසම් සංඝයේ කොටසක් එක්ව කඩුගොඩ කල්වාරි පුදබිමේ පැවති දිව්‍ය යාගයේ දේශනය පවත්වමින් දිව්‍ය සත්ප්‍රසාද නිකායේ ආධුනික තාපසාරාමයේ අධිපති අතිගරු සජීවද සිල්වා හිමිපාණෝ ප්‍රකාශ කළහ.*

එදා පළමු මහ බ්‍රහස්පතින්දා පාද සෝදා කිතු සමිඳුන් දෙසූ ධර්මය අද වාර්ෂික සළකුනක් පමණක් වී තිබේ. ආදරය වෙනුවට මීසම් තුළ ගලා යන්නේ වෛරයයි, පලිගැනීමයි. එදා තමා සේවකයකු යැයි අප ස්වාමීන් වහන්සේ පැවසුවද අද පාලකයෝ එසේ දකින්නට ඇත.

අද ශ්‍රී ලාංකීය දේශපාලනය මඩ වගුරකි. තමාට පෙර රට යැයි කීවත් අද රටට පෙර තමා හා තම පෙළපත ගලා යයි. තම අභිමතය වෙනුවෙන් තම නායකත්වය රැකගනු පිණිස ඕනෑම කෙනෙකු මරා දැමීමට වුවද සිරකිරීමට වුවද අද දේශපාලකයා පෙලඹෙනු පෙනේ. මෙය ඉතා අවාසනාවන්ත තත්වයකි. අප ස්වාමීන් වහන්සේ මිනිසත් බව ගත්තේ සේවය කරන්නට මිස සේවය ලබන්නට නොවේ යයි උන්වහන්සේ වැඩිදුරටත් පැවසීය.

කඩුගොඩ කල්වාරි පුදබිමට පැමිණි දෙහිගහපිටිය හා පමුණුගම මීසම් සංඝය එක්ව පැවැත්වූ පාදනමස්කාරයේදී සජීවද සිල්වා පියතුමන් අර්ථාන්විත මෙනෙහි කිරීම් වලින් ජනතා අධ්‍යාත්මික පෝෂණය වර්ධනය කරන්නට යුහුසුලු විය.

මෙම මීසම් දෙකේ ජනතාව කඩුගොඩ කල්වාරි පුදබිමට විශේෂ මුදල් පරිත්‍යාගයක් සිදු කළේය.

**(ජයසිරි ප්‍රනාන්දු)**

# ශ්‍රී ලංකාවේ සැලේසියාන නිකායේ ප්‍රථම පියතුමා ගරු එම්මානුවෙල් ජාන්ස් (සැ.නි.)



*හලාවත පදවියේ බොරලැස්ස මීසමේ පදිංචිව සිට නැසීගිය ස්ටීවන් ජාන්ස් සහ මරිය මර්දලේනා යන දෙමව්පියන්ට දාව පවුලේ සිව්වැන්නා වශයෙන් එම්මානුවෙල් ජාන්ස් දරුවා මෙලොව එලිය දැකීය. ඔහුගේ දෙමව්පියන් බොරලැස්ස මීසමේ ඉතාමත් භක්තිමත් ආගමට ලැදි පවුලක්වූ අතර එම්මානුවෙල් ජාන්ස්ගේ පියා එම දෙව්මැඳුරේ අන්නාවි වරයකු වශයෙන් දීර්ඝ කාලයක් සේවය කළේය.*

එම්මානුවෙල් ජාන්ස් කුඩා කාලයේ සිටම පූජා ප්‍රසාදිවරයකු වීමට සිහින මවමින් සිටියේය. ඒ ආශාව වඩාත් තහවුරු උනේ දොමිනික් සාමියෝ පූජා උදව් සමිතියෙනි. එම්මානුවෙල් ජාන්ස් කුඩා කල සිටම නොයෙකුත් රෝගාබාදයන්ගෙන් පෙලුන නිසා ඔහුට සියලුම නිකායන් දෙව්සත්හල්වල දොර වැසුනි. එහෙත් එයින් අධෛර්යට පත් නොවූ ඔහු යම් දවසක පූජා ප්‍රසාදිතුමෙකු වීමේ අදහස අත්නොහැර ජීවත් විය.

මේ අතරතුරදී ඔහුගේ ජීවිතයේ ඉතාමත් දුක්බරිතවූත් අමිහිරිමවූ දිනය උදාවිය. එනම් 1960 මැයි මස 19 වන දිනයයි. එදින එම්මානුවෙල් ජාන්ස්ගේ මව ඇතුළු ඥාතීන් පස් දෙනෙකු එම්මානුවෙල් ජාන්ස්ගේ ඇස් ඉදිරිපිටදීම දුම්රිය හා මෝටර් රථ ගැටුමෙන් මරණයට පත්විය. එම වාතාවරණය යටතේම එම වසරේ අ.පො.ස සා.පෙළ විභාගයට පෙනී සිටි ඔහු ඉතා විශිෂ්ඨ ලෙස සමත්විය. ඉන්පසුව සිය පියාගේ ව්‍යාපාර කටයුතු වලට ඔහුද සම්බන්ධ විය. පවුලේ දිනපතා ජපමාල යාච්ඤාව කිසිදිනක අමතක නොකළ ඔහු ඇඩූ කඳුලින් සිය දේව කැඳවීම සාර්ථක වීමට යාච්ඤා කළේය.

1962 දී බණ්ඩිරිප්පුව මීසමට අයත් බොරලැස්ස මීසමේ සේවය කළ ගංවතුරේ වීරයා ලෙස නම් දැරූ බෙල්ජියම් ජාතික ගරු මයිකල් ඩුමෝටියර් පියතුමාගේ මාර්ගයෙන් එම්මානුවෙල් ජාන්ස් නොසිතූ අවස්ථාවක ශ්‍රී ලංකාව තුළ දොන් බොස්කෝ සැලේසියාන නිකාය ආරම්භ කිරීමට කටයුතු කරන ලද ගරු හෙන්රි මොරිස් රෙමරි බෙල්ජියම් ජාතික පියතුමා හමුවිය. ගරු මයිකල් ඩුමෝටියර් පියතුමා ගරු රෙමරි පියතුමාට එම්මානුවෙල් තරුණයා හඳුන්වා දී ඔහුගේ දේව කැඳවීමේ අදහස ගැන විස්තර කරන ලදී.

ගරු රෙමරි පියතුමා විසින් එම්මානුවෙල් ජාන්ස තරුණයාට මාසයක පමණ කාලයකට පැමිණ බලන ලෙස ඉල්ලීය. දින 4 කින් ගරු රෙමරි පියතුමා නැවත සිටි ඒත්තුකාල දෙව්මැඳුරට පැමිණෙන ලෙස ඔහුට දන්වන ලදී. එම අවධියේ ළමුන් 8 දෙනෙකු සමග රෙමරි පියතුමා නැවතී සිටියේ මීගමුව ඒත්තුකාල මීසම් ගෘහයේය. කෙසේ වෙතත් එම්මානුවෙල් තරුණයාගේ පෙර තිබූ රෝගී තත්වයන් ගැන කිසිදු චකිතයක් මතු නොවීය.

ඉන්පසුව වසරකට පසුව වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ චෙන්නායි ප්‍රාන්තයේ තිරුපත්තූර් දිව්‍ය හෘර්දයේ සැලේසියාන පුහුණු ආයතනයට ඔහු ඇතුල් විය. 1966 - 67 වර්ෂ වල සැලේසියාන නිකායේ ආධුනිකාරාමයට ඇතුළුවී පළමු වේද පොරොන්දුව තුළින් සැලේසියාන නිකායේ තාවකාලික සාමාජිකයෙකු විය. ඉන්පසුව වසර 2 ක කාලයක් දර්ශනවාය පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන ලදී. ඉන් අනතුරුව මීගමු ඒත්තුකාල කාර්මික විදුහලේ සේවය සඳහා ඔහු පැමිණියේය. වසර 2 ක සේවයෙන් පසුව ඔහු දේව ධර්මය හැදෑරීම සඳහා නැවත ඉන්දියාව බලා පිටත්විය.

ඉන් වසර 4 කට පසුව එනම් 1974 දෙසැම්බර් 20 වන දින බොරලැස්ස ශාන්ත ආනා දෙව්මැඳුරේදී එවකට හලාවත රදගුරු අති උතුම් දේව ධර්මාචාර්ය ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් අතින් එම්මානුවෙල් ජාන්ස් සහෝදරතුමා පූජකවරය ලැබීය. සැලේසියානු නිකායේ ප්‍රථම ශ්‍රී ලාංකීක පියතුමා වීමේ භාග්‍ය එදින ඔහුට ලැබුණි. එය ශ්‍රී ලංකාවේ දොන් බොස්කෝ සැලේසියානු නිකායට මෙන්ම මුළු මහත් රටටම ආඩම්බරයක් විය. "ඔබට මා මව්කුසේ සිටම මේ තනතුර දක්වා සූදානම් කළෙමි" යන බයිබලයේ සඳහන් වැකිය මෙයින් මොනවට පැහැදිලි වේද?

1975 මැයි 24 වන දින සිට මීගමුව දොන් බොස්කෝ කාර්මික විදුහලේ සහ දෙව්සත්හලේ අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරන ලදී. එම කාලය තුළදී ශ්‍රී ලංකාව තුළ සැලේසියාන නිකාය නියෝජනය කිරීමේ නිල නියෝජිතයා වීමේ වගකීමද ඔහුට පැවරුනි.

1987 දී දංකොටුව සැලේසියාන නිකායේ දෙව්සත්හල පිහිටා ඇති ඉඩම මිළයට ගෙන එහි ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු ද ඔහු ආරම්භ කරන ලදී.

ඉන්පසුව කොළඹ පදවියේ හැඳල පල්ලියවත්ත වැල්ල පල්ලිය මීසම සැලේසියාන නිකායට භාරග නිමින් එහි පළමු මීසම සේවක පියතුමා වශයෙන් කටයුතු කිරීමද ඔහුට බාර විය. මීසම්වාසීන් සැමගේත්, ප්‍රදේශයේ දේශපාලන නායකයන්ගේත් අන්‍ය ආගමික නායකයන්ගේත් රාජ්‍ය නිළධාරීන්ගේ හොඳහිත දිනාගෙන කටයුතු කිරීමට ජාන්ස පියතුමාට හැකිවිය.

ඉන්පසුව කුරුණෑගල පදවියේ බුළුපිටිය මීසම 1996 දී සැලේසියාන නිකායට භාරදුන් අතර එහිද කටයුතු ජාන්ස පියතුමාට භාර විය. ඒත්තුකාල දොන් බොස්කෝ ආයතනය, නොච්චියාගම බොස්කෝ ආයතනය, මහනුවර බහිරව කන්ද බොස්කෝ ආයතනයන්හි භාණ්ඩාගාරික ධුරය දැරීය. දැනට කුරුණෑගල පදවියේ මැටියගනේ බොස්කෝ ආයතනයේ නේවාසිකව සිටින ජාන්ස පියතුමා ලේඛන කලාවට උනන්දු අයෙකි. දොන් බොස්කෝ සැලේසියාන නිකායට සම්බන්ධ පොත්පත් රාශියක් ලියා ප්‍රකාශයට පත් කර ඇති ජාන්ස් පියතුමා ඉදිරියේදීද තවත් පොත් කීපයක් ලියා එළිදැක්වීමට සූදානම්ව සිටී.

ඔහු පිළිබඳව දොන් බොස්කෝ සැලේසියාන නිකායේ වත්මන් ප්‍රාදේශාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා දැරුවේ මෙවන් අදහසකි. "එම්මානුවෙල් ජාන්ස් පියතුමා හරිම නිර්භීතයි, කිවයුතු දේ ඕනෑම කෙනෙකුට කෙලින්ම කියනව. හිත හොඳයි, කිසිවෙකු සමග අමනාප නැහැ. දේව මෑණියන් ගැන පුදුම භක්තියක් තියෙන්නේ. මුළු ජීවිතයම දෙවියන් වහන්සේට ක්‍රියාවෙන් කැප කළ අයෙක්.

2012 අප්‍රේල් 17 වන දින දිවි ගමනේ 70 වන වසරට පා තබන ගරු එම්මානුවෙල් ජාන්ස් පියතුමාට සුභ උපන් දිනයක් නිරෝගී දිවියක් සඳහා දෙවි පියාණන්ගේ පිහිට ලැබේවායි දොන් බොස්කෝ සැලේසියාන නිකායේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා ඇතුළු සියලුම සහෝදර පූජකතුමන්ලා, සහෝදර තුමන්ලා පැවිදි සොහොයුරියන්, සැලේසියාන පවුලේ සැම දෙනාත් ශ්‍රී ලංකාව පුරා බොස්කෝ ආයතනවල කාර්ය මණ්ඩලවල සැම දෙනාගේත් පැතුමයි.

**(හෙන්රි මොරිස් නානායක්කාර)**

# සලාපුර පදවි පාස්කු මංගල්‍ය මෙහෙය



පාස්කු මංගල්‍යය හලාවත ආසන දෙව්මැඳුරේදී හලාවත පදවි රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවැත්වුණි. එහිදී එතුමා ගින්දර හා ජලය ආසිරි ගැන්වූ අයුරු එම අවස්ථාවට මීසම් සේවක ගරු රොන්කල්ලි ද සිල්වා පියතුමා සහභාගි විය. **(පර්සි ප්‍රනාන්දු)**

# අගනුවර කිතුනු කම්කරු නව නියමුවෝ දිවුරුම් දෙති

*ඉකුත්දා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ අගරදගුරු පදවි සංගමයේ නිලවරණය අගරදගුරු පදවි උපාධ්‍ය ගරු රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා ප්‍රමුඛ නිලවරණ කමිටුවේ අධීක්‍ෂණයෙන් පිටකොටුව සවන පාවුලු මධ්‍යස්ථානයේ දෙවන මහලේදී පැවතුනි. නිලවරණයෙන් පත්වුනු පහත සඳහන් නියමුවෝ ගරු පියතුමන් සමගින් ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ නිර්මාතෘ අති උතුම් කාඩයින් කාදිනල් හිමිපාණන්ගේ ඡායාරූපය ඉදිරියේ දිව්රුම් දුන්හ.*

සභාපති - ඩබ්ලිව්.ඒ.ජේ. ජෙරාඩ් ඩයස්, උප සභාපති - සිරි මාරගේ, ලේකම් - කෝමලතා ප්‍රනාන්දු, උප ලේකම් - දුලිප් මාලක, භාණ්ඩාගාරික - මයිකල් පීරිස්, උප භාණ්ඩාගාරික - අජිත් පෙරේරා, කාරක සභාව - එස්. ඥානප්‍රකාශම්, නිර්මලා ප්‍රනාන්දු, මොනිකා පීරිස්, ඇනි හයසින්ත්, ජෙසිමා නිලුක්ෂි, පිලමිනා දිසානායක, ෂෙල්ටන් ස්ටැන්ලි මහත්ම මහත්මීන්.

**(තියබෝල්ඩ් සමරතුංග)**

## 200 වන ජන්ම සංවත්සරයට පෙල ගැසේ

සාන්ත වින්සන්ද පාවුලු සමිතියේ නිර්මාතෘ භාග්‍යවත් පෙඩ්රික් ඔසානම් තුමාගේ 199 වන ජන්ම සංවත්සරය 2012 අප්‍රේල් 23 වන දිනට යෙදින. පිටකොටුව සවන පාවුලු මධ්‍යස්ථානයේ පැවති අප්‍රේල් මස ජාතික විධායක කමිටු රැස්වීමේදී එය අනුස්මරණය කරමින් කතා කළ ජාතික සභාපතිනි ලියෝනි ප්‍රනාන්දු මහත්මිය ලබන වර්ෂයට යෙදෙන භාග්‍යවත් පෙඩ්රික් ඔසානම් තුමාගේ 200 වන ජන්ම සංවත්සරය උත්සවශ්‍රීයෙන් පැවැත්වීමට පෙළ ගැසිය යුතු බව අවධාරණය කෙරින.

**(තියබෝල්ඩ් සමරතුංග)**

**නිවාස හා ඉඩම්**

**කඳාන නගරයට ආසන්න පර්. 80 වටිනා ඉඩමක් විකිණීමට**
**දු.ක. 071-4273841**
(N0256)

**ඔබ ලබාගන්නේ... 1 පිටුවෙන්**

කොළඹ අගරදගුරු පදවියට අයත් ගරු දුලිප් ප්‍රියශාන්ත, කසුන් ඉෂාර, ගිහාන් ශෙනෝ, දිනේෂ් අප්පුහාමි, දිනුෂ් ගයාන්, ඇන්ටන් සුදාරක, අසිත් ප්‍රනාන්දු යන සහෝදරතුමන්ලා සහ සිස්ටර්සියාන නිකායික ගරු සිල්වෙස්ටර් පෙරේරා සහෝදරතුමා මෙහිදී පිළිවෙලින් අගරදගුරු හිමිපාණන් අතින් පූජකවරම් ලබාගත් අතර අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු, අති උතුම් මැක්ස්වල් සිල්වා යන සහයක රදගුරුතුමන් දෙපළ සමඟ ජාතික දෙව්සත්හල් අදියුරු ගරු එල්මෝ ඩයස් පියතුමන් ද මෙම දිව්‍ය යාගය පුද කිරීමට හවුල් වී සිටියහ.

කොළඹ අගරදගුරු පදවිය පූජකතුමන් ඇතුළු මෙදින පූජකවරම් ලැබූ පියවරුන්ගේ දෙමාපිය, නෑදෑ හිතවතුන් හා මීසම් සැදැහැ ජනතාවගෙන් කොටහේන ආසන දෙව්මැඳුර පිරී තිබුණි.

**කිතු සමිඳාණන් ... 5 පිටුවෙන්**

ශතාධිපතියාගේ මහත් විශ්වාසය ස්වාමින් වහන්සේ කොපමණ අගය කළේ දැයි මෙයින් පැහැදිලි වේ. මෙහිදී ද විශ්වාසයේ පදනම මතම මෙම ප්‍රාතිහාර්යය සිදු කළ සේක.

★ එසේම, අවසන් වරට ඔවුන් වහන්සේ ජෙරිකෝවේ දී අන්ධයා සුව කළේ ද ජේසුස් වහන්ස, දාවිත්ගේ පුත්‍රය මට අනුකම්පා කළ මැනැවැ යි මොර ගැසූ අන්ධයාගේ විශ්වාසය පරික්ෂා කිරීමෙන් අනතුරුවය. ජේසුස් වහන්සේ ඔහුට පෙනීම ලබා දී "ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේ යයි" පැවසූ සේක.

මේ සියලුම ප්‍රාතිහාර්යයන්ගෙන් පැහැදිලි වන්නේ ඔවුන් වහන්සේ සිදුකළ සෑම ප්‍රාතිහාර්යයක්ම අදාළ රෝගියාගේ අචල විශ්වාසයත්, ශ්‍රද්ධාවත් මතම පිහිටා ඔවුන් සුවපත් කළ බවයි. එසේම, ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී ගෝලයින්ට දර්ශනය වූ පළමු අවස්ථාවේ දී තෝමස් අපෝස්තුළු තුමා සිටියේ නැත.

පසු දිනක තෝමස් ගෝලයා සිටින විට ස්වාමින් වහන්සේ දර්ශනය වී "තෝමස් නුඹේ ඇඟිලි මගේ අත්පා වල තුවාල වලට ඔබා බලන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්නැ"යි පැවසූ සේක. එවිට තෝමස් මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි කියා ඔවුන් වහන්සේගේ පාමුල ශෂ්ඨාංගයෙන් වැඳ වැටුනේය. එවිට ස්වාමින් වහන්සේ තෝමස්ට කතා කොට " තෝමස් මා දුටු නිසා ඔබ විශ්වාස කළෙහිය. එහෙත් නොදැක විශ්වාස කරන්නෝ භාග්‍යවන්තයෝ යැයි" පැවසූ සේක. විශ්වාසයේ අගය ඒ අනුව ජේසුස් වහන්සේ තම ගෝලයන්ට පවා එසේ පැහැදිලි කළ සේක.

ඒ අනුව, ස්වාමින් වහන්සේගෙන් යම් වරප්‍රසාදයක් අප ඉල්ලා සිටින විට ඊට අපගේ තිබිය යුතු මූලික සුදුසුකම්වලට අමතරව, අප ඉල්ලා සිටින දෙය දේව මහිමයටත්, අපගේ වැඩි යහපතටත් හේතුවන්නේ නම් ද, එම දෙය ඔවුන් වහන්සේ අපට දෙන බවට අප තුළ ඉතා ප්‍රබල හා ගැඹුරු විශ්වාසයක් තිබිය යුතු බව ඉහත ප්‍රාතිහාර්යය වලින් මෙන්ම ඔවුන් වහන්සේගේ උපදෙස් වලින් ද මනාව පැහැදිලි කර දී ඇත.

# අගරදගුරු පදවි පවුල් සේවාවෙන් ජීවිතයට අධ්‍යාත්මික අත්වැලක්

*මනුෂ්‍ය ජීවිතයේ ගැඹුරුතම සහ සැබෑ කැඳවීම අධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීම සඳහා සෑම මනුෂ්‍ය ප්‍රශ්නයක්ම අධ්‍යාත්මික ප්‍රශ්නයකි. එමෙන්ම සෑම ප්‍රශ්නයකටම විසඳුම් ගවේෂනය කිරීමට අධ්‍යාත්මික දැක්මක් අත්‍යවශ්‍යය. අප අධ්‍යාත්මිකව වර්ධනය නොවන විට අන්‍යයන්ට ආශිර්වාදයක් වීමෙන්ද වැළකෙයි. මෙම පාඨමාලාව එම අධ්‍යාත්මික චාරිකාවට ක්‍රියාශීලීව සහභාගි වීම මෙම පාඨමාලාවෙන් අපේක්ෂා කෙරේ. සිංහල මාධ්‍යයෙන් 2012 මැයි 20 සිට සැප්තැම්බර් 23 දා පැවැත්වෙන මෙහි දිනක් සඳහා රුපියල් 100 ක් අයකැරේ. ස්ථානය - නො. 24, 6 වන මහල, හයවන පාවුළු මධ්‍යස්ථානය, මල්වත්ත පාර, කොටුව, මෙහෙයවීම - ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමා, මහාචාර්ය ඇන්ටන් මීමන. වේලාව - සෑම ඉරුදිනකම ප.ව. 2.00 සිට 5.00 දක්වා. විමසීම් - ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමා දු.ක. 011-2236457, මහාචාර්ය ඇන්ටන් මීමන. දු.ක. 077-6406097.*

**විභාගය සඵල වූවාට ස්තුති කිරීමයි**

ශු. ජෝශප් කොපර්ටිනෝ මුනිඳුනි පිළිතුරු දන්නාවූ ප්‍රශ්න පමණක් විභාගයේදී ලැබීමේ වරප්‍රසාදය දෙවිඳුන්ගෙන් ඔබතුමාට ලැබුනා නොවේද? මාගේ මේ විභාගයේදී එවන් සාර්ථකත්වයක් මටද ලබා දුන මැනව. මේ වෙනුවෙන් ඔබ තුමාගේ නාමයට ගෞරවයත් ප්‍රසිද්ධියත් ලබා දෙන්නට මම පොරොන්දු වෙමි. ශු. ජෝශප් කොපර්ටිනෝ මුනිඳුනි අප නිසා යාච්ඤා කළ මැනව. ශු. සෙබස්තියන් මුනිඳුටත්, ශු. ජෝශප් මුනිඳුටත් ශු. අන්තෝනි මුනිඳුන්ටත් ස්තූති වේවා ! පිහිට ලැබූ දාසියක්. වත්තල. (N0241)

**11 වන වසර සැමරුම**



විශ්‍රාමලත් පාඨශාලාචාර්ය
**එච්.ජේකබ් පෙරේරා මහතා**

සදාතන සුවය පතා සමිඳුන් සොයා ගොස් 2012.04.28 දිනට වසර එකොළහක් සපිරේ. ඔබ වෙනුවෙන් නිතිදා දෙවිඳුන් යදින්නේ පවුලේ සියලු දෙනා.
*"ඇග්නස් විලා" වැලිවේරිය.*
(N0243)

**5 වන සැමරුම**



බණ්ඩිරිප්පුවේ විසූ
**කේ.ඒ.ඩී. එළිසබෙත් (බේබි නෝනා)**

ඇය දෙවි පියාණන්ගේ තුරුළට ගොස් 2012 මැයි 2 වන දිනට පුරා වසර 5 කි. ඇයව සැමදා සිහිකරමින් ඇයගේ ආත්මයට සදා මොක් සුව පතනුයේ ඇයගේ ආදර සැමියා, ජේ.ඇම්.ඩේවිඩ් අප්පුහාමි ඇතුළු දූ දරු පිරිසයි.
(N0242)